රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 අනුකූලව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත
ඉදිරිපත් කරනු ලබන

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය

වැය ශීර්ෂය - 123

දෙවන මහල, අදියර 01,
“ සෙත්සිරිපාය”,
බත්තරමුල්ල

පටුන

පරිච්ඡේදය	පිටුව
1. පරිච්ඡේදය 1: ආයතනික පැතිකඩ	**01-17**
1.1. හැඳින්වීම	01
1.2. අමාත්‍යාංශය පිහිටුවා ඇති නෛතික රාමුව	01
1.3. අමාත්‍යාංශයේ පරමාර්ථ	02
1.4. දැක්ම හා මෙහෙවර	02
1.5. අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් හා කාර්යයන්	02
1.6. අමාත්‍යාංශයේ සංවිධාන සටහන	10
1.7. විදේශාධාර ලබන ව්‍යාපෘති	11
1.8. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන	14
2. පරිච්ඡේදය 2: ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**18 - 41**
2.1. පාලන අංශය	18
2.2. ආයතන අංශය	18
2.3. සැලසුම් අංශය	20
2.4. ජාතික නිවාස වැඩසටහන	22
2.5. අවතැන්වූවන් නැවත පදිංචිකිරීමේ වැඩසටහන	23
2.6. රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව නිවාස ව්‍යාපෘති	23
2.7. ඉන්දියානු ආධාර මත ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති	24
2.8. ජල සම්පාදන අංශය	26
2.9. නිවාස අංශය	32
2.10.නිවාස කොමසාරිස් අංශය	35
2.11.මූල්‍ය අංශය	37
2.12.අභ්‍යන්තර විගණන අංශය	37
2.13.ඉදිකිරීම් අංශය	38
2.14.ඉංජිනේරු සේවා අංශය	39
2.15.ඉදිකිරීම් ප්‍රතිපත්ති අංශය	40
2.16.වාස්තු විද්‍යා අංශය	41
3. පරිච්ඡේදය 3: 2025 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	**42-47**
3.1. 2025 වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශය	42
3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කරගැනීමේ කාර්ය සාධනය	46
3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය	46
3.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	46
3.5. විගණකාධිපති වාර්තාව	47

4. පරිච්ඡේදය 4: කාර්යසාධන දර්ශක **48-48**
4.1. අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක 48

5. පරිච්ඡේදය 5: තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්ය සාධනය **49-51**
5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 49
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 50

6. පරිච්ඡේදය 6: මානව සම්පත් පැතිකඩ **52-52**
6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 52
6.2. කාර්ය මණ්ඩල හිඟය අමාත්‍යාංශයේ කාර්ය සාධනයට බලපාන අයුරු 52
6.3. මානව සම්පත් සංවර්ධනය 52

7. පරිච්ඡේදය 7: අනුකූලතා වාර්තාව **53-61**

පරිච්ඡේදය 1
ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව 2025 වසර තුළ අමාත්‍යාංශ 25ක් ක්‍රියාත්මක වේ. ඒ අනුව නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන, නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන විෂයන්ට අදාළ සියලු කටයුතු සහ එම විෂයන්ට අදාළ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සඳහා මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිළධාරිගේ මූල්‍ය බලතල යටතේ ක්‍රියාත්මක විය. මේ වන විට නාගරික සංවර්ධන විෂය පථය ඉවත්කර ඇති අතර නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය ලෙස වර්තමානයේ කටයුතු කරයි.

1.2. අමාත්‍යාංශය පිහිටුවා ඇති නෛතික රාමුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024.11.18 දිනැතිව ප්‍රකාශිත අංක 999/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ලෙස පිහිටුවන ලදී.

2025 ඔක්තෝබර් 11 වැනි දිනැති අංක 2457/36 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය ලෙස නව අමාත්‍යාංශයක් ස්ථාපිත කරන ලද අතර 2025 ඔක්තෝබර් 18 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 2458/65 අනුව අමාත්‍යාංශයේ විෂය පථය යටතේ දෙපාර්තමේන්තු 03ක් සහ ව්‍යවස්ථාපිත ආයතන 09ක් ඇතුළත්ව ආයතන 12ක් ලෙසට මෙම අමාත්‍යාංශය පිහිටුවා ඇත.

1.2.1. අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ වැඩසටහන්

දෙපාර්තමේන්තු

1. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
2. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
3. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

ව්‍යවස්ථාපිත ආයතන

1. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
2. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
3. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
4. සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
5. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ ක්‍රියාත්මක වේ)
6. ඕෂන් වීව් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
7. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව
8. ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල

වැඩසටහන

1. අවතැන් වුවන් නැවත පදිංචිකිරීමේ වැඩසටහන

1.3. අමාත්‍යාංශයේ පරමාර්ථ

රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන යන විෂයයන්ට අනුව අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත ආයතන වල විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය වේ.

1.4. දැක්ම හා මෙහෙවර

දැක්ම

"සුවපහසු ජීවිතයක්"

මෙහෙවර

නිවාස සහ යටිතල පහසුකම් ලබාදීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනය, ජලය හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවේශය තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවට සුවපහසු ජීවිත සඳහා ප්‍රවේශය සැලසීම.

1.5. අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් හා කාර්යයන්

නිවාස, ඉදිකිරීම් අංශය

* නිවාස හා ඉදිකිරීම් විෂයට අදාළ ප්‍රතිපත්ති, අණ පනත්, රෙගුලාසි, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
* අඩු ආදායම්ලාභීන්, මධ්‍ය ආදායම්ලාභීන් සහ විශේෂ ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම, නිවාස මූල්‍යාධාර හා ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
* නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් හඳුනාගැනීම, අත්පත්කර ගැනීම, පවරා ගැනීම, බැහැර කිරීම හා ඔප්පු නිකුත් කිරීම සම්බන්ධ කටයුතු.
* ඉදිකිරීම් කර්මාන්තය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම.
* අමාත්‍යාංශය යටතේ වන රජයේ දෙපාර්තමේන්තු, ඉදිකිරීම් සම්බන්ධ අධිකාරියන්හි කටයුතු නියාමනය හා මඟ පෙන්වීම.
* රජයේ සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා ස්ථාවර තාක්ෂණ කමිටුවල කාර්යයන් ඉටු කිරීම.
* අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් ආයතන සම්බන්ධීකරණය සහ ප්‍රගතිය නියාමනය කිරීම.
* අමාත්‍යාංශය යටතේ ඇති තාක්ෂණිකමය නොවන ආයතන සඳහා ඉදිකිරීම් කටයුතු වලදී තාක්ෂණික මඟපෙන්වීම් ලබාදීම.
* ඉදිකිරීම් ක්ෂේත්‍රයන් අදාළ විදේශීය වෘත්තිකයන් සඳහා වීසා නිර්දේශ කිරීම.
* අවතැන් වූ පවුල් සඳහා ග්‍රාමීය නිවාස ඉදිකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය මූලික යටිතල පහසුකම් ලබා දීම.
* බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

ජල සම්පාදන අංශය

* සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම.
* ජල සම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව නව සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව.
* ග්‍රාමීය වැව්, ජලාශ හා වාරිමාර්ග පද්ධතීන් සම්බන්ධීකරණය කරමින් ජල සුරක්ෂිතතාව සහ ජල යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම.
* පානීය ජලය බෙදාහැරීමේදී සිදුවන ජලය අපතේ යාම වළක්වා ගැනීම.
* ප්‍රජා ජල සම්පාදන හා ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටුකිරීම සඳහා පියවර ගැනීම.
* ග්‍රාමීය ජනතාවට ප්‍රමිතියෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම.
* ජලාශ සංවර්ධනය හරහා ග්‍රාමීය පළාත්වල පානීය ජල සැපයුම ස්ථාවර කිරීම.

1.5. 1. අමාත්‍යාංශය යටතේ ඇති අංශ සහ කාර්යයන්

1.5.1.1. පාලන අංශය

සාමාන්‍ය පරිපාලනයට අදාළ සියලුම කාර්යයන් හා මානව සම්පත් කළමනාකරණය ප්‍රධාන කර්තව්‍යය වන අතර ඒ සඳහා අවශ්‍ය වන පරිසරය සකස් කිරීම, භෞතික සම්පත් ඵලදායි කළමනාකරණය කිරීම.

ප්‍රධාන කාර්යයන්

* අමාත්‍යාංශයේ සියලු සාමාන්‍ය පරිපාලන කටයුතු සහ සියලුම නිලධාරින්ගේ ආයතනික හා පරිපාලන කටයුතු කිරීම
* අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරින්ගේ ආයතනික හා පරිපාලන කටයුතු සිදු කිරීම
* මානව සම්පත් සංවර්ධනයට අදාළ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරින් යොමු කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීම
* රැස්වීම් හා විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම
* පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය කිරීම
* ස්ථාවර වත්කම් කළමනාකරණය කිරීම
* විෂය පථයට අදාළ විගණන විමසුම් සඳහා ප්‍රතිචාර දැක්වීම
* තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සිදු කරනු ලබන කාර්යයන්
* වාහන නඩත්තුව

1.5.1.2. ආයතන අංශය

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වල සියලුම ආයතනික කටයුතු සහ මානව සම්පත් කළමනාකරණය සහ එම කටයුතු සඳහා සහාය වීම ආයතනික අංශය මඟින් සිදුකරනු ලබයි.

ආයතන අංශයේ කාර්යයන්

මෙම අංශය මඟින් අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වල පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලබයි.

* අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමට අදාළ කටයුතු
* පුරප්පාඩු සඳහා බඳවා ගැනීම්වලට අදාළ කටයුතු
* සේවා දීර්ඝ කිරීම්වලට අදාළ කටයුතු
* වැටුප් හා දීමනා සම්බන්ධ කටයුතු

* විනය හා අභියාචනා සම්බන්ධ කටයුතු
* මහජන ඉල්ලීම් සම්බන්ධ කටයුතු
* දේශීය/විදේශීය නිවාඩු අනුමත කිරීමට අදාළ කටයුතු
* අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික වාර්තා සම්බන්ධ කටයුතු
* අතිකාල, දිනවැටුප්, අමතර ඉන්ධන අනුමත කිරීමට අදාළ කටයුතු
* නිවාස හා ඉදිකිරීම් අංශයට අදාළ තැපෑල සම්බන්ධ කටයුතු
* ප්‍රායෝගික පුහුණු සඳහා අනුමැතිය ලබා දීමේ කටයුතු
* ආයතනවලට අදාළ විවිධ ගැටලු සම්බන්ධයෙන් සහ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කැඳවීමේ කටයුතු
* ආයතනවල වාහන ආනයන බලපත්‍ර අනුමත කිරීම් වලට අදාළ කටයුතු
* නිලධාරීන් වෙත දේශීය/විදේශීය පුහුණු සඳහා අනුමැතිය ලබාදීමට අදාළ කටයුතු

1.5.1.3. සැලසුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ සැලසුම් කළ පරිදි ප්‍රගතිය ළඟාකර ගැනීම සඳහා මෙහෙයවීම අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ. තවද, ‘‘පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්’’ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතන වලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරවා ගැනීමට සහායවීමත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් ඉලක්ක කරා මෙහෙයවීමේ කටයුතු, පසු විපරම් කිරීම හා ඇගයීම් සිදුකිරීමත් සැලසුම් අංශය මඟින් සිදුකෙරේ.

සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්

* අමාත්‍යාංශයේ දැක්ම හා අරමුණු වලට අනුගත වෙමින් අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු.
* අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වලින් ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශ ව්‍යාපෘති ඇගයීම් කමිටුව මඟින් ඇගයීමෙන් අනතුරුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය.
* සංවර්ධන වැඩසටහන් සම්බන්ධ තොරතුරු සම්පාදනය හා වාර්තාකරණය.
* ව්‍යාපෘති පසුවිපරම් කිරීම හා ඇගයීම.
* අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් වල ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය මාසිකව, කාර්තුමය වශයෙන් හා වාර්ෂිකව වාර්තා කිරීම හා ඇගයීම.
* අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතන වලට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම. පිළිබඳව පසුවිපරම් කිරීම.
* අමාත්‍යාංශ වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කර අයවැය කාරක සභා අවස්ථාව සඳහා නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කිරීම.
* වාර්ෂික කාර්යය සාධන වාර්තාව සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කිරීම.
* ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම, වාර්තා සකස් කිරීම හා පසුවිපරම් කිරීම.
* විදේශාධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම හා පසුවිපරම් කිරීම.

1.5.1.4. නිවාස අංශය

නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා නිවාස සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රය යටතේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු සැපයීම, රටේ ඉදිරි නිවාස අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සඳහා මඟපෙන්වීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

නිවාස අංශයේ ප්‍රධාන කාර්යයන්

- **ප්‍රතිපත්ති සම්පාදනය**

* රටේ ඉදිරි නිවාස අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු සැපයීම
* නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සකස් කිරීම
* නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ පනත් සංශෝධනය හා රෙගුලාසි සම්පාදනය සඳහා තොරතුරු සැපයීම
* නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රතිපත්ති අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී ක්‍රියාත්මක කරවීම - නිවාස පිළිබඳ මෙහෙයුම් කමිටුව

- **නිවාස සංවර්ධනය**

භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් පහත නිවාස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම හා පසු විපරම් කිරීම.

* අඩු ආදායම්ලාභී ජනතාව සඳහා දීප ව්‍යාප්තව "තමන්ගෙම තැනක් - ලස්සන ජීවිතයක්" නිවාස ආධාර වැඩසටහන
* සැමට සෙවණ - ආධාර අවිච්ඡේද (20215/2019) වැඩසටහන
* පැරණි නිවාස ක්‍රම නවීකරණය
* මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය

- **වෙනත් රාජකාරී**

* ලෝක ජනාවාස දිනයට සමගාමීව දිවයින පුරා නිවාස ඉදිකිරීම් හා සම්බන්ධව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ලෝක ජනාවාස දිනය සැමරීම
* එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN- Habitat) සමඟ සිදුකරන අනෙකුත් කටයුතු

1.5.1.5. නිවාස කොමසාරිස් අංශය

මෙම අංශය 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත , 1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිමය පිළිබඳ පනත යටතේ ලබා දී ඇති බලතල හා කාර්යයන් ඉටුකරයි. එමෙන්ම 1972 අංක 7 දරණ කුලී පනත යටතේ පැවරී ඇති යම් කාර්යයන් ද ඉටුකරයි.

ජාතික නිවාස කොමසාරිස් අංශයේ ප්‍රධාන කාර්යයන්

* කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබාදීම
* රජයට පවරාගත් නිවාස වල හිමිකරුවන් සඳහා වන්දි ලබාදීම
* පොදු පහසුකම් සඳහා වෙන්කොට ඇති කොටස් සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු නිරාකරණය කිරීම

1.5.1.6. මූල්‍ය අංශය

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාළ වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හා උපදේශනය ලබාදීමත්, එම සම්පත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය වන පද්ධති හා පාලන ක්‍රම පිළිබඳව උපදෙස් ලබාදීමත් මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්

* කාර්යක්ෂම හා ඵලදායී මූල්‍ය කළමනාකරණ පද්ධතියක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීම.
* අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ප්‍රසම්පාදන කමිටු පත්කිරීම.
* මූල්‍ය කළමනාකරණ, මූල්‍ය සැලසුම්, අයවැයකරණය, වත්කම් කළමනාකරණය හා මිලදී ගැනීම්, කළමනාකරණය සම්බන්ධයෙන් අමාත්‍යාංශයට සහ ඒ යටතේ ඇති ආයතන සඳහා උපදෙස් හා මඟපෙන්වීම ලබාදීම.
* මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම හා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගත හැකි ආකාරයට මූල්‍ය සම්පත් භාණ්ඩාගාරයෙන් ලබාගෙන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අතර බෙදා හැරීම.
* අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කිරීම පෙරදැරිකොට එම ආයතන සමඟ සාමූහිකව වාර්ෂික අයවැය වාර්තා පිළියෙල කිරීම හා වර්ෂය පුරා අයවැය පාලන කටයුතු කිරීම.
* වාර්ෂික විසර්ජන පනත මඟින් අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට වෙන් කරන මුදල් වියදම් කිරීමේදී නියමිත පරිදි වාර්තා කිරීම හා මාසිකව, වාර්ෂිකව මූල්‍ය වාර්තා අදාළ ආයතන වලට ඉදිරිපත් කිරීම.
* රජයේ විගණන අංශය හා අභ්‍යන්තර විගණන අංශය සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් එම අංශ මඟින් යෝජනා කරන අභ්‍යන්තර පාලන පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.
* අමාත්‍යාංශයේ සියලුම සුළු ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදුකිරීම.

1.5.1.7. අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධ ආයතනවල අපේක්ෂිත අරමුණු යතාර්ථයක් බවට පත් කරගැනීම පිණිස යහපත් මූල්‍ය පරිපාලනයක් සහ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය පරිපාලනය හා කළමනාකරණ කටයුතුවලට සහභාගි වී එම කටයුතු වඩාත් විධිමත් සහ කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුකිරීම පිණිස කළමනාකරණයට මඟ පෙන්වීමෙන් සහ අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකරනු ලබයි.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන්

* අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල විගණන කටයුතු සම්බන්ධීකරණය හා පසුවිපරම් කිරීම.
* විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මඟින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ගැටලු අවමකර ගැනීම සඳහා කටයුතු කිරීම.
* විගණන හා විමර්ශන කටයුතු තුළින් ආයතන වල ඇති ගැටලු අවමකර ගැනීමට සහාය වීම.
* පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම.

1.5.1.8. ඉදිකිරීම් අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC), ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම (OVDC) හා සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව (BMC) මඟින් සිදුකරනු ලබන ඉදිකිරීම් සම්බන්ධ කටයුතු අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම මෙම අංශයෙන් සිදුකරනු ලැබේ.

ඉදිකිරීම් අංශයේ කාර්යයන්

* අදාළ ආයතන වල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
* අදාළ ආයතනවල මූල්‍යමය ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
* ඉදිකිරීම් ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම හා උපදේශන සේවා සැපයීම.
(අනුරාධපුර මහවිලච්චිය පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සහ ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ක්‍රොන්ක්‍රීට් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම)
* නැවත පදිංචි කිරීමේ අංශයෙන් යොමු කරන ලද ඇස්තමේන්තු නිරීක්ෂණය කිරීම.
* අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
* නිපුණතාවයක් ඇති ශ්‍රී ලාංකිකයන්ට අගතියක් නොවන පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාවයක් සහිත විදේශීය පුද්ගලයින් සඳහා වීසා බලපත්‍රයක් ලබා ගැනීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම.

1.5.1.9. ඉංජිනේරු සේවා අංශය

සාමාන්‍ය ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ඍජුවම රාජ්‍ය ඉදිකිරීම් ආයතන වලට භාරදෙනු ලබන ගොඩනැගිලි හා ඉංජිනේරුමය කොන්ත්‍රාත්තු පිළිබඳ ඇස්තමේන්තු හා මිල ගණන් පරීක්ෂා කිරීමට හා අනුමත කිරීමට සහ ඒකාබද්ධ අරමුදල යටතේ භාරගන්නා කොන්ත්‍රාත්තු පිළිබඳ ආරවුල් වලට මැදිහත් වීමට මෙම අමාත්‍යාංශය යටතේ පත්කරන ලද ස්ථාවර තාක්ෂණ කමිටුවට අදාළ කටයුතු මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.

එමෙන්ම, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව යන ආයතන වලට අදාළ ව්‍යාපෘති කටයුතු, ප්‍රසම්පාදන කටයුතු ඇතුළු අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

ඉංජිනේරු සේවා අංශයේ කාර්යයන්

* රාජ්‍ය ආයතනවලට අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ප්‍රදානය කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතිවල ස්ථාවර තාක්ෂණ කමිටුවේ අනුමැතිය සඳහා යොමු කර ඇති ප්‍රමාණ පත්‍රිකා වල මිල ගණන් අවසරලත් සීමාවන් තුළ ඇත්දැයි පරීක්ෂා කර කමිටුවේ අනුමැතිය සඳහා නැවත සකස් කිරීම.
* ඉදිකිරීම් කොන්ත්‍රාත්වල මුලු පිරිවැය ඇස්තමේන්තු අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
* අමාත්‍යාංශ ලේකම්ගේ හා අමාත්‍යාංශ බල සීමාව තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල මිල විචලනයන් සඳහා අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
* තාක්ෂණික නොවන රාජ්‍ය ආයතන හා අමාත්‍යාංශවල ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබා දී සම්බන්ධීකරණය කිරීම.
* අවශ්‍ය අවස්ථා වලදී අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිර්දේශ ලබා දීම.
* අමාත්‍යාංශය යටතේ පවතින රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන ව්‍යාපෘතිවල තාක්ෂණික සහ අනෙකුත් ඉංජිනේරුමය කටයුතුවල අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය හා අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.

1.5.1.10. ඉදිකිරීම් ප්‍රතිපත්ති අංශය

අමාත්‍යාංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ සභාවේ කටයුතු සඳහා සහයෝගය, සම්බන්ධීකරණය හා තාක්ෂණික මඟපෙන්වීම මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.
එමෙන්ම, ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම, ගුණාත්මක හා පරිසර හිතකාමී ඉදිකිරීම් කර්මාන්තයක් බිහිකිරීමට මැදිහත්වීම මෙම අංශය මඟින් සිදුකෙරේ.

ඉදිකිරීම් ප්‍රතිපත්ති අංශයේ කාර්යයන්

* ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
* ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ පනත් කෙටුම්පත් සහ පනත් සම්බන්ධව කටයුතු කිරීම.
* තාක්ෂණ අංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්තය නියාමනය සහ ඉංජිනේරු සේවා සපයන ආයතන ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා මෙහෙයවීම.
* ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම බලකාය සූදානම් කිරීම සඳහා කටයුතු කිරීම.
* අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිර්දේශ ලබා ගැනීම.
* ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අනිකුත් තාක්ෂණික කටයුතු අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.
* ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ තාක්ෂණික කටයුතු අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.

1.5.1.11. වාස්තු විද්‍යා අංශය

අමාත්‍යාංශය වෙත සෘජුවම පැවරෙන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා මෙන්ම අමාත්‍යාංශය වෙතින් වෙනත් රජයේ ආයතන නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා සහාය ඉල්ලා සිටින අවස්ථාවන්හිදී ගුණාත්මක, විධිමත් වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම, ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධීකරණය හා ඒවායේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම මෙම අංශයෙන් සිදුකරනු ලැබේ.

වාස්තු විද්‍යා අංශයේ කාර්යයන්

* නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය වෙත පවරා ඇති සැලසුම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම මෙන්ම ගොඩනැගිලි පරිසරයට (Built Environment) අදාළ සැලසුම් සහ උපදේශන සේවා සැපයීම.
* වාස්තු විද්‍යා සැලසුම් සහ ව්‍යාපෘති කළමනාකරණයට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම සහ අමාත්‍යාංශය යටතේ ඇති අදාළ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
* නිවාස හා ඉදිකිරීම් ක්ෂෙත්‍රයට අදාළ මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අවශ්‍ය වාස්තු විද්‍යා උපදේශක දායකත්වය ලබාදීම.
* රජයේ ගොඩනැගිලි රෙගුලාසි, ආරක්ෂිත ප්‍රමිතීන්ට අනුව නියමිත ඉලක්ක සහ අපේක්ෂිත ගුණාත්මක ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා සැලසුම් සකස් කිරීම හා වාස්තු විද්‍යා අංශයේ වැඩ කටයුතු අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම.

1.5.1.12. අවතැන්වූ පවුල් නැවත පදිංචිකිරීමේ වැඩසටහන

අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීමට අදාළව 2009 සිට 2025 දෙසැම්බර් 31 කාලය තුළ උතුරු පළාතේ පවුල් 185,775කට අයත් පුද්ගලයන් 580,913ක්ද, නැගෙනහිර පළාතේ පවුල් 91,392කට අයත් පුද්ගලයන් 338,537ක්ද වශයෙන් මුළු පවුල් 277,167කට අයත් පුද්ගලයන් 919,450ක් නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකිරීමට හැකිවී ඇත.

ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් හානියට පත් නිවාස වෙනුවට නව නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය හා නැවත පදිංචි කල ප්‍රදේශ වලට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතීන්ද උතුරු හා නැගෙනහිර පළාත් වල බිම්බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය ද දැනට මෙම අමාත්‍යාංශයේ නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරේ.


- **අවතැන්වූ පවුල් සඳහා ගඩොල් සහ බදාම ආකාරයේ ස්ථීර නිවාස ලබාදීමේ වැඩසටහන**

මෙම නිවාස ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් විසින්ම ඉදිකරනු ලබන පදනම (Owner Driven) මත ක්‍රියාත්මක වේ. ඒ අනුව 2025 වර්ෂයේදී උතුරු හා නැගෙනහිර පළාත් වල දිස්ත්‍රික්ක 08හි නව නිවාස 1,827ක් ඉදිකිරීම් ආරම්භ කළ අතර එයින් නිවාස 1,713ක ඉදිකිරීම් අවසන් කර ඇත. තවද පසුගිය වර්ෂ වලදී අවිච්ඡේද වූ නිවාස 328ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. මේ අනුව නිවාස 2,041ක ඉදිකිරීම් මෙම වසර තුළ අවසන් කර ඇත.

- **නැවත පදිංචිකිරීමේ කටයුතු කඩිනම් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති**

2025 වසරේ මෙම ව්‍යාපෘතිය යටතේ පවුල් 5,389කට පානීය ජල පහසුකම් ලබාදුන් අතර පවුල් 2,669කට ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබාදෙන ලදී. දිස්ත්‍රික්ක 08හි නැවත පදිංචි කල ප්‍රදේශයන්හි අභ්‍යන්තර මාර්ග 179ක ඉදිකිරීම් අවසන් කර ඇත.

1.6. අමාත්‍යාංශයේ සංවිධාන සටහන



1.7. විදේශාධාර ලබන ව්‍යාපෘති

1.7.1. නිවාස හා ඉදිකිරීම් අංශය

අ/අ	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘති කාල සීමාව	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මි.)
01	පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතිය	ඉන්දියානු ආධාර සහ ශ්‍රී ලංකා භාණ්ඩාගාර අරමුදල්	අවුරුදු 08	450.50
02	මන්නාරම මඩු දේවස්ථාන ව්‍යාපෘතිය	ඉන්දියානු ආධාර සහ ශ්‍රී ලංකා භාණ්ඩාගාර අරමුදල්	අවුරුදු 08	416.88
03	ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය - දීප ව්‍යාප්ත	ඉන්දියානු ආධාර සහ ශ්‍රී ලංකා භාණ්ඩාගාර අරමුදල්	අවුරුදු 08	ඉන්දියානු ආධාර - 300.00 ශ්‍රී ලංකා භාණ්ඩාගාර - 60.00
04	ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය - 2017 දකුණු පළාත - I	ඉන්දියානු ආධාර සහ ශ්‍රී ලංකා භාණ්ඩාගාර අරමුදල්	අවුරුදු 08	ඉන්දියානු ආධාර - 300.00 ශ්‍රී ලංකා භාණ්ඩාගාර - 60.00
05	ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය - උතුරු පළාත	ඉන්දියානු ආධාර සහ ශ්‍රී ලංකා භාණ්ඩාගාර අරමුදල්	අවුරුදු 08	ඉන්දියානු ආධාර - 300.00 ශ්‍රී ලංකා භාණ්ඩාගාර - 60.00
06	ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය - 2019 දකුණු පළාත - II	ඉන්දියානු ආධාර සහ ශ්‍රී ලංකා භාණ්ඩාගාර අරමුදල්	අවුරුදු 08	ඉන්දියානු ආධාර - 300.00 ශ්‍රී ලංකා භාණ්ඩාගාර - 60.00

1.7.2. ජලසම්පාදන අංශය

අ/අ	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘති කාල සීමාව	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මි.)
01	මහකොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන -II	ආසියානු සංවර්ධන බැංකුව	2014 සැප්තැම්බර් සිට 2026 ජුනි දක්වා	14,124.00
02	මහකොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන -III	ආසියානු සංවර්ධන බැංකුව	2016 නොවැම්බර් සිට 2026 ජුනි දක්වා	7,222.00
03	අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා ආයෝජන වැඩසටහන	AFD - France	2016 ජුනි සිට 2026 ජුනි දක්වා	13,000.00

අ/අ	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘති කාල සීමාව	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මි.)
04	යාපනය, කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	2011 අගෝස්තු සිට 2029 දෙසැම්බර් දක්වා	35,881.49
05	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - I වන අදියර	ජපන් සහයෝගිතා ජාත්‍යන්තර ආයතනය	2014 ජූලි සිට 2025 ජූලි දක්වා	11,515.00
06	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - II වන අදියර	ජපන් සහයෝගිතා ජාත්‍යන්තර ආයතනය	2018 මැයි සිට 2031 ජුනි දක්වා	31,598.00
07	කළු ගඟ ජල සම්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය-1	ජපන් සහයෝගිතා ජාත්‍යන්තර ආයතනය	2020 දෙසැම්බර් සිට 2029 දෙසැම්බර් දක්වා	73,307.00
08	රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - I වන අදියර රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - II වන අදියර	EDCF කොරියා බැංකුව	2019 දෙසැම්බර් සිට 2026 මාර්තු දක්වා 2024 ජූලි සිට 2028 සැප්තැම්බර් දක්වා	6,291.00 (USD 25.546 Mn + Rs. 2,147 Mn.)
09	මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	චීන සංවර්ධන බැංකුව	2019 අගෝස්තු සිට 2027 ජූලි දක්වා	57,980.00
10	පාලි ආරු ජල සම්පාදන ව්‍යාපෘතිය (විසල් යාපනය)	GOSL	2024 ජනවාරි සිට 2031 සැප්තැම්බර් දක්වා	116,665.05
11	ගිරිබාව, එප්පාවල,රාජාංගනය සහ නොච්චියාගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1		2025 නොවැම්බර් සිට 2029 දෙසැම්බර් දක්වා	32,211.13
12	මහනුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය	ජපන් සහයෝගිතා ජාත්‍යන්තර ආයතනය(JICA)	2010 ජූලි සිට 2027 අගෝස්තු දක්වා	22,588.00
13	රත්මලාන/මොරටුව ප්‍රදේශ වල නල මඟින් මලාපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	AFD /GoSL	2016 ජූලි සිට 2026 දෙසැම්බර් දක්වා	5,548.00
14	ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	චීන සංවර්ධන බැංකුව/ ලංකා බැංකුව	2017 පෙබරවාරි සිට 2026 සැප්තැම්බර් දක්වා	33,060.00
15	අලුත්ගම, මතුගම, අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ආනයන අපනයන බැංකුව - ඉන්දියාව/ලංකා බැංකුව	2017 මැයි සිට 2026 ජුනි දක්වා	32,272.73

අ/අ	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘති කාල සීමාව	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මි.)
16	තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය	චීන සංවර්ධන බැංකුව/ලංකා බැංකුව	2018 ජූලි සිට 2026 සැප්තැම්බර් දක්වා	15,840.67
17	පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ආනයන අපනයන බැංකුව - ඉන්දියාව/ ලංකා බැංකුව	2017 ජූලි සිට 2026 ජුනි දක්වා	20,207.80
18	කොළඹ නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - 1	දේශීය බැංකු ණය - ලංකා බැංකුව	අවසන් කර ඇත (10.02.2020)	5,170.00
19	කොළඹ නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - 2	දේශීය බැංකු ණය - ලංකා බැංකුව	2025 ජනවාරි	4,823.00
20	කොළඹ නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය -3	දේශීය බැංකු ණය - ලංකා බැංකුව	අවසන් කර ඇත (28.07.2020)	8,043.25
21	විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය	දේශීය බැංකු ණය - ජාතික සංවර්ධන බැංකුව/ ජාතික සංවර්ධන බැංකුව (NDB)	මුල් කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. 1 පැකේජය ඉදිකිරීම් ආරම්භ කර ඇත. ජනවාරි 2026	3,580.00
22	ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය	දේශීය බැංකු ණය - හැටන් නැෂනල් බැංකුව	2016 ජූලි සිට 2025 දෙසැම්බර් දක්වා	4,496.00
23	මාතර අදියර IV	NDB/ GOSL	2017 ඔක්තෝම්බර් සිට (Original Contract mutually terminated in January 2023)	18,208.00
24	ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	ලෝක බැංකුව	2015 දෙසැම්බර් සිට 2026 මාර්තු දක්වා	52,345.00

1.8. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන

- **ජාතික නිවාස සංවර්ධන අධිකාරිය**

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මඟින් ස්ථාපිත කරන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය "ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුවපහසු - සෞඛ්‍යාරක්ෂිත නිවසක්" ලබාදීම සඳහා කටයුතු කරයි. එහිදී මහල් නිවාස, නිවාස හෝ වෙනත් වාසස්ථාන/ ගොඩනැගිලි ඉදිකිරීම, නිවාස හිඟය අවම කිරීමට නිවාස සංවර්ධන යෝජනා සැකසීම, මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම වැනි මූලික කාර්යයන්ට අමතරව නිවාස සංවර්ධනයට අදාළ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශ 07ක්, සහකාර සාමාන්‍යාධිකාරි කොට්ඨාශ 01ක් හා ප්‍රධාන අභ්‍යන්තර විගණක කොට්ඨාශයකින්, සහ සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් කාර්යාල 25ක්, නගර කාර්යාල 03ක් සහ කලාප සහ උප කාර්යාල 08කින් එහි මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි.

- **ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජල සම්පාදන විෂය පථය යටතේ වන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතනයයි. 1974 අංක 02 දරන පනත මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ස්ථාපිත කර ඇත.

නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවලට සුරක්ෂිත පානීය ජලය ලබා දීම හා නල මලාපවහන පහසුකම් ලබා දීම සඳහා ඇති ප්‍රධාන ආයතනය වනුයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයයි. මේ වන විට දිවයින පුරා සියලුම පළාත් ආවරණය වන ලෙස ක්‍රියාත්මක වන මහා පරිමාණ හා කුඩා පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රම මඟින් 2025 වසර අවසන් වන විට, ජනගණයෙන් 51.2% කට ගෘහස්ථ නල ජල පහසුකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ලබා දී ඇත. එම ගෘහස්ථ නල ජල සම්බන්ධතා සංඛ්‍යාව මිලියන 2.97ක් පමණ වේ. ඉන් 2025 වසර තුළ දී පමණක් ගෘහස්ථ නල ජල සම්බන්ධතා 92,837ක් ලබා දී ඇත. මීට අමතරව වාණිජ කර්මාන්ත හා ආයතනික මට්ටමේ ආයතන සඳහා 274,631ක සබඳතා සංඛ්‍යාවක් ලබා දී ඇති අතර 2025 වසර තුළ 16,622ක් ලබා දී ඇත.

- **ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

2014/09/22 ගැසට් නිවේදනය මඟින් 2014/09/19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාව ද ඇතුළුව පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ අරමුණු ඇතිව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ සේවා ආවරණය නොලැබූ ප්‍රදේශ කෙරෙහි මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලැබේ.

තිරසාර ප්‍රජා ජල ව්‍යාපෘති මඟින් සුරක්ෂිත පානීය ජලය ලබා දීම සඳහා ප්‍රජා ජල යෝජනා ක්‍රම සංවර්ධනය, දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධනය යන කටයුතු අදාළ සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

ග්‍රාමීය ජල සම්පාදනයට අදාළ සියලුම රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතනවල සහය ඇතිව ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අමාත්‍යවරයාට සහය වීම සහ ඒවා යාවත්කාලීන කිරීම, සාධාරණ ජල ගාස්තුවක් පැනවීමේදී ප්‍රජා මූලික ජල සම්පාදන සංවිධාන විසින් අනුගමනය කළ යුතු නිර්ණායකයක් සැකසීම සහ එය පවත්වාගෙන යාම, ප්‍රජා මූල සංවිධාන විසින් සපයනු ලබන සේවාවන් ඵලදායී හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙනයාම සඳහා ව්‍යවස්ථා, චක්‍රලේඛ සහ ගිවිසුම් සම්පාදනය කිරීම වැනි කටයුතු සිදුකරනු ලබයි.

- **ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

1957 රාජ්‍ය කර්මාන්ත සහ සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය (ICTAD-Institute for Construction Training and Development) 1986 වසරේ සිට දශක කිහිපයක කාලය තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රය නංවාලීමට විශාල වශයෙන් දායක විය. ඉන් අනතුරුව ඉදිකිරීම් කර්මාන්තයේ නියාමන ආයතනය හා ICTAD හි නෛතික ආයතනය ලෙස 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) බවට පරිවර්තනය විය. ඉදිකිරීම් කර්මාන්තය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම, කොන්ත්‍රාත්කරුවන් ඇතුළුව පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම, ඉදිකිරීම් කර්මාන්තය සඳහා සම්මත ලංසු ලේඛන හා පිරිවිතර සකස් කිරීම, ඉදිකිරීම් කර්මාන්තයේ ශිල්පීන් පුහුණු කිරීම හා ලියාපදිංචි කිරීම, ඉදිකිරීම් කර්මාන්තයේ ආරවුල් සහ ගැටලු විසඳීම සඳහා මැදිහත්වීම සහ අවශ්‍ය පහසුකම් සැපයීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යයන් වේ.

- **රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තුවක් වශයෙන් 1849 වර්ෂයේ කොළඹ ගෑස් වීදියේ ආරම්භ කරන ලද රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පසුකාලීනව එනම් 1928 වර්ෂයේ සිට කොලොන්නාව දෙමටගොඩ මාර්ගයේ බණිජ තෙල් සංකීර්ණය අසල පිහිටුවා ඇත.

ආරම්භක කාල සීමාවේදී මහා මාර්ග, පාලම්, වාරිමාර්ග, ගොඩනැගිලි ඉදිකිරීම් යනාදී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වී ඇති අතර විදේශීය ඉංජිනේරුවන් විසින් මෙම ආයතනය මෙහෙයවා ඇත.

1969 දක්වා මෙලෙස ක්‍රියාත්මක වූ රජයේ වැඩ දෙපාර්තමේන්තුව එමඟින් ඉටු කළ මහාමාර්ග තැනීම සහ නඩත්තුව මෙන්ම ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තුව යනාදී සිවිල් ඉංජිනේරුමය කාර්යයන් සඳහා මහාමාර්ග දෙපාර්තමේන්තුව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ද, යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ද, 1971.01.10 දින ස්ථාපනය කර ඇත.

ශ්‍රී ලංකාවේ කාර්මික සහ ආර්ථික වර්ධනයට දායක වෙමින් නවෝත්පාදන, නිපුණතා සංවර්ධනය සහ පාරිභෝගික ප්‍රමුඛතාවය තුළින් උසස් තත්ත්වයේ යාන්ත්‍රික ඉංජිනේරුමය සහ නිෂ්පාදන විසඳුම් ලබාදීම ප්‍රධාන මෙහෙවර වේ.

- **ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969දී ස්ථාපිත කරන ලද අතර දශක 5ක පමණ කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය ඇති උපදේශක ආයතනය වෙයි. තාක්ෂණික වගකීම, ගුණාත්මකභාවය, පිරිමැසුම්දායක බව, අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව සාක්ෂාත් කරමින් තම සේවා දායකයන් පූර්ණ තෘප්තියට පත්කිරීම උදෙසා විවිධ වෘත්තීන්හි නිපුණතා, එසේම තත් කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණද, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩිදියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවක් සැපයීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි.

- **රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව**

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1962දී පිහිටුවන ලද අතර, CIDA හි CS1 වර්ගීකරණය සහිත රාජ්‍ය අංශයේ ඉංජිනේරු සංවිධානයක් වේ. මෙම ආයතනය විසින් පුද්ගලික අංශයේ කොන්ත්‍රාත්තු මෙන්ම රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී වැනි රජයේ කොන්ත්‍රාත්තු ද සිදුකරනු ලබයි.

මෙම ආයතනය ISO 9001:2008 සහතිකය ගොඩනැගිලි ඉදිකිරීම් සිවිල් ඉංජිනේරුමය හා වාස්තු විද්‍යාත්මක කටයුතු, උපදේශන සේවා සැපයීම, යාන්ත්‍රික හා විදුලි ඉංජිනේරු සේවා සැපයීම හා මාර්ග හා පාලම් ඉදිකිරීම වැනි කාර්යයන් ඉටුකරනු ලබයි.

- **සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව**

ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව 1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනතේ 2වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ ගරු නිවාස හා ඉදිකිරීම් හිටපු ඇමතිවරයා විසින් 1971.06.17 වෙනි දින අංක 14962/43 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ ආඥාවකින් එම පනතේ 2වන වගන්තියෙහි 2වන උප වගන්තිය යටතේ පිහිටුවා ඇති අතර 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1992.09.16 දින සමාගම් අංක N (PBS/CGB) 155 යටතේ ලියාපදිංචි කර ඇත.

1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ලෙස 2007 අංක 7 දරණ සමාගම් පනතේ අංක PB 1536 අනුව 2010.03.03 දින සමාගමක් බවට පත් වූ අතර 2007 අංක 7 දරණ සමාගම් පනතේම අංක 8(3) (b) යටතේ 2012.01.24 දින සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ලෙසට පරිවර්තනය වී ඇත.

සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව මේ වන විට රාජ්‍ය හා පුද්ගලික අංශ සහ පෞද්ගලික නිවාස ඉදිකරන්නන් සඳහා අවශ්‍ය සියලුම ආකාරයේ ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ මෙවලන් සහ අනෙකුත් උපාංග සැපයීමට කටයුතු සිදුකරනු ලබයි.

ප්‍රධාන කාර්යාලය සහ කොළඹ 12 පිහිටා ඇති ප්‍රධාන අලෙවි ශාඛාව ඇතුලු දිවයින පුරා පිහිටි ශාඛා කාර්යාල 16කින් ආයතනය සමන්විත වේ. ප්‍රධාන කාර්යාලයේ අංශ 17ක සේවකයින් 83දෙනෙකු සේවයේ නියුක්ත වන අතර අලෙවි ශාඛා 16හි සේවකයින් 109දෙනෙක් වශයෙන් සමස්ත 192ක සේවක පිරිසක් මේ වන විට සේවා නියුක්තව කටයුතු කරයි.

- **ඕෂන් වීව් සංවර්ධන (පුද්ගලික) සමාගම**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ හා නාගරික සංවර්ධන අධිකාරියේ කොටස් හිමිකාරිත්වයෙන්, 1982 අංක 17 දරණ සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පුද්ගලික සමාගමක් ලෙස 1994 ජූලි මස 13 වන දින ලියාපදිංචි කර ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම පිහිටුවා ඇති අතර එය පසුව 2007 අංක 07 සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ 2010 ජනවාරි මස 25 වන දින නැවත ලියාපදිංචි කිරීම සිදුකර ඇත. දේපළ සංවර්ධනය කිරීම හා විකිණීම, 'ඕෂන් ටවර්' ගොඩනැගිල්ල කළමනාකරණය කිරීම සහ එහි නිවාස ඒකක කුලී පදනම මත ලබාදීම, ප්‍රාග්ධන කොටස්කරුවන් වෙත ලාභාංශ ලබාදීම මෙම ආයතනයේ කාර්යයන් වේ.

- **ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව**

2017 අංක 04 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනත යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL) ස්ථාපනය කර ඇත. මෙම පනත මඟින්,

* ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්ත්වය හා චර්යාව පවත්වාගෙන යාම සහ මෙහෙයවීමේ වගකීමටද,
* ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමටද,
* ඒ හා සම්බන්ධ කාරණා හෝ ඊට ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමටද ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලබයි.

ජාත්‍යන්තරව පිළිගත්, දේශීය වශයෙන් අදාළ ප්‍රමිති, නිපුණතාවය සහ රටේ සංවර්ධනය උදෙසා වෘත්තීමය කැපවීම පවත්වාගෙන යාම හා නීත්‍යානුකූලව පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන් විවිධ කාණ්ඩවල ලියාපදිංචි කිරීම මෙම ආයතනය මඟින් සිදුකරයි.

- **ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල**

1988 අමාත්‍ය මණ්ඩල සංදේශය 116 මඟින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උන්නතියට අවහිර වන පහත සඳහන් ප්‍රධාන කරුණු 04 හඳුනාගන්නා ලදී.

1. දුර්වල කොන්ත්‍රාත් කළමනාකරණය
2. නිරන්තර වැඩ නොලැබීම
3. සේවායෝජක ගෙවීම් ප්‍රමාදවීම
4. ඉදිකිරීම් කටයුතු වලදී අවශ්‍ය මූල්‍ය පහසුකම් නොලැබීම

ඉහත 4වන කරුණ පිළිබඳ ගැඹුරු අධ්‍යනයක් කරන ලදී. එහිදි කොන්ත්‍රාත්වරයා මෙතෙක් ඇපකර ලබාගත් වාණිජ බැංකු අවධානම අවම කිරීම සඳහා 100% සිට 200% දක්වා සුරක්ෂණයක් ඉල්ලා සිටින හෙයින්, ලංකාවට උචිත හා ආවේණික ක්‍රමවේදයක් සැලසීම සඳහා රජය මඟින් 1999 වසර ජාතික අයවැය තුළින් පාර්ලිමේන්තුව ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල නමින් ආයතනයක් පිහිටුවීමට රු.මි. 100ක් වෙන්කර, වගකීම මහා භාණ්ඩාගාර ලේකම් වෙත පවරන ලදී. ඒ අනුව භාණ්ඩාගාර ලේකම් අරමුදලක් ලෙස ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල පිහිටුවා එහි කළමනාකරණය සඳහා පූර්ණ බලතල රජයේ සහ පෞද්ගලික අංශය සමන්විත භාරකාර මණ්ඩලයක් වෙත පවරන ලදී. යෝජිත රු.මි.100න් 2005 වසර වනවිට රු.මි.55ක් පමණක් ලැබුණු අතර, ඉන්පසුව ඒකාබද්ධ අරමුදලින් හෝ වෙනයම් අරමුදල් මඟින් කිසිදු අරමුදලක් හෝ ප්‍රදානයක් නොලැබුණි. එතැන්සිට මෙතෙක් ඒ ලැබුණු සමස්ත ආදායම තුළින් පමණක් පවත්වාගෙනයාම සහ ඇපකර මුදල් කිරීමට භාවිතා කරනු ලබයි.

පරිච්ඡේදය 2
2025 ප්‍රගතිය සහ 2026 ඉදිරි දැක්ම (කාර්යය ශ්‍රිත අනුව)

2.1. පාලන අංශය

2.1.1 පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය

මෙම අමාත්‍යාංශයට අදාළ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ රාජකාරි, එනම් වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම, සේවය ස්ථීර කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම්, වැඩ බැලීම සඳහා පත්කිරීම හා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීම යන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකර ඇත.

2.2. ආයතන අංශය

2.2.1. අමාත්‍ය මණ්ඩල සංදේශ

2025 වර්ෂයේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ පාලන අංශය විසින් අමාත්‍ය මණ්ඩල තීරණ 37ක් නිවාස හා ඉදිකිරීම් අංශය වෙත යොමුකර ඇත. එමෙන්ම මෙම අංශය වෙත යොමු වූ පාර්ලිමේන්තු ප්‍රශ්න 02ක් සඳහා පිළිතුරු යොමු කිරීමට අදාළ කටයුතු සිදුකර නියමිත පරිදි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

2.2.2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම - 2025

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වල කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා 2025 වර්ෂය තුළ ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ප්‍රගතිය පහත පරිදි වේ.

දෙපාර්තමේන්තුව / ආයතනය	2025 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කළ කාර්යසාධන වාර්තා	2025 වර්ෂය තුළ සූදානම් කෙරෙන කාර්යසාධන වාර්තා වල තත්ත්වය
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව	2023	2023 කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තු සභාගත කිරීම සඳහා යැවීමට මුද්‍රිත පිටපත් 13ක් හා සංයුක්ත තැටි 02ක් පාර්ලිමේන්තුව වෙත යවා ඇත.
	2024	පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යොමුකර ඇත.
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	2024	පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යැවීමට සූදානම් කර ඇත.
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	2023	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා වාර්ෂික වාර්තා මුද්‍රිත පිටපත් 03ක් , CD තැටි 02ක්, සාරාංශ වාර්තාව සාමාන්‍ය පරිපාලන අංශය වෙත 2025.03.05 දින යොමු කර ඇත.

දෙපාර්තමේන්තුව / ආයතනය	2025 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කළ කාර්යසාධන වාර්තා	2025 වර්ෂය තුළ සූදානම් කෙරෙන කාර්යසාධන වාර්තා වල තත්ත්වය
ඕෂන්වීව් ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්	2023	පාර්ලිමේන්තු සභාගත කිරීම සඳහා යොමු කර ඇත.
	2024	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කරන ලෙස ආයතනයට දන්වා ඇත.
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	2019	අමාත්‍ය මණ්ඩල සංදේශය 2025.02.18 දින අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත සාමාන්‍ය පරිපාලන අංශයෙන් යොමු කර ඇත.
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව	2023	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත.

2.2.3. පුහුණු වැඩසටහන් පැවැත්වීම

නිවාස හා ඉදිකිරීම් අංශයෙන් දේශීය පුහුණු සඳහා 01 අයෙක්ද, විදේශීය පුහුණු සඳහා 04ක් ද යොමු කර ඇත.

අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විදේශ පුහුණු 13ක් සඳහා යොමුකර ඇත.

2.2.4. මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

2025 වර්ෂයට අදාළව ජනාධිපති කාර්යාලයෙන් හා අගමැති කාර්යාලයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිවාස හා ඉදිකිරීම් අංශය වෙත මහජන පැමිණිලි 77ක් ලැබී ඇත. ඒ අතරින් සේවකයින්ගේ ආයතනික ගැටලු, වෘත්තීය ගැටලු හා ආයතනික පරිපාලන ගැටලු සම්බන්ධ ලිපි 66ක් ලැබී ඇති අතර එම ලිපි සෘජුවම අදාළ ආයතන විෂයභාර නිලධාරීන් වෙත යොමු කර ලැබෙන පිළිතුරු අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කර ඇත. එමෙන්ම නිවාස ක්ෂේත්‍රය සම්බන්ධව මහජන ඉල්ලීම් 11ක් ලැබී ඇති අතර එම ලිපි ඉදිරි කටයුතු සඳහා නිවාස අංශය වෙත යොමු කර ඇත.

2.2.5. තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම

2025.10.08 දිනට තොරතුරු ඉල්ලීම් 35ක් යොමු කර ඇත. ඒ අනුව මෙම අංශයෙන් සෘජුවම තොරතුරු 16ක් ලබා දී ඇත. වෙනත් ආයතනවලින් තොරතුරු ලබා ගැනීමට යොමු කර ඇති ගණන 16කි. අමාත්‍යාංශයට තොරතුරු ලබා දෙන ලද ගණන 03කි.

2.2.6. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මානව සම්පත් කළමනාකරණය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල 2025 වර්ෂය තුළ මානව සම්පත් යෙදවුම් සම්බන්ධයෙන් වැදගත් සංඛ්‍යා දත්ත කීපයක් පහත දැක්වේ.

ආයතනය	අධ්‍යක්ෂ මණ්ඩලය		කාර්ය මණ්ඩලය		
	අනුමත සංඛ්‍යාව	මාස 3කට වඩා පුරප්පාඩුව පැවති සාමාජික සංඛ්‍යාව	අනුමත තනතුරු සංඛ්‍යාව	මාස 3කට වඩා පුරප්පාඩුව පැවති සාමාජික සංඛ්‍යාව	
				මාණ්ඩලික	මාණ්ඩලික නොවන
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව	අදාළ නැත.		638	153	
සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව	07	02	-	-	-
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	07	-	1570	118	561
ඕෂන්වීව් ඩිවලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්	10	01	55	03	05
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	අදාළ නැත.		768	17	264
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	14	-	390	55	93
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	7	01	2344	327	1519

2.2.7. 2026 ඉදිරි දැක්ම

මෙම අංශයේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු වී ඇත.

2.3. සැලසුම් අංශය

2.3.1. වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 අනුව 2025 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ඉදිරිපත් කළ අතුරු සම්මත ගිණුමට අනුව පිළියෙල කරන ලද නිවාස හා ඉදිකිරීම් අංශයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, 2025 ජනවාරි 06 වන දින අනුමත කිරීමෙන් පසුව එහි පිටපත් ජාතික විගණන කාර්යාලය ඇතුලු අදාළ සියලුම පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර ඇත. එමෙන්ම 2025 මාර්තු මස ඉදිරිපත් කරන ලද අයවැය සම්මත කිරීමෙන් පසු වර්ෂයේ ඉදිරි කාර්තු 03 සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2025 මැයි මාසයේදී ජාතික විගණන කාර්යාලය ඇතුළු අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. තවද, අනුමත කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන ලදී.

2.3.2. ප්‍රගති සමාලෝචන රැස්වීම්

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති නිසිපරිදි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 12ක් පවත්වා ඇත.

2.3.3. ව්‍යාපෘති වාර්තා සම්බන්ධයෙන් කටයුතු කිරීම

2025 වර්ෂය තුළ නිවාස හා ඉදිකිරීම් අංශයට අදාළව ඉදිරිපත් වූ ව්‍යාපෘති වාර්තා සංඛ්‍යාව 17ක් වන අතර, MNPEA/02/2019 චක්‍රලේඛයට අනුව එම ව්‍යාපෘති යෝජනා සියල්ල මූලික ඇගයීම් කටයුතු වලින් පසුව වැඩිදුර ඇගයීම්, නිර්දේශ කිරීම් හා අනුමත කිරීම් වැනි කාර්යයන් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ව්‍යාපෘති වාර්තා 08ක් සඳහා නිර්දේශ ලැබී ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන වෙත යොමු කරන ලදී.

2.3.4. ප්‍රගති වාර්තාකරණය

2025 වර්ෂය තුළ දී, ජනාධිපති කාර්යාලය වෙත අමාත්‍යාංශයේ කාර්තුමය ප්‍රගතිය අවස්ථා 4කදී MPMS (Ministry performance Monitorig System) පද්ධතිය ඔස්සේ ඉදිරිපත් කර ඇත.

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය වශයෙන් නියමිත ආකෘතියෙන් අවස්ථා 4කදී ද, මහ බැංකු වාර්ෂික වාර්තාව සඳහා අමාත්‍යාංශයේ තොරතුරු 2025 මාර්තු මාසයේදී ද, ඉදිරිපත් කර ඇත. තවද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අදාළව 2025.12.31 දිනට අදාළ ප්‍රගතිය රජයේ විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

2.3.5. 2025 ප්‍රාග්ධන ප්‍රතිපාදන වියදම් කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රගතිය සාරාංශය

නිවාස හා ඉදිකිරීම් අංශයට අනුබද්ධ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන වල 2025 වසරේ මහා භාණ්ඩාගාරයෙන් වෙන් වූ ප්‍රාග්ධන අරමුදල් සම්බන්ධයෙන් සමස්ත මූල්‍ය ප්‍රගතිය සාරාංශය පහත වගුවේ පරිදි වේ.

අ.අ	දෙපාර්තමේන්තුව/ ආයතනය	ප්‍රාග්ධන ප්‍රතිපාදන (රු.මි.)	ප්‍රාග්ධන වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
නිවාස හා ඉදිකිරීම් අංශය		88.61	52.61	59
	දෙපාර්තමේන්තු හා ආයතන			
01	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	5179.00	4791.62	93
02	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව	75.00	74.85	99
03	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	75.50	41.20	55
04	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	135.00	107.40	79
05	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	93.63	100.00	106

2.3.6. ඉදිරි දැක්ම

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මඟින් 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබාගැනීමේ අරමුණින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති යෝජනා 17ක් භාණ්ඩාගාර අරමුදල් ලබාගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා ඉල්ලා සිටින මුදල රුපියල් මිලියන 15,203ක් වේ. දැනට ව්‍යාපෘති යෝජනා 08ක් සඳහා අනුමැතිය ලැබී ඇති අතර ව්‍යාපෘති සාර්ථකව නිමකිරීම සඳහා ආයතන වලට නිසි මගපෙන්වීම සිදුකරයි. එමෙන්ම Rebuild Sri Lanka වැඩසටහන යටතේ දිට්වා ආපදාවෙන් විපතට පත්වූවන් වෙනුවෙන් සිදුකරනු ලබන නිවාස වැඩසටහන් සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම හා පසුවිපරම් කිරීම ද සිදුකරයි.

2.4 ජාතික නිවාස වැඩසටහන

2.4.1. "තමන්ගෙම තැනක් - ලස්සන ජීවිතයක්"

2025 වර්ෂයේ ආරම්භයේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් "සැමට නිවහන" නිවාස වැඩසටහන ලෙස ආරම්භ කළ මෙම නිවාස වැඩසටහන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව "තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක්" තේමාව කරගන්නා ලදී. අදියර 01 යටතේ රුපියල් මිලියන 2854ක් සහ අදියර 2 යටතේ රුපියල් මිලියන 1066ක් වෙන් විය. අදියර 01 යටතේ 2025.12.31 දිනට රුපියල් මිලියන 2841.30ක් වැයකරමින් වැඩ නිම කළ නිවාස ගණන 2415ක් විය. එමෙන්ම අදියර 01 යටතේ ඉතිරි රුපියල් මිලියන 12 පාස්කු ප්‍රහාරයෙන් විපතට පත්වූවන් සඳහා ගම්පහ කටුවාපිටිය නිවාස 12ක් ඉදිකිරීමට යොදාගෙන ඇත. අදියර 02 යටතේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 1066ක් සහ වැඩ ආරම්භ කළ නිවාස 1066කින් නිවාස 267ක වැඩ නිමකර ඇත.

තවද, සැමට සෙවණ ආධාර යටතේ 2015 - 2019 අවිච්ඡේද වැඩසටහන සඳහා මෙම වර්ෂයට රුපියල් මිලියන 200ක් වෙන් වූ අතර නිවාස ඒකක 740කින් නිවාස 405ක් නිම කිරීම සඳහා රුපියල් මිලියන 200ක් වැය වී ඇත.

2.4.2. පැරණි මහල් නිවාස නවීකරණ ව්‍යාපෘතිය

නගමුපුරවර ව්‍යාපෘතිය හරහා පැරණි මහල් නිවාස නවීකරණය ව්‍යාපෘති 04ක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 277.06ක් වැය වී ඇත.

2.4.3. රජයේ නිවාස යෝජනා ක්‍රම වල අත්‍යාවශ්‍ය නඩත්තු - ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන

රජයේ නිවාස යෝජනා ක්‍රම වල අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා රුපියල් මිලියන 440ක් අයවැය යෝජනා මඟින් ව්‍යාපෘති 08ක් සඳහා වෙන් වී ඇත. මෙම ව්‍යාපෘතියේ 2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 301.74ක් වේ.

2.4.4. සෙවණ ආධාර වැඩසටහන

සෙවණ ලොතරැයිය අලෙවිකිරීමෙන් ලැබෙන කොටස් මුදල මඟින් පිහිටුවා ඇති සෙවණ අරමුදල යොදාගැනීමෙන් සිදුකරනු ලබන මෙම වැඩසටහන මඟින් නිවාස 41ක වැඩ ආරම්භ කර ඇති අතර ඉන් නිවාස 7ක වැඩ අවසන් කර ඇත. ඒ සඳහා රුපියල් මිලියන 19.205ක් වැය වී ඇත.

2.4.5. නිවාස ණය වැඩසටහන

අභ්‍යන්තර උත්පාදන යොදවමින් තමන්ගේම තැනක්, ලස්සන ජීවිතයක් තේමාව යටතේ 2025 වර්ෂයේදී නිවාස ණය 2500ක් ලබාදීම සඳහා රුපියල් මිලියන 2500ක් ඇස්තමේන්තු කර තිබුණි. මින් රුපියල් මිලියන 1933.80ක් වැය කරමින් නිවාස ණය 2676ක් ලබාදී ඇත. එමෙන්ම ඉහත තේමාව යටතේ රජයේ නිලධාරීන් හට ලබාදෙන සේවාභිමාණි ණය 1000ක් ලබාදීම සඳහා රුපියල් මිලියන 1000ක් ඇස්තමේන්තු කර තිබුණි. මින් 2025.12.31 දින වන විට රුපියල් මිලියන 648.85ක් යොදවමින් නිවාස ණය 742ක් ලබාදී ඇත.

2.5. අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන

2.5.1. 2025 මූල්‍ය ප්‍රගතිය

අ.අ	ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන 2025 (රු.මි.)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය 2025.12.31 (%)
01	උතුරු හා නැගෙනහිර පළාත් වල අවතැන් වූ පවුල් සඳහා ගඩොල් හා බදාම ආකාරයේ ස්ථීර නිවාස ලබාදීමේ වැඩසටහන	2,500.00	2,468.37	98.73
02	නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති	1,000.00	836.17	83.62
03	බිම් වෙඩි ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය	70	67.83	96.9

2.5.2. භෞතික ප්‍රගතිය

* 2025.12.31 දින වන විට නිවාස 2,041 ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම අවසන් කිරීම.
* බිම්වෙඩි නිසැක කර නිදහස් කර ඇති භූමි ප්‍රමාණය වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්කය දක්වා ප්‍රගතිය අත්පත් කර ගැනීම.
* උතුරු හා නැගෙනහිර පළාත්වල පවුල් 5,389කට ජල සම්බන්ධතා ලබාදීම හා පවුල් 2,669කට ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබාදීම සහ දිස්ත්‍රික්කයන් 08හි නැවත පදිංචි කළ ප්‍රදේශ වල අභ්‍යන්තර මාර්ග 179ක ඉදිකිරීම් අවසන් කර ඇත.
* 2025 වර්ෂය තුළ යාපනය දිස්ත්‍රික්කයේ තවදුරටත් නිදහස් කිරීමට ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 57.77ක භූමි ප්‍රමාණයක් නිදහස් කිරීමට හැකි විය.

2.5.3. ඉදිරි දැක්ම

* උතුරු හා නැගෙනහිර පළාත්වල අවතැන්වූ පවුල් සඳහා ගඩොල් හා බදාම ආකාරයේ ස්ථීර නිවාස ලබාදීමේ වැඩසටහන යටතේ 2026 වර්ෂයේදී පානීය ජල පහසුකම් හා ගෘහස්ථ විදුලි පහසුකම් සහිත නිවාස 2,500ක් ඉදිකිරීමට අපේක්ෂිතය.
* බිම්වෙඩි නිසැක කිරීමේ ව්‍යාපෘතිය යටතේ වර්ග කිලෝමීටර් 5ක භූමි ප්‍රමාණයක් රජයේ භාණ්ඩාගාර අරමුදල් යොදා ගනිමින් ශ්‍රී ලංකා යුධ හමුදා ඉංජිනේරු බලකාය මඟින් හා ජාත්‍යන්තර සහ ජාත්‍යන්තර නොවන සංවිධාන (NGO's & INGO's) මඟින් නිසැක කිරීමට අපේක්ෂා කෙරේ.

2.6. රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව නිවාස ව්‍යාපෘති

2.6.1. "මිහිදුපුර" නිවාස ව්‍යාපෘතිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ, කොළඹ 5, එඩිමන්ටන් පාරේ පිහිටි පර්චස් 316ක භූමි භාගයක ඉහළ මධ්‍යම පාන්තික මහල් නිවාස ඒකක 560ක් ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී අරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය ඉතා අඩු ප්‍රගතියක් පැවතීම හේතුවෙන් එහි ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂයේදී තාවකාලිකව අත්හිටුවන ලදී. එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මීට පෙර සංවර්ධක ආයතනය ලෙස කටයුතු කළ CDC Industrial Infras ආයතනය යටතේම නැවත ආරම්භ කර ව්‍යාපෘතියේ පෙර පැවති වර්ග අඩි ප්‍රමාණය වැඩි වීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සංවර්ධනකරු සමඟ Letter & intend ගිවිසුම සහ Buy Back ගිවිසුම සහ Fidic ගිවිසුම අත්සන් කර ඉදිකිරීම් ආරම්භ කර ඇත.

මෙම නිවාස ව්‍යාපෘතිය රජයේ වෛද්‍ය සංගමය මඟින් වෛද්‍යවරුන්ගේ නිවාස සඳහා ලබා ගැනීමට යෝජනා වී ඇති අතර, මේ වන විට ඒ සම්බන්ධව සාකච්ඡා කරගෙන යනු ලැබේ. තවද, 2025.11.12 වන දින අවසානයට පැවති සාකච්ඡාවේදී, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සැලැස්ම සංශෝධනය කිරීමට එකඟ විය.

2.6.2. මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය - (වාද්දුව - සී බ්‍රීස් හා රාගම ලාවන්‍යා හයිට්ස් ව්‍යාපෘති)

නිවාස ඒකක 196කින් සමන්විත වාද්දුව සී බ්‍රීස් නිවාස ව්‍යාපෘතිය හා නිවාස ඒකක 124කින් සමන්විත රාගම ලාවන්‍යා හයිට්ස් නිවාස ව්‍යාපෘතිය 2016දී ඉදිකිරීම් ආරම්භ කරන ලදි. මෙම නිවාස ව්‍යාපෘතියේ සංවර්ධනකරු ලෙස කටයුතු කරන ලද්දේ CML-MTD Construction සමාගමයි. නමුත් සංවර්ධනකරු විසින් මුහුණ පෑ මූල්‍යමය ගැටලු හේතුවෙන් ව්‍යාපෘති 02හි ඉදිකිරීම් ප්‍රමාද විය. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පැවති නීතිමය තත්ත්වයක් හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ව්‍යාපෘතිය සිදුකර ගෙන යාමට අවසර හිමිවිය. මේ වන විට ඉතිරි ඉදිකිරීම් වැඩ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඇස්තමේන්තු සකස් කර ඇත. 2023 වර්ෂය අවසාන වන විට 55-60% අතර පරාසයක පැතිරුණු භෞතික ප්‍රගතියක් පවතී. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මේ වන විට ඉතිරි වැඩ සඳහා නව ඇස්තමේන්තු සකස් කරමින් පවතින අතර ඒ අනුව නිවසක නව වටිනාකම තීරණය කිරීමට නියමිතය. ඉන් අනතුරුව ව්‍යාපෘතිය සිදුකරගෙන යාමේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව උපදේශන ආයතනය ලෙස ක්‍රියා කිරීමට නියමිත අතර ඇස්තමේන්තුවට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් අනතුරුව නව කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට නියමිතය. මේ වන විට නිවාසවල ඉතිරි වැඩ සිදුකිරීමට අවශ්‍ය අමතර මුදල පිළිබඳව ගැණුම්කරුවන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා දැනුවත් කිරීමේ කාර්යය මේ වන විට සිදුකරමින් පවතී.

2.7. ඉන්දියානු ආධාර මත ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති

2.7.1. පූජ්‍ය මාඳුළුවාවේ සෝභිත නාහිමිගම ආදර්ශ ගම්මානය

මෙම ව්‍යාපෘතිය , අනුරාධපුර දිස්ත්‍රික්කයේ , මහවිලච්චිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ, දුනුමඩලාව ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාත්මක විය. අඩු ආදායම්ලාභී පවුල් 115කට නිවාස ලබාදීම සහ පූජ්‍ය මාඳුළුවාවේ සෝභිත නාහිමි විහාරස්ථානයේ, ආවාසගේ, පුස්තකාල ගොඩනැගිල්ල සහ දාන ශාලාව ඉදිකිරීම මීට ඇතුළත් විය. ශ්‍රී ලංකා රජයේ අරමුදලින් නිවාස 25ක් හා විහාරස්ථානයේ ආවාස ගේ, පුස්තකාල ගොඩනැගිල්ල සහ දාන ශාලාව ඉදිකිරීම සිදුකරන ලදී. ඉතිරි නිවාස 90හි ඉදිකිරීම් කටයුතු ඉන්දියානු රජයේ ප්‍රතිපාදන යටතේ මේ වන විට ඉදිකිරීම් අවසන් කර ප්‍රතිලාභීන් වෙත පිරිනමා ඇත.

2.7.2. "මන්නාරම මඩු දේවස්ථාන පරිශ්‍රයේ සංක්‍රමණ නිවාස" ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මන්නාරම මඩු දේවස්ථානයට පැමිණෙන බැතිමතුන් සඳහා නවාතැන් පහසුකම් ලබා දීමේ අරමුණින් ඉන්දියානු ආධාර මත මඩු දේවස්ථාන භූමියේ සංක්‍රමණික නිවාස 300ක් ඉදිකිරීම සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි.

2020.08.18 දින ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ ආරම්භක ඇස්තමේන්තුව රු.මි.290කි. මෙම ව්‍යාපෘතිය නියමිත කාලය තුළ අවසන් නොවීම නිසා එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව නැවත සංශෝධනය කර රු.මි. 400ක වටිනාකමට නැවත 2024.09.25 දින ගිවිසුම්ගතව ඇති අතර නිවාස සංඛ්‍යාව 96ක් ලෙස සංශෝධනය වී ඇත.

මෙම ව්‍යාපෘතියේ උපදේශක ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර, ව්‍යාපෘති සම්බන්ධීකරණය නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් සිදුකරයි. මෙම ව්‍යාපෘතියේ ගිවිසුම්ගත කාලය 2024.12.31 දිනයේ අවසන් වූ අතර 2025.02.13 දක්වා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලදී.

2025.09.30 වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

* භෞතික ප්‍රගතිය 62%
* මූල්‍ය ප්‍රගතිය (GOI) 44.2%
* මූල්‍ය ප්‍රගතිය (GOSL) 36.6%

ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය නිම නොවීම හේතුවෙන් නැවත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට ව්‍යාපෘතියේ උපදේශක විසින් සිදුකරන ලද ඉල්ලීම පරිදි 2026.01.31 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් වාචිකව එකඟතාවය පළකර ඇත.

2.7.3. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක වන ඉන්දියානු ආධාර නිවාස ව්‍යාපෘති

මෙහි වැඩසටහන් 04ට අදාළ මූලික තොරතුරු පහත වගුව මඟින් දක්වා ඇත. එහිදී එක් ව්‍යාපෘතියක නිවාස 600ක් බැගින් සමස්ත නිවාස ඒකක 2400ක් ඉදිකිරීමට නියමිතය.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු.මි.)	ව්‍යාපෘති කාලසීමාව	2025 වනවිට ප්‍රගතිය (%)
ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය - දීප ව්‍යාප්ත	රු.මි. 300.00	අවුරුදු 08	93
ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය - 2017 දකුණු පළාත - 1	රු.මි. 300.00	අවුරුදු 08	25
ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය - උතුරු පළාත	රු.මි. 300.00	අවුරුදු 08	29
ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය - 2019 දකුණු පළාත - 11	රු.මි. 300.00	අවුරුදු 08	6

2.8. ජල සම්පාදන අංශය

2.8.1. 2025 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදනවල 2025.12.31 දිනට මූල්‍ය අංශයේ සමස්ත ප්‍රගතිය

අ.අ	ව්‍යාපෘතිය / වැඩසටහන	ප්‍රතිපාදන රු.මි. (2025)	2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය	
			රු.මි.	%
ජල සම්පාදන අංශය				
1.	වැසි ජලය එක්රැස් කිරීමේ වැඩසටහන	50.00	22.92	45.84
2.	ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ ජල මූලාශ්‍ර දූෂණය වීම වැළැක්වීම	20.00	14.40	72
3.	සනීපාරක්ෂාව පිළිබඳ දැනුම ආසියානු සමුළුවේ පසු විපරම් කටයුතු දිවයින පුරා ක්‍රියාත්මක සනීපාරක්ෂක වැඩසටහන	50.00	48.06	96.12
4.	ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන	200.00	96.44	48.22
5.	හඳුනා නොගත් වකුගඩු රෝගවලට ගොදුරු වූ ප්‍රදේශ සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීම	250.00	76.24	30.50
6.	ජලය, සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව පිළිබඳ දරුවන් හා සෞඛ්‍ය සේවකයින්ගේ දැනුම හා නිපුණතා වර්ධනය කිරීමේ වැඩසටහන (යුනිසෙෆ්)	8.00	7.48	93.50
උප එකතුව - I		**578.00**	**266.08**	**46.03**
7	ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව)	4,152.60	3,913.50	94.24
8	ජල තාක්ෂණය සඳහා වූ ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශ මධ්‍යස්ථානය	26.00	25.98	99.92
උප එකතුව -II		**4,756.60**	**4,205.56**	**88.41**
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය				
9	උපයෝගීතා සේවා සැපයීම	111.32	111.32	100
10	ඉඩම් අත්පත් කරගැනීම	1,761.60	1,761.60	100
11	ක්‍රියාත්මක වෙමින් පවතින මහා පරිමාණ ජල සම්පාදන හා අප ජල ව්‍යාපෘති සඳහා (ඇමුණුම 1- ව්‍යාපෘති ප්‍රගතිය)	36,997.81	21,741.88	58.76
13	ධාරිතා වැඩිදියුණු කිරීමේ සහ බෙදා හැරීම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය	7,494.26	7,154.16	95.46
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එකතුව		**46,364.99**	**30,768.96**	**66.36**

අ.අ	ව්‍යාපෘතිය / වැඩසටහන	ප්‍රතිපාදන රු.මි. (2025)	2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය	
			රු.මි.	%
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව				
14	"ප්‍රජා ජල අභිමානී" ජල සම්පාදන යෝජනා ක්‍රමය	2,000.00	968.67	48.43
15	ප්‍රජා ජල සම්පාදනය වැඩිදියුණු කිරීම	700.00	142.84	20.41
16	ප්‍රජාව විසින් පාලනය කරනු ලබන ජල යෝජනා ක්‍රම සඳහා ජල ආරක්ෂණ සැලසුම් කිරීම (යුනිසෙෆ්)	1.00	1.00	100
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ එකතුව		**2,701.00**	**1,112..51**	**41.19**
මුළු එකතුව		**53,822.59**	**35,737.36**	**66.40**

2.8.2. ආංශික ප්‍රගතිය හා ඉලක්ක

අ.අ	කාර්ය සාධක දර්ශක	ඒකකය	2024.12.31 දිනට ප්‍රගතිය	2025.01.01-2025.12.31 දිනට		
				ඉලක්කය	ප්‍රගතිය	%
1	ගෘහස්ථ නල මාර්ග ජල සැපයුම් ආවරණය වැඩි කිරීම	නල ජල සම්බන්ධතා සංඛ්‍යාව	3,486,296	132,165	94,726	71.67
2	නල මලාපවහන පහසුකම් ආවරණය වැඩි කිරීම	නල මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව	29,096	2,093	2,601	124
3	ආදායම් නොලබන ජල සැපයුම අඩු කිරීම	%	24.69	24.32	24.35	94.07

මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව - ප්‍රගති වාර්තා

2.8.3. ක්‍රියාත්මක වෙමින් පවතින මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (භාණ්ඩාගාර ප්‍රතිපාදන)

අ.අ	ව්‍යාපෘතියේ නම	අරමුදල් ප්‍රභවය	ව්‍යාපෘති කාල සීමාව	මුළු ඇස්තමේන්තු මුදල (රු.මි.)	සමුච්චිත ප්‍රගතිය 2024.12.31 දිනට		ප්‍රතිපාදන 2025 (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය 2025.01.01-2025.12.31 (රු.මි.)	සමුච්චිත භෞතික ප්‍රගතිය 2025.12.31 දිනට (%)
					මූල්‍ය (රු.මි.)	භෞතික (%)			
1	මහකොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන -II	ADB / GoSL	2014 සැප්. – 2026 ජූනි	14,124.00	19,984.07	99	463.74	463.74	99
2	මහකොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන -III	ADB / GoSL	2016 නොවැ. – 2026 ජූනි	7,222.00	12,352.91	-	-	-	N/A
3	අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා ආයෝජන වැඩසටහන	GoSL/ France	2016 ජූනි - 2026 ජූනි	13,000.00	14,454.97	91.45	1,400.00	1,096.81	95.20
4	යාපනය, කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය	ADB / GoSL	2011 අගෝ. – 2029 දෙසැ.	35,881.49	35,073.09	90.4	5,385.00	5,699.26	97
5	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - I වන අදියර	JICA / GoSL	2014 ජූලි - 2025 ජූලි	11,515.00	9,102.91	99.1	909.00	381.67	100
6	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - II වන අදියර	JICA / GoSL	2018 මැයි - 2031 ජූනි	31,598.00	417.05	13.13	432.00	13.94	13.14
7	කළු ගඟ ජල සම්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය - 1	JICA / GoSL	2020 දෙසැ. සිට 2029 දෙසැ.	73,307.00	933.29	5.44	1,050.00	89.77	6.395
8	රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය	EDCF Korea / GoSL	2019 දෙසැ. – 2028 සැප්.	6,291.00 (25.546 Mn USD + Rs.2,147 Mn)	3,481.76	70.7	3,401.07	743.30	76.21

අ.අ	ව්‍යාපෘතියේ නම	අරමුදල් ප්‍රභවය	ව්‍යාපෘති කාල සීමාව	මුළු ඇස්තමේන්තු මුදල (රු.මි.)	සමුච්චිත ප්‍රගතිය 2024.12.31 දිනට		ප්‍රතිපාදන 2025 (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය 2025.01.01-2025.12.31 (රු.මි.)	සමුච්චිත භෞතික ප්‍රගතිය 2025.12.31 දිනට (%)
					මූල්‍ය (රු.මි.)	භෞතික (%)			
9	මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	China Exim Bank / GoSL	2019 අගෝ. - 2027 ජූලි	57,980.00	30,946.43	88.75	19,845.60	12,292.45	90.36
10	පාලි ආරු ජල සම්පාදන ව්‍යාපෘතිය (විසල් යාපනය)		2024 ජනවාරි - 2031 සැප්.	116,665.05	30.41	-	60.00	4.44	42.8
11	ගිරිබාව, එප්පාවල,රාජාංගනය සහ නොච්චියාගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1		2025 නොවැ. - 2029 දෙසැ.	32,211.13	-		797.4	-	1.4
උප එකතුව				**399,575.67**	**126,776.89**	-	**33,743.81**	**20,785.38**	-

2.8.4. ක්‍රියාත්මක වෙමින් පවතින මලාපවහන ව්‍යාපෘති - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - (භාණ්ඩාගාර ප්‍රතිපාදන)

අ.අ	ව්‍යාපෘතියේ නම	අරමුදල් ප්‍රභවය	ව්‍යාපෘති කාල සීමාව	මුළු ඇස්තමේන්තු මුදල (රු.මි.)	සමුච්චිත ප්‍රගතිය 2024.12.31 දිනට		සමුච්චිත ප්‍රගතිය 2024.12.31 දිනට	මූල්‍ය ප්‍රගතිය 2025.01.01-2025.12.31 (රු.මි.)	සමුච්චිත භෞතික ප්‍රගතිය 2025.12.31 දිනට (%)
					මූල්‍ය (රු.මි.)	භෞතික (%)			
1	මහනුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය	JICA / GoSL	2010 ජූලි - 2027 අගෝ.	22,588.00	20,561.32	93.93	1,381.00	213.48	95.36
2	රත්මලාන/මොරටුව ප්‍රදේශ වල නල මගින් මලාපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	AFD / GoSL	2016 ජූලි - 2026 දෙසැ.	5,548.00	2,231.77	25	1,779.00	743.02	49.43
උප එකතුව				**28,136.00**	**22,793.09**		**3,160.00**	**956.50**	
එකතුව				**427,711.67**	**149,569.98**		**36,903.81**	**21,741.88**	

2.8.5. ක්‍රියාත්මක වෙමින් පවතින ජල සම්පාදන ව්‍යාපෘති - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - (මණ්ඩල ප්‍රතිපාදන)

අ.අ	ව්‍යාපෘතියේ නම	අරමුදල් ප්‍රභවය	ව්‍යාපෘති කාල සීමාව	මුළු ඇස්තමේන්තු මුදල (රු.මි.)	සමුච්චිත ප්‍රගතිය 2024.12.31 දිනට		ප්‍රතිපාදන 2025 (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය 2025.01.01-2025.12.31 (රු.මි.)	සමුච්චිත භෞතික ප්‍රගතිය 2025.12.31 දිනට (%)
					මූල්‍ය (රු.මි.)	භෞතික (%)			
1	ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	CDB / BoC / GoSL	2017 පෙබ. - 2026 සැප්.	33,060.00	42,906.18	97.11	11,419.00	11,095.18	98.38
2	අලුත්ගම, මතුගම, අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	Indian Exim Bank / BoC / GoSL	2017 මැයි - 2026 ජුනි	32,272.73	33,601.16	96.05	4,850.00	4,764.61	98.86
3	තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය	CDB / BoC / GoSL	2018 ජූලි - 2026 සැප්.	15,840.67	29,089.82	86.81	1,700.00	1,157.80	95.10
4	පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	Indian Exim Bank / BoC / GoSL	2017 ජූලි - 2026 ජුනි	20,207.80	20,343.76	94.56	2,125.00	1,062.69	95.03
	එකතුව			**101,381.20**	**125,940.92**		**20,094.00**	**18,080.28**	

2.8.6. දේශීය බැංකු ණය - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

අ.අ	ව්‍යාපෘතියේ නම	අරමුදල් ප්‍රභවය	ව්‍යාපෘති කාල සීමාව	මුළු ඇස්තමේන්තු මුදල (රු.මි.)	මුළු වියදම 2024.12.31 දිනට (රු. මි.)	සමුච්චිත භෞතික ප්‍රගතිය 2024.12.31 දිනට (%)	ප්‍රතිපාදන 2025 (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය 2025.01.01 - 2025.12.31 (රු.මි.)	සමුච්චිත භෞතික ප්‍රගතිය 2025.12.31 දිනට (%)
1	කොළඹ නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - 1	BOC	Already Completed (10.02.2020)	5,170.00	4,648.00	100	80.00	-	100
2	කොළඹ නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - 2	BOC	Jan. 2025	4,823.00	3,016.00	98.60	285.00	284.64	100
3	කොළඹ නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය -3	BOC	Already Completed (28.07.2020)	8,043.25	7,443.25	100	135.00	117.054	100
4	විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය	NDB	Jan. 2026.	3,580.00	1,778.00	71.89	890.00	138.718	77.88
5	ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය	HNB	2016 ජූලි - 2025 දෙසැ.	4,496.00	3,782.00	88.69	1,211.42	230.75	97.09
	එකතුව			**26,112.25**	**20,667.25**		**2,601.42**	**771.162**	

2.8.7. 2025 වර්ෂය තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණදුන් අභියෝග

- ජල මූලාශ්‍ර දූෂණය පිළිබඳ ගැටලු.
- ගංවතුර මගින් හා නියඟය නිසා ජලයේ ගුණාත්මකභාවය පිරිහීම.
- දිට්වා සුළි කුණාටුව මඟින් රු.බි. 13ක පමණ සිදුවූ විශාල හානිය යථා තත්ත්වයට පත්කිරීමේ අභියෝගය.
- නියඟය තුළ ඉල්ලුමට සරිලන සැපයුම කළමනාකරණය කිරීමට ප්‍රමාණවත් ගබඩා ධාරිතාවක් අදාළ ආයතන පද්ධතීන් තුළ නොමැතිවීම.
- ජලය සහ සනීපාරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අරමුදල් සම්පාදනයේ පවතින බාධා.
- ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වෙනත් ආයතනවලින් (RDA, වාරිමාර්ග, පළාත් පාලන ආයතන ආදිය) අනුමැතිය ලබා ගැනීමේදී සිදුවන ප්‍රමාද සහ ඒ සඳහා වන අධික වියදම්.

2.9. නිවාස අංශය

නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා නිවාස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම නිවාස අංශයේ ප්‍රධාන රාජකාරිය වේ.

2.9.1. නිවාස පිළිබඳ මෙහෙයුම් කමිටුව

නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන වලට අමතරව ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා පළාත් සභා යන අමාත්‍යාංශ විසින් ද තම විෂය පථය හා ඉලක්කගත කණ්ඩායම්වල නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා නිවාස ඉදිකිරීමෙහි නියුතු වේ. සියලු අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක නිවාස වැඩසටහන් යම් නිශ්චිත ප්‍රමිති, නිර්ණායක හා ක්‍රමවේදයන් තුළට ගනිමින් ‘‘තමන්ගෙම තැනක් ලස්සන ජීවිතයක්’’ යන තේමාව පෙරදැරිව "ජාතික නිවාස වැඩසටහන" සැලසුම් කිරීමට අපේක්ෂිත අතර, ඒ සඳහා අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා නිවාස පිළිබඳව කටයුතු කරන සියලු අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරමින් මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමට කටයුතු කරමින් පවතී.

එම කමිටුව මඟින් තොරතුරු ලබා ගනිමින් ජාතික නිවාස ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම හා නිවාස පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

2.9.2. ජාතික නිවාස ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම.

2014 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද ජාතික නිවාස ප්‍රතිපත්තිය, නාගරීකරණය, ස්වභාවික ව්‍යසනවල බලපෑම හා තිරසර මානව ජනාවාස සංවර්ධන සංකල්පය ක්‍රියාත්මක කිරීම වැනි ගැටළු සඳහා අවධානය යොමු කරමින් සංශෝධනය කරන ලද අතර, ඒ සඳහා අංක 19/0283/122/012 හා 2019.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අනුමැතිය හිමි විය.

වත්මන් රජයේ ‘‘පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්’’ ප්‍රතිපත්තියෙහි අන්තර්ගත වන ‘‘සුවපහසු නිවසක් - සනීපාරක්ෂක ජීවිතයක්’’ නිවාස ප්‍රතිපත්තිය යටතේ, ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා අවශ්‍යතාවයට ප්‍රමාණවත් වන පරිදි ගුණාත්මක නිවාස හා යටිතල පහසුකම් සඳහා ප්‍රවේශයක් සැලසීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් වත්මන් නිවාස ප්‍රතිපත්තිය නැවත සංශෝධනය කිරීමට යෝජිතය. ඒ සඳහා අවශ්‍ය තොරතුරු නිවාස පිළිබඳව කටයුතු කරන සියළු අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරමින් පිහිටුවා ඇති මෙහෙයුම් කමිටුව මඟින් ලබාගැනීමට අපේක්ෂිත අතර ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හා විද්වතුන්ගෙන් සමන්විත ප්‍රතිපත්ති සම්පාදක කමිටුවක් විසින් ජාතික නිවාස ප්‍රතිපත්තිය සකස් කිරීමට සැලසුම් කර ඇත.

2.9.3. ලෝක ජනාවාස දිනය ක්‍රියාත්මක කිරීම.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සෑම වසරකම ඔක්තෝම්බර් මස පළමු සඳුදා දිනය ලෝක ජනාවාස දිනය ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර, ඒ අනුව මෙවර ලෝක ජනාවාස දිනය 2025 ඔක්තෝබර් මස 06වන දිනට යෙදී ඇත. නිවාස හා ජනාවාස සංවර්ධනය සම්බන්ධ ගැටලු විකල්ප විසඳුම් හා නව ප්‍රවනතා පිළිබඳව සියළු පාර්ශවකරුවන්ගේ අවධානය යොමු කිරීමෙන් ජාතික මට්ටමේ සංවාදයන් ගොඩනැගීම තුළින් ඒ පිළිබඳව සියලු පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා ඒවායේ ප්‍රතිලාභ ඔවුන් වෙත ළඟාකරදීමත් මෙහි අරමුණ වේ.

ඒ අනුව, ලෝක ජනාවාස දිනය ලොව පුරා ක්‍රියාවට නංවන එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ ශ්‍රී ලංකා නියෝජිත ආයතනය වන නිවාස විෂයභාර අමාත්‍යාංශය ලෙස නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය විසින් ඉහත අරමුණු සපුරා ගැනීම සඳහා සිය අනුබද්ධ ආයතනය හා එක්ව 2025 ඔක්තෝබර් මස 05වන දින ''තමන්ගෙම තැනක් - ලස්සන ජීවිතයක්'' තේමාව යටතේ ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී ලෝක ජනාවාස දින සැමරුම් උත්සවය පවත්වන ලද අතර, එදින හා ඊට සමගාමීව ක්‍රියාත්මක වූ වැඩසටහන් පහත පරිදි වේ.

* නිවාස ඉදිකරගැනීමට මූල්‍යමය හැකියාවක් නොමැති අසරණ දිළිඳු පවුල් 4000කට ආසන්න ප්‍රමාණයක් සඳහා සනීපාරක්ෂක නිවාස සැපයීමේ අරමුණින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද නිවාස වැඩසටහන යටතේ ඉදිකිරීම අවසන් කළ නිවාස 1000ක් ජනතා අයිතියට පත්කිරීම.
* එක් නිවහනකට රු.මිලියනය බැගින් නව නිවාස ආධාර 157ක් පිරිනැමීම.
* ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද නිවාස වැඩසටහන්වල ප්‍රතිලාභීන් 315ක් සඳහා හිමිකම් ඔප්පු ප්‍රදානය.
* ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2025 ලෝක ජනාවාස දිනයට සමගාමීව වයස් කාණ්ඩ 3ක් යටතේ පවත්වන ලද සමස්ත ලංකා පාසල් චිත්‍ර තරඟාවලියේ සහ වයස් කාණ්ඩ 2ක් හා භාෂා මාධ්‍ය 2ක් යටතේ පවත්වන ලද සමස්ත ලංකා ගද්‍ය රචනා තරඟයේ ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග ප්‍රදානය.
* 2025 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන්, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සමාජ සජීවීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන නාගරික අඩුපහසුකම් ජනාවාසවල ළමා සමාජ දරුවන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද ළමා චිත්‍ර තරඟය (වයස් කාණ්ඩ 3ක් යටතේ), නර්තන තරඟය, කෙටි වීඩියෝපට තරඟය, යෞවන හා ක්‍රීඩා සමාජ වල තරුණ ප්‍රජාව ඉලක්ක කරගනිමින් පැවති පිරිමි/කාන්තා ක්‍රිකට් තරඟය හා එම ජනාවාස වල කුඩා පරිමාණ ව්‍යවසායකයන්ගේ දිරිගැන්වීම ඉලක්ක කරගත් ස්වයං රැකියා හා ව්‍යවසායකත්ව වෙළඳපොළෙහි ජයග්‍රාහකයන් සඳහා තිළිණ ප්‍රදානය.
* ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල පාරිසරික තත්ත්වයන්ට ගැලපෙන පරිදි, එම පළාත්වල පහසුවෙන් සොයාගත හැකි අමුද්‍රව්‍ය භාවිතා කරමින් සරලව හා පහසුවෙන් සාදාගත හැකි නිවාස ආකෘති හඳුන්වාදීම අරමුණු කරගනිමින් නාගරික සංවර්ධන අධිකාරියේ මෙහෙයවීමෙන් හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ සංගමයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද නිවාස ආකෘති තරඟයේ ජයග්‍රාහකයන් සඳහා තිළිණ ප්‍රදානය.
* සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් තෝරාගත්, දැනට පිහිටුවා ඇති කළමනාකරණ සංස්ථා අතුරින් වඩාත් සක්‍රීය හා ඵලදායීව ක්‍රියාත්මක වන හොඳම කළමනාකරණ සංස්ථාව සඳහා ත්‍යාග ප්‍රදානය.
* ශ්‍රී ලංකාවේ නිවාසකරණය, ප්‍රතිපත්ති, උපාය මාර්ග හා සැලසුම් පිළිබඳ විද්වත් සාකච්ඡාව හා සම්මන්ත්‍රණය.
* ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය සමඟ එක්ව ජනාවාස හා පොදු ස්ථාන පිරිසිදු කිරීම හා ශ්‍රමදාන වැඩසටහන්, රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
* ජනාවාසකරණයේ ගැටලු, විසඳුම් හා නව ප්‍රවනතා පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා රූපවාහිනී/ගුවන් විදුලි සාකච්ඡා පැවැත්වීම, ප්‍රවෘත්ති පත්‍ර අතිරේකයන් පළකිරීම හා ජනාවාස ගීතය එළිදැක්වීම.
* ජනාවාස සතියක් ප්‍රකාශයට පත්කර සෑම පාර්ශවයක්ම ඉලක්ක කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2.9.4. මහජන ඉල්ලීම් සම්බන්ධ කටයුතු

ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, වෙනත් අමාත්‍යාංශ හා ආයතන වලින් හා සෘජුවම, නිවාස/ නිවාස ණය/ නිවාස ආධාර සම්බන්ධ ඉල්ලීම් හා නිවාස විෂයට අදාළ පැමිණිලි අමාත්‍යාංශය වෙත යොමු වේ. එසේ යොමු කෙරෙන ඉල්ලීම් සුදුසු නිවාස වැඩසටහන් සඳහා සම්බන්ධ කර ගැනීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කෙරෙන අතර, නිවාස විෂයට අදාළ පැමිණිලි සඳහා අදාළ ආයතන වෙතින් වාර්තා කැඳවා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරයි.

2025 වර්ෂය සඳහා මේ වන විට මහජන ඉල්ලීම් හා පැමිණිලි 285ක් පමණ ඉදිරිපත් වී ඇති අතර, ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත.

2.9.5. ඉදිරි දැක්ම

- **නිවාස සංවර්ධනය**

2026 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් පහත නිවාස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම හා පසු විපරම් කිරීම.

* නිවසක් නොමැති/ වැඩිදියුණු කල යුතු තත්ත්වයේ නිවසක පදිංචි අඩු ආදායම්ලාභී ජනතාව සඳහා දීපව්‍යාප්තව "තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක්" නිවාස ආධාර වැඩසටහන
* ‘‘සැමට සෙවණ’’ - ආධාර අවිච්ඡේද (20215/2019) වැඩසටහන
* පැරණි නිවාස ක්‍රම නවීකරණය
* මධ්‍යම පාන්තික නිවාස ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය

- **නිවාස පිළිබඳ මෙහෙයුම් කමිටුව**

නිවාස ඉදිකිරීමට සම්බන්ධ සියලු අමාත්‍යාංශ හා රාජ්‍ය/ අර්ධ රජය ආයතන/ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් නිවාස පිළිබඳ මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමට කටයුතු කරමින් පවතියි. මෙම කමිටුව වසරකට කිහිප වරක් රැස්වීමට අපේක්ෂිත අතර, එමඟින් සියලු අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක නිවාස වැඩසටහන් යම් නිශ්චිත ප්‍රමිති, නිර්ණායක හා ක්‍රමවේදයන් තුළට ගනිමින් ‘‘තමන්ගේම තැනක් ලස්සන ජීවිතයක්’’ යන තේමාව පෙරිදැරිව "ජාතික නිවාස වැඩසටහන" සැලසුම් කිරීමට අපේක්ෂිතය.

තවද, එම කමිටුව මඟින් තොරතුරු ලබා ගනිමින් ජාතික නිවාස ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම හා නිවාස පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

- **ජාතික නිවාස ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා තොරතුරු සැපයීම**

2014 වර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද ජාතික නිවාස ප්‍රතිපත්තිය, නාගරීකරණය, ස්වාභාවික ව්‍යසනවල බලපෑම හා තිරසර මානව ජනාවාස සංවර්ධන සංකල්පය ක්‍රියාත්මක කිරීම වැනි ගැටලු සඳහා අවධානය යොමු කරමින් සංශෝධනය කරන ලද අතර, ඒ සඳහා අංක 19/0283/122/012 හා 2019.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අනුමැතිය හිමි විය.

වත්මන් රජයේ ’’පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්’’ ප්‍රතිපත්තියෙහි අන්තර්ගත වන ‘‘ සුවපහසු නිවසක් - සනීපාරක්ෂක ජීවිතයක් ’’ නිවාස ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ, විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා අවශ්‍යතාවයට ප්‍රමාණවත් වන පරිදි ගුණාත්මක නිවාස හා යටිතල පහසුකම් සඳහා ප්‍රවේශයක්

සැලසීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් වත්මන් නිවාස ප්‍රතිපත්තිය නැවත සංශෝධනය කිරීමට යෝජිතය.

නිවාස පිළිබඳව කටයුතු කරන සියළු අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරමින් පිහිටුවා ඇති මෙහෙයුම් කමිටුව සම්බන්ධීකරණය කරමින් නිවාස ප්‍රතිපත්තිය සංශෝධනය සඳහා තොරතුරු සැපයීම මෙම අංශය විසින් සිදුකෙරේ.

- **ලෝක ජනාවාස දිනය ක්‍රියාත්මක කිරීම.**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සෑම වසරකම ඔක්තෝම්බර් මස පළමු සඳුදා දිනය ලෝක ජනාවාස දිනය ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, ඒ අනුව මෙවර ලෝක ජනාවාස දිනය 2025 ඔක්තෝම්බර් මස 07වන දිනට යෙදී ඇත. නිවාස හා ජනාවාස සංවර්ධනය සම්බන්ධ ගැටලු, විකල්ප, විසඳුම් හා නව ප්‍රවනතා පිළිබඳව සියළු පාර්ශවකරුවන්ගේ අවධානය යොමු කිරීමෙන් ජාතික මට්ටමේ සංවාදයන් ගොඩනැගීම තුළින් ඒ පිළිබඳව සියලු පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා ඒවායේ ප්‍රතිලාභ ඔවුන් වෙත ළඟාකර දීමත් මෙහි අරමුණ වේ.

ඒ අනුව, ලෝක ජනාවාස දිනය ලොව පුරා ක්‍රියාවට නංවන එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ ශ්‍රී ලංකා නියෝජිත ආයතනය වන නිවාස විෂයභාර අමාත්‍යාංශය ලෙස නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ඉහත අරමුණු සපුරා ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.

වාර්ෂිකව ලෝක ජනාවාස දිනය, නිවාස හා ජනාවාස පිළිබඳ වඩාත් කාලීන මාතෘකාවක් ඔස්සේ සමරනු ලැබේ. ඒ සඳහා දැනුවත් කිරීමේ හා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන්, ළමා හා තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් තරඟ, කුඩා පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනය සඳහා වැඩසටහන්, නිවාස සංවර්ධන හා හිමිකම් ප්‍රදාන වැඩසටහන් ආදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- **මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම වේගවත් කිරීම**

නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරෙන මහජන ඉල්ලීම් ඇතුළත් කිරීම සඳහා google sheet එකක් හඳුන්වා දී ඇත.

මේ සඳහා වගකිවයුතු නිලධාරීන් දැනුවත් කර මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය වඩාත් වේගවත් හා විධිමත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

2.10. නිවාස කොමසාරිස් අංශය

2.10.1. 2025 ප්‍රගතිය

නිවාස කොමසාරිස් අංශය විසින් 2025.01.01 දින සිට 2025.12.31 දක්වා කාලය තුල සිදුකරන ලද කාර්යයන් පහත පරිදි වේ.

අ.අ	සිදු කරන ලද කාර්යයන්..	සංඛ්‍යාව
1	වැඩ අවසන් කරන ලද සින්නක්කර ඔප්පු (අවසාන අදියර)	15
2	ලැබුණු රාජකාරිමය ලිපි	532
3	මහජන හමුවීම්	458
4	පිඹුරු පිටපත් නිකුත් කිරීම	83
5	ඔප්පු වල සහතික පිටපත් නිකුත් කිරීම	35
6	වරද නිවැරදි කිරීමේ ඔප්පු සකස් කිරීම	02
7	අර්ධ අධිකරණමය පරීක්ෂණ පැවැත්වීම	12
8	විවිධ අධිකරණ වල සාක්ෂි ලබාදීම	11
9	අධිකරණයේ පවතින නඩු	19
10	ගැසට් නිවේදන සකස් කිරීම	02
11	පුවත්පත් නිවේදන සැකසීම	01
12	නිවාස සමිති සම්බන්ධ ගැටලුව නිරාකරණය කිරීම සඳහා කටයුතු කිරීම I. නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපි යැවීම II. මහ බැංකුව වෙත ලිපි යැවීම III. අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ පෙනි සිටීමින් තොරතුරු ලබාදීම	 02 02 06
13	ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සමඟ ගනුදෙනු කිරීම පත්ඉරු පරීක්ෂාව මාසික ලැයිස්තු භාරදීම	07 10 12
14	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීම	04
15	තොරතුරු පනත අනුව තොරතුරු ලබාදීම	12
16	තොරතුරු කොමිෂන් සභාව වෙත පරීක්ෂණ සඳහා සහභාගි වීම	05
17	තක්සේරු මණ්ඩලය වෙත තක්සේරු වාර්තා යොමු කිරීම	06

2.10.2. ඉදිරි දැක්ම

* ජාතික නිවාස කොමසාරිස්වරයාට පැවරී ඇති, එහෙත් 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතේ විධි විධානයන්ට අනුව තවදුරටත් ඔප්පු ලබාදීමට නොහැකි වූ කුලී නිවැසියන්ට ඔප්පු ලබාදීමට කටයුතු කිරීම. මේ අනුව ඔප්පු 87ක් පමණ ලබා දීමට නියමිතය.
* ලිපි ගොනු පරීක්ෂා කර ඔප්පු ලබා දීමට ඇති හැකියාව සොයා බැලීම.
* මෙම වසර තුළ ලැබෙන මහජන ඉල්ලීම් සහ මහජන හමුවීම අනුව ඉදිරි කටයුතු සිදුකිරීම. (මේ සම්බන්ධව පූර්ව තොරතුරු ලබා දීමට හැකියාවක් නොමැත)
* ස්ථානීය පරීක්ෂණ සහ කාර්යාලීය පරීක්ෂණ පවත්වා නිවාස වල පදිංචිකරුවන්ගේ/ කුලී නිවැසියන්ගේ ගැටලු සඳහා විසඳුම් ලබාදීම.
* නඩු කටයුතු සඳහා අධිකරණ තුළ සාක්ෂි පිණිස පෙනී සිටීම.
* නීතිපති දෙපාර්තමේන්තුවේ නීති උපදෙස් සඳහා සාකච්ඡා වලට සහභාගි වීම.
* නීතිපති දෙපාර්තමේන්තුව සමඟ අධිකරණ කටයුතු පිළිබඳව කටයුතු කිරීම.
* නිවාස සමිති අධීක්ෂණය කිරීම.
* 2025 වර්ෂයේ සිදුකරනු ලැබූ, ඉතිරිව පවතින රාජකාරී කටයුතු අඛණ්ඩව සිදුකිරීම.

2.11. මූල්‍ය අංශය

2.11.1. 2025 ප්‍රගතිය

2025 වර්ෂය සඳහා අයවැය ලේඛනය මඟින් සලසා දී ඇති මූලධන හා පුනරාවර්තන ප්‍රතිපාදන වල අදාළ අක්මුදල් ලබාගෙන එම මුදල් උපරිම කාර්යක්ෂමතාවයකට පත්කිරීම සඳහා ආයතනයන් තුළ නිසිකලට බෙදාහරිමින් වාර්තා පවත්වාගෙන යාම හා මාසික, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර නිසි වෙලාවට ලබාදීම මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

2025 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශය යටතේ නිවාස, ඉදිකිරීම්, ජලසම්පාදන හා නාගරික සංවර්ධන විෂයන් සඳහා රුපියල් මිලියන 86366.86ක මූලධන හා රුපියල් මිලියන 1607.14ක පුනරාවර්තන වියදම් වශයෙන් අයවැය වාර්තාවෙන් වෙන්කර තිබිණි. එම මූල්‍ය ප්‍රතිපාදන වලින් මූලධන සඳහා රුපියල් මිලියන 63528.29ක් ද, පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 1313.42ක් ද වැය කර ඇත.

2.11.2. ඉදිරි දැක්ම

අමාත්‍යාංශ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම වස් ඒ ඒ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අමාත්‍යාංශයට අවශ්‍ය වන සියලුම ද්‍රව්‍ය උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව ප්‍රසම්පාදනය කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම මඟින් අමාත්‍යාංශ ඉලක්ක වලට ළඟාවීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම සිදුකෙරේ. එමෙන්ම මනා මූල්‍ය පාලනයක් පවත්වාගෙනයාම සඳහා නව ක්‍රමවේද හඳුන්වාදීම ද මූල්‍ය අංශය මඟින් සිදුකෙරේ.

2.12. අභ්‍යන්තර විගණන අංශය

2.12.1. 2025 ප්‍රගතිය

2025 වර්ෂයේ දී විගණන වාර්තා 13ක් සහ විගණන විමසුම් 06ක කටයුතු අවසන් කර ඇත. 2025.12.31 වන විට විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පවත්වා ඇත. අනුබද්ධිත ආයතනයන්හි විමර්ශන 13ක් අවසන් කර ඇත.

2.12.2. ඉදිරි දැක්ම

2026 වර්ෂයේ දී විමර්ශන කටයුතු වැඩි ප්‍රමාණයක් ඉටුකිරීමටත්, අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සඳහා වැඩි ඉඩක් ලබාගැනීමටත් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් කාර්තුමය වශයෙන් පැවැත්වීමට විගණන වැඩසටහනට ඇතුළත් කරගෙන ඇත.

2.13. ඉදිකිරීම් අංශය

2.13.1. 2025 ප්‍රගතිය

* පහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර ඇත.

  - ✓ "යටිතල පහසුකම් සහ ඉදිකිරීම් සඳහා දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ඉහළ මට්ටමේ ජාතික කමිටුවක් (HLNC) පිහිටුවීම" මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කිරීම.
  - ✓ "ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රම හිඟය විසඳීමට ප්‍රතිපත්තිමය පියවර" සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කිරීම.
  - ✓ "රජයේ ආයතන ඇතුළුව ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමාණ බිල්පත් වල සහ අනෙකුත් අදාළ වැඩ කොන්ත්‍රාත්තු ලේඛනවල "ගංගා වැලි" (River Sand) යන යෙදුම "සියුම් සමාහාරක (Fine Aggregate)" යන යෙදුමෙන් ප්‍රතිස්ථාපනය කිරීම මඟින් "ගංගා වැලි සඳහා විකල්ප ද්‍රව්‍ය භාවිතා කිරීමට ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන ඉල්ලීම" මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කිරීම.

* ඉන්දියානු සහ ශ්‍රී ලංකා රාජ්‍යයන්හි මූල්‍ය පහසුකම් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන පුජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ඇත.
* ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදුකරන කොන්ක්‍රීට් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියට අදාලව රුපියල් මිලියන 100ක වැඩ කටයුතු අවසන් කර ඇත.
* අමාත්‍යාංශයේ පාලන, ඉඩම් හා ප්‍රතිපත්ති අංශවලට අදාළ කාර්යාල වෙන් කිරීම් කටයුතු කර ඇත.
* නිපුණතාවයක් ඇති ශ්‍රී ලාංකිකයන්ට අගතියක් නොවන පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාවයක් සහිත විදේශීය පුද්ගලයින් සඳහා වීසා බලපත්‍රයක් ලබාගැනීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ 163ක් ලබා දීම.

2.13.2. 2026 ඉදිරි දැක්ම

* රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC), ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA), ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම (OVDC) හා සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව (BMC) යන ආයතන සමග මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවා සාකච්ඡා කිරීම තුළින් සෑම ආයතනයක්ම විධිමත් පරිදි ලාභ ලබන ආයතන ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය අමාත්‍යාංශ දායකත්වය ලබා දීම.
* උක්ත ආයතන මඟින් සිදුකරන කාර්යන් ඉටු කිරීමේදී අවශ්‍යතාවය අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
* අංශයට අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.
* අංශයට අදාළ පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම.
* නිපුණතාවයක් ඇති ශ්‍රී ලාංකිකයන්ට අගතියක් නොවන පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාවයක් සහිත විදේශීය පුද්ගලයින් සඳහා වීසා බලපත්‍රයක් ලබාගැනීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබාදීම.
* දිවිවා සුළි කුණාටුවෙන් හානියට පත් නිවාස වෙනුවෙන් මහල් නිවාස ව්‍යාපෘති මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීම.

* අමාත්‍යාංශ කාර්යය මණ්ඩලය වෙනුවෙන් කාර්යාල වෙන්කිරීම් හා කාර්යාලීය අලුත්වැඩියා කටයුතු කිරීම.
* ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදුකරන කොන්ක්‍රීට් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කිරීම.

2.14. ඉංජිනේරු සේවා අංශය

2.14.1. 2025 ප්‍රගතිය

* 2025 වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති 32ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සඳහා මේ වන විට ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලබා දී ඇත.
* ස්ථාවර තාක්ෂණික කමිටුවට ඉදිරිපත් කෙරෙන ව්‍යාපෘති සඳහා අනුගමනය කරනු ලබන මාර්ගෝපදේශය, සිදුකරන ලද සංශෝධන සමඟ නැවත සියලුම අමාත්‍යාංශ හා රාජ්‍ය කොන්ත්‍රාත් ආයතන වෙත ලබා දී ඇත.
* 2025 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල මිල විචලනයන් 03ක් වන අතර කොන්ත්‍රාත් මිල විචලනයන් 02ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර, අනෙක් කොන්ත්‍රාත් මිල විචලනය සඳහා උපකාරක ලේඛන කැඳවා ඇත.
* රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය උපදෙස්, නිර්දේශ වශයෙන් අමාත්‍යාංශ මට්ටමින් ලබාදීමට අදාළ කටයුතු සිදුකිරීම හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබාදීම සිදුකර ඇත.
* ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය උපදෙස්, නිර්දේශ වශයෙන් අමාත්‍යාංශ මට්ටමින් ලබාදීමට අදාළ කටයුතු සිදුකිරීම හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබා දීම සිදුකර ඇත.
* ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙහි ගොඩනැගිලි උප ලේඛනය (Building Schedule of Rates) මධ්‍යම රජයට අයත් ආයතනයන්හි ගොඩනැගිලි ආශ්‍රිත ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමට යොදා ගැනීම සම්බන්ධව සොයා බැලීමට පත්කරන ලද කමිටුවෙහි සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී.

2.14.2. ඉදිරි දැක්ම

* ස්ථාවර තාක්ෂණ කමිටුව මඟින් රජයේ සියලු ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රමාණ පත්‍රිකා වල මිල ගණන් අවසරලත් සීමාවන් තුළ ඇත්දැයි පරීක්ෂා කිරීමේදී නව්‍යකරණයට ලක් වෙමින්, ව්‍යුහාත්මක ප්‍රගතිදායක සැලැස්මක් අනුව රජයේ ඉදිකිරීම් අංශයෙහි අතිරේකව වැයවන මූල්‍ය පිරිවැය කළමනාකරණයට අවශ්‍ය සහාය ලබාදීම.

* තාක්ෂණික මෙන්ම පාලනමය, සංවර්ධන සහාය සඳහා මඟ පෙන්වීම ලබාදීම තුළින් ජාතික ආර්ථිකය ගොඩනැංවීමට අවශ්‍ය රුකුල මෙම ආයතන ඔස්සේ ලබාදීමට, විදේශ විනිමය රට තුළට ලබා ගැනීමට මෙන්ම ජාතිකමය වශයෙන් තාක්ෂණික සහ ඉංජිනේරු වශයෙන් ජාතික සම්පත් සුරක්ෂිත කිරීම තුළින් රාජ්‍ය අංශය ඔස්සේ අතිරේකව වැයවන පිරිවැය, මූල්‍යමය ශක්තීන් ඉතිරි කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති යාවත්කාලීන කිරීමට මඟ පෙන්වීම.

* රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවෙහි ඉදිරි ක්‍රියාකාරී යාන්ත්‍රණයට අවශ්‍ය සහ අමාත්‍යාංශ මට්ටමෙන් අවශ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම ඇතුළු සම්බන්ධීකරණ සහාය දැක්වීම.

* ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාකාරීත්වයට සහ අමාත්‍යාංශ මට්ටමෙන් අවශ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම ඇතුළු සම්බන්ධීකරණ සහාය ලබා දීම.

* ඉංජිනේරු සේවා අංශයට අමාත්‍යාංශය යටතේ පැවරී ඇති සියලු කාර්යය භාරයන් ආවරණය කිරීම හා ඉලක්ක සපුරා ගැනීම ඉටුවන ලෙස අංශයට අදාලව නියමිත පරිදි අවශ්‍ය පියවර ගැනීම.

2.15. ඉදිකිරීම් ප්‍රතිපත්ති අංශය

2.15.1. 2025 ප්‍රගතිය

* 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග 15ක් සහ රීති 9ක් අනුමත කළ යුතුව ඇත. එයින් නියෝග 13ක් ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගෙන ඇති අතර, රීති 7ක් ගැසට් පත්‍රයේ පළකර ඇත. තවදුරටත් පළකිරීමට ඇති නියෝග 2ක් සහ රීති දෙකක් පළකිරීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී.

* එයට අමතරව, මේ වන විට පළකර ඇති නියෝග 2ක් සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙම වර්ෂය තුළ සිදුකරන ලදි. එම නියෝග ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තුව මඟින් අනුමත කරගැනීම මෙම වසර තුළ සිදුකර ඇත.

* ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය සංශෝධනය සඳහා කෙටුම්පතක් සකස්කර ඇති අතර, එයට තවදුරටත් අවශ්‍ය වන සංශෝධන ඇතුළත් කර ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශන සභාවෙන් අනුමැතිය ලබාගැනීමෙන් පසු, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතය.

* ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතන නීතිය සංශෝධනය සඳහා පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, එය මේ වන විට ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත. එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීමට කටයුතු කරමින් පවතී.

* ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමඟ නිරන්තර සාකච්ඡා පවත්වන ලද අතර, එමඟින් යෝජනා වූ, ඉදිකිරීම් කර්මාන්තය වෙත කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ බලපෑම් අවම කිරීම සඳහා වන යෝජනා ඇතුළත්, අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවය සහ එහි සඳහන් එක් එක් යෝජනා අධ්‍යයනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි. එම කමිටුව සඳහා අවශ්‍ය තාක්ෂණික නිර්දේශ ලබාදීම මෙම අංශය මඟින් සිදුකර ඇත. කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඇතුළත් වාර්තාව ලැබී ඇති අතර, එය සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී.

* මීට අමතරව මෙම වසර තුළ ද අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් පිළිබඳ ආරවුල් පිළිබඳ පැමිණිලි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ අදාළ ආයතන වෙත යොමුකර ඒ පිළිබඳ මැදිහත්වීම සිදුකරන ලද අතර, ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන මඟින්, නිරතුරුව ඉදිරිපත් කරනු ලබන ගැටළු සඳහා අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය කර විසඳුම් ලබාදීම සිදුකරන ලදී.

* ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තාක්ෂණික වශයෙන් අධීක්ෂණය කිරීම සහ එහි කටයුතු සඳහා තාක්ෂණික වශයෙන් අවශ්‍ය වන සම්බන්ධීකරණ කටයුතු සහ මහපෙන්වීම මෙම වසර තුළද ලබාදෙන ලදි.

2.15.2. ඉදිරි දැක්ම

* ඉදිකිරීම් සම්බන්ධ උපදේශක සභාවේ රැස්වීම්, සෑම කාර්තුවක් සඳහාම පවත්වා ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධ නිර්දේශ ලබා ගැනීම.
* නව ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය අනුමැතියෙන් පසු ප්‍රකාශයට පත්කිරීම.
* 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය සඳහා වන පනත් කෙටුම්පත අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
* ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතන නීතිය සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
* 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ තවදුරටත් අනුමත කර ගැනීමට ඇති නියෝග 2ක් සහ රීති 22ක් ගැසට් පත්‍රයේ පළකිරීම සහ නියෝග පාර්ලිමේන්තුව මඟින් සම්මත කර ගැනීම.
* ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තාක්ෂණික කාර්යයන් අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.
* ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව විවිධ පාර්ශව වලින් ඉදිරිපත් වන යෝජනා හා ගැටළු සම්බන්ධයෙන් අදාළ ආයතන අතර සම්බන්ධීකරණය සිදුකර විසඳුම් ලබාදීම.
* ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව විවිධ පාර්ශව වලින් ඉදිරිපත් වන යෝජනා හා ගැටලු සම්බන්ධයෙන් අදාළ ආයතන අතර සම්බන්ධීකරණය සිදුකර විසඳුම් ලබාදීම.
* ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන පුහුණු පාඨමාලා අමාත්‍යාංශය මට්ටමින් අධීක්ෂණය කිරීම.
* ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ කාර්යයන් අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.

2.16. වාස්තු විද්‍යා අංශය

2.16.1. 2025 ප්‍රගතිය

* මෙම අංශය 2025.11.14 දින සිට ස්ථාපිත වූ අතර අමාත්‍යාංශ විෂය පථය වෙනස් වීම නිසා අමාත්‍යාංශයේ සාමාන්‍ය පාලන අංශය හා ප්‍රතිපත්ති අංශය පළමු මහල තුළ ස්ථාපිත කිරීම 2025.11.14 – 2025.12.31 කාලය තුළ ඒ සඳහා අභ්‍යන්තර වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම හා ඉදිකිරීම සිදුකරන ලදී.
* දිට්වා ආපදාවෙන් විපතට පත් ජනතාව සඳහා වඩා සුවපහසු, ගුණාත්මක මහල් නිවාස ව්‍යාපෘති ඉදිකිරීමේ පූර්ව සැලසුම් සිදුකිරීම.

2.16.2. ඉදිරි දැක්ම

* දිට්වා ආපදාවෙන් විපතට පත් ජනතාව සඳහා වඩා සුවපහසු, ගුණාත්මක මහල් නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් සැලසුම්කරණය කිරීම/ ඉදිකිරීම් අධීක්ෂණය හා සම්බන්ධීකරණය සිදුකිරීම.
* නව නිවාස ව්‍යාපෘති සඳහා වන රජයේ ගොඩනැගිලි සඳහා අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සකස් කිරීම හා නිවාස, සැලසුම් ක්ෂේත්‍රයට අදාළ නීති රීති හා ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික යෝජනා ඉදිරිපත් කිරීම.
* අමාත්‍යාංශය තුළ අභ්‍යන්තර රාජකාරී කටයුතු කඩිනමින් පහසුවෙන් ඉටුකරගැනීම සඳහා එක් එක් ගොඩනැගිලි තුළ විසිරී ඇති අංශ එක් ගොඩනැගිල්ලක් තුළ ස්ථාපිත කිරීමට අවශ්‍ය සැලසුම් සිදුකිරීම.

පරිච්ඡේදය 3

2025 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය

3.1.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එසේ-එෆ්

නාගරික සංවර්ධන,ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	2024 රු.	
-	**ආදායම් ලැබීම**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එෆ්ජ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා චෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		48,067,236,348	14,529,527,754	එෆ්ජ-3
-	නැන්පතු		272,299,821	59,257,074	එෆ්ජ-4
-	අත්තිකාරම් ගිණුම්		42,300,858	29,530,657	එෆ්ජ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		3,469,560,566	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**51,851,397,593**	**14,618,315,485**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**51,851,397,593**	**14,618,315,485**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		242,497,264	154,784,650	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		51,608,900,330	14,463,530,835	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
621,766,000	වැටුප්, චේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	542,634,575	417,407,055	
619,122,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	426,629,604	416,193,786	එෆ්ජ-2(ii)
365,750,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	344,158,493	684,878,304	
-	පොළී ගෙවීම්	8	-	-	
500,000	චෙනත් පුනරාවර්තන වියදම්	9	-	170,000	
1,607,138,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,313,422,672**	**1,518,649,145**	
	මූලධන වියදම්				
1,358,410,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	737,603,218	25,280,307	
64,158,918,201	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	46,011,381,351	20,107,336,777	
16,981,368,286	ප්‍රාග්ධන මාරුකිරීම්	12	14,402,665,990	7,065,001,817	එෆ්ජ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,300,000	හැකියා වර්ධනය	14	644,977	814,150	
3,866,865,513	වෙනත් මූලධන වියදම්	15	2,375,998,791	9,097,382,644	
86,366,862,000	**මුළු මූලධන වියදම් (උ)**		**63,528,294,327**	**36,295,815,695**	
	නැන්පතු ගෙවීම්		425,576,011	627,198,895	එෆ්ජ-4
	අත්තිකාරම් ගෙවීම්		65,461,932	30,873,129	එෆ්ජ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		491,037,943	658,072,024	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		65,332,754,942	38,472,536,864	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(13,723,854,612)	(24,009,006,029)	
	අග්‍රිම ඇලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(13,723,854,612)	(24,010,098,638)	එෆ්ජ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	1,092,609	එෆ්ජ-3
			(13,723,854,612)	(24,009,006,029)	

3.1.2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	92,575,793,482	47,427,178,360
කෙරිගෙන යන වැඩ		70,914,058,245	57,232,291,859
අස්පෘශ්‍ය වත්කම්		34,257,050	6,787,950
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	1,029,014,703	518,810,880
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	1,092,609.00
මුළු වත්කම්		**164,553,123,480**	**105,186,161,658**
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		-956,137,599	-1,131,780,603
දේපළ පිරියත හා උපකරණ සංචිතය		92,575,793,482	47,427,178,360
කෙරිගෙන යන වැඩ		70,914,058,245	57,232,291,859
අස්පෘශ්‍ය වත්කම්		34,257,050	6,787,950
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	939,354,469	452,311,720
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,045,797,833	1,198,279,763
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	1,092,609
මුළු වගකීම්		**164,553,123,480**	**105,186,161,658**

පිටු අංක 08 සිට 106 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 107 සිට 125 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 සහ 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 10/4/2026	දිනය :	දිනය : 10/4/2026
ඉංජි. එල්.බී. කුමුදු ලාල්		පී. සුබ්‍රමනියම්
ලේකම්		ප්‍රධාන මූල්‍ය නිලධාරි
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය		නිවාස හා ඉදිකිරීම් අංශය
12 වන මහල, "සෙත්සිරිපාය", අදියර-II		නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය
බත්තරමුල්ල.		02 වන මහල, "සෙත්සිරිපාය" (අදියර I)
		බත්තරමුල්ල.

2

3.1.3. මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිස්-සී

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

		රුපියල්	
		2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
මූල බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		438,640,081	446,915,191
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්			-
අග්‍රිම ලැබීම්		48,067,236,348	14,529,527,754
අත්තිකාරම් අයකර ගැනීම්		82,337,150	25,311,129
තැන්පතු ලැබීම්		272,299,821	59,257,074
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		48,860,513,400	15,061,011,147
අඩුකළා : මුදල් වැය කිරීම්			
සුදුගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		966,618,284	830,579,992
සහනාධාර සහ මාරුකිරීම්		2,935,278	13,188,055
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්		13,916,120,534	5,190,099,274
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	*	387,901,367	103,899,511
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		242,497,264	154,784,650
අත්තිකාරම් ගෙවීම්		93,414,055	31,004,461
තැන්පතු ගෙවීම්		425,576,011	627,198,895
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		16,035,062,793	6,950,754,837
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		32,825,450,607	8,110,256,310
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පොළී		-	-
ලාභාංශ		-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්		36,295,011,173	10,944,783,288
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		36,295,011,173	10,944,783,288
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)		(36,295,011,173)	(10,944,783,288)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		(3,469,560,566)	(2,834,526,978)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
දේශීය ණය ගැනීම්			-
විදේශීය ණය ගැනීම්			
ප්‍රදානයන් ලැබීම්		3,469,560,566	2,835,619,587
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)		3,469,560,566	2,835,619,587
අඩුකළා : මුදල් වැය කිරීම්			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඵ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(ඵ)		3,469,560,566	2,835,619,587
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)		-	1,092,609
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය			-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	1,092,609

* වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද මුළු වියදම් රු. 387,909,523 කි. මෙහි 2024 වර්ෂයේ මැතිවරණ වෙවීම් සඳහා මැතිවරණ කාර්යාලයෙන් ලැබිය යුතු අත්තිදුල් රු. 8156 ක් වෙතුවට වැය ශීර්ෂය මගින් ප්‍රතිපාදන නිදහස් කිරීම් හේතුවෙන් ඇති වූ විවිධාකමේ ඇතුලත්ය. එබැවින් 2025 වර්ෂයේ අත්තිදුල් මගින් වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම් රු. 387,901,367 ක් ලෙස ගැලපීම් කර ඇත. (387,909,523 - 8156 = 387,901,367)

3.1. 4.මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

භූවමාරු හා භූවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතී නම්) උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු) (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන(රු) (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (රු) (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (රු) (4)=(1)+(2)+(3)	මුළු වියදම (රු) (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (රු) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	1,275,000,000	-	-27,862,000	1,247,138,000	972,199,457	274,938,543
	(2) ප්‍රාග්ධන	86,000,000	-	27,862,000	113,862,000	82,010,981	31,851,019
	උප එකතුව	1,361,000,000	-	-	1,361,000,000	1,054,210,438	306,789,562
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	360,000,000	-	-	360,000,000	341,223,214	18,776,786
	(2) ප්‍රාග්ධන	98,253,000,000	12,000,000,000	10,600,626,026 10,600,626,026	86,253,000,000	63,446,283,347	22,806,716,653
	උප එකතුව	98,613,000,000	12,000,000,000	-	86,613,000,000	63,787,506,561	22,825,493,439
	මුළු එකතුව	99,974,000,000	12,000,000,000	-	87,974,000,000	64,841,716,999	23,132,283,001

3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

අදාළ නොවේ.

3.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	**2025.12.31** දිනට තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම (රු. ,000)
9152	යන්ත්‍රෝපකරණ	97,130,169.37	97,130,169.37	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	31,787,949.60	31,787,949.60	-	-

3.5. විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමුණුම I ලෙස ඇතුළත් කර ඇත.

පරිච්ඡේදය 4
කාර්යසාධන දර්ශක

4.1 අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිත දර්ශක	අපේක්ෂිත ප්‍රතිඵලයෙහි ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
1	දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමකම එක් අඩු ආදායම්ලාභී පවුලක් සඳහා වාර්ෂිකව නව නිවසක් බැගින් ඉදිකිරීම. ‘‘තමන්ගෙම තැනක් ලස්සන ජීවිතයක් ‘‘වැඩසටහන යටතේ ඉලක්කය නිවාස 3920කි. ප්‍රගතිය - නිවාස 2682ක වැඩ අවසන් කර ඇත.) සැමට සෙවණ ආධාර යටතේ 2015- 2019 කාල පරිච්ඡේදයේදී ආරම්භ කළ නිවාස අවිච්ඡේද නිවාස 740කින් නිවාස 405ක වැඩ නිම කර ඇත.			√
2	උතුරු හා නැගෙනහිර අවතැන් වූ පවුල් සඳහා පදිංචියට භාරදී ඇති නිවාස ගණන (2025 ඉලක්කය නිවාස 2167කි. නිමි නිවාස - 2,041, ප්‍රගතිය 94% කි	√		
3	අදාළ නීති රීති හා ප්‍රමිතීන් වලට අනුව ඉදිකිරීම් කර්මාන්තකරුවන් ලියාපදිංචි කිරීම හා ශ්‍රේණිගත කිරීම. (වර්ෂය තුල ඉලක්කය -1000 / ප්‍රගතිය - 276)			√
4	ඉදිකිරීම් ක්‍රොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම (වර්ෂය තුල ඉලක්කය - 4000 / ප්‍රගතිය -5599)	√		
5	බිම් වෙඩි ඉවත් කිරීම මඟින් නිසැක කළ බිම් ප්‍රමාණය (2025 ඉලක්කය වර්ගකිලෝමීටර් 5.0කි, ප්‍රගතිය ව.කි.මී 4.95)කි. ප්‍රගතිය 99%කි.	√		
6	උතුරු හා නැගෙනහිර පළාත් වල පානීය ජල සම්බන්ධතා හා ගෘහස්ථ විදුලි සම්බන්ධතා (2025 ඉලක්කය 8179කි. සම්පූර්ණ කරන ලද ඒකක ගනන 7894 ක් වන අතර ප්‍රගතිය 96.5%කි.	√		
7	ගෘහස්ථ නල මාර්ග ජල සැපයුම් ආවරණය වැඩි කිරීම (ප්‍රගතිය 71.67%)			√
8	නල මලාපවහන පහසුකම් ආවරණය වැඩි කිරීම *(ප්‍රගතිය 124%)*	√		
9	ආදායම් නොලබන ජල සැපයුම අඩු කිරීම *(ප්‍රගතිය 94.07%)*	√		

පරිච්ඡේදය 5
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

11 - නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම

06 - සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම.

07 - ගෘහස්ථ විදුලි පහසුකම් ලබාදීම

16 - බිම් වෙඩි නිසැක කිරීම

ඉලක්කය/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75%- 100%
2030 වන විට සියලු දෙනාට ප්‍රමාණවත්, ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම.	"තමන්ගෙම තැනක් ලස්සන ජීවිතයක්" යටතේ 2025 වසරේ නිවාස 3920ක් ඉදිකිරීම.	නිවාස 2682ක වැඩ නිම කිරීම		√	
	උතුරු හා නැගෙනහිර පළාත් වල ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් සඳහා නිවාස ලබාදීම.(ඉලක්කය - 2167)	2041 නිවාස ඉදිකිරීම			√
බිම් වෙඩි නිසැක කිරීම	5 sqkm	4.95sqkm බිම්බෝම්බ ඉවත් කර ඇත.			√
ගෘහස්ථ විදුලි පහසුකම් ලබාදීම	අවතැන් වූ පවුල් සඳහා සුභසාධන හා යටිතල පහසුකම් සංවර්ධනය (ඉලක්කය - 8179)	8149 (යටිතල (පහසුකම් සංවර්ධන ව්‍යාපෘති)			√

ඉලක්කය/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75%- 100%
2030 වන විට සැමට ආරක්ෂිත පානීය ජලය ලබා දීම	ආරක්ෂිත පානීය ජල සේවා සඳහා ප්‍රවේශය ඇති ජනගහනයේ අනුපාතය	100 %			√ ****
	නල ජල සැපයුම් ආවරණය ජනගහනයේ අනුපාතය	80%		√ ***	
2030 වන විට සැමට ආරක්ෂිත පානීය ජලය ලබා දීම	ආරක්ෂිතව කළමනාකරණය කරන ලද පානීය ජල සේවා භාවිතා කරන ජනගහණයේ අනුපාතය	60%	√ **		
2030 වන විට සැමට ආරක්ෂිත සනීපාරක්ෂක පහසුකම් සැලසීම	වැඩි දියුණු කළ සනීපාරක්ෂක පහසුකම් භාවිතා කරන ජනගහනයේ අනුපාතය	100 %			√ *
	ආරක්ෂිතව කළමනාකරණය කල සනීපාරක්ෂක පහසුකම් භාවිතා කරන ජනගහනයේ අනුපාතය	40%	√ *		

මූලාශ්‍රය - *. ගෘහස්ථ ආදායම් සහ වියදම් සමීක්ෂණය - **2019**
. ගෘහස්ථ පානීය ජලයේ ගුණාත්මකතාව පිළිබඳ සමීක්ෂණය - **2021
***. ජල නල සැපයීම් ආවරණය - ජාතික ජල සම්පාදන මණ්ඩලය
****.ජන හා නිවාස සංගණනය - **2024**
} ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1. අවතැන්වූවන් නැවත පදිංචිකිරීම් වැඩසටහන

ජයග්‍රහණ

* 2025.12.31 දින වන විට නිවාස 2,041 ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම අවසන් කිරීම.
* බිම්වෙඩි නිසැක කර නිදහස් කර ඇති භූමි ප්‍රමාණය වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්කය දක්වා ප්‍රගතිය අත්පත් කර ගැනීම.
* උතුරු හා නැගෙනහිර පළාත්වල පවුල් 5,389කට ජල සම්බන්ධතා ලබාදීම හා පවුල් 2,669කට ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබාදීම සහ දිස්ත්‍රික්කයන් 08හි නැවත පදිංචිකල ප්‍රදේශවල අභ්‍යන්තර මාර්ග 179ක ඉදිකිරීම් අවසන්කර ඇත.
* 2025 වර්ෂය තුළ යාපනය දිස්ත්‍රික්කයේ තවදුරටත් නිදහස් කිරීමට ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 57.77ක ප්‍රමාණයක් නිදහස් කිරීමට හැකි විය.

අභියෝග

* ඉදිකිරීම් පිරිවැය අධික ලෙස ඉහල යාම, අඩු ආදායම්ලාභී පවුල් වල ක්‍රය ශක්තිය සීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීම සහ රජය මඟින් ලබාදිය හැකි සහනාධාර අවමවීම තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට විශාල බාධාවක් වී ඇත.
* අවතැන් වූ පවුල් සඳහා වූ ස්ථිර නිවාස ඉදිකිරීමේ දී සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී වර්ෂය අවසාන කාර්තුවේ දී දිට්වා සුළි කුණාටුව හේතුවෙන් අදාළ ව්‍යාපෘති අඛණ්ඩව සිදුකිරීම අපහසු කාර්යයක් විය.
* අවතැන් වූ පවුල් සඳහා වූ ස්ථිර නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් විසින්ම ඉදිකරනු ලබන පදනම මත (Owner Driven) ක්‍රියාත්මක වන බැවින් ප්‍රතිලාභීන්ට ඉහළ දායකත්වයක් දැරීමට සිදුව ඇත. එම ප්‍රතිලාභීන් අඩු ආදායම්ලාභී පවුල්ද වන බැවින් පසුගිය කාල වකවානුවේ දී අඛණ්ඩව නිවාස ඉදිකිරීමේ අමුද්‍රව්‍ය පිරිවැය ඉහළයාම හේතුවෙන් මෙම නිවාස ඉදිකරගැනීමේ දී අපහසුතාවයන්ට මුහුණදීමට සිදුවිය.

5.2.2. ජලසම්පාදන අංශය

ජයග්‍රහණ

* 2025 වසර තුළ ගෘහස්ත නව ජල නල සම්බන්ධතා 92,837ක් ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් ද, ගෘහස්ත නව ජල නල සම්බන්ධතා 1,889ක් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් ද වන පරිදි මුළු ගෘහස්ත නව ජල නල සම්බන්ධතා 94,726ක් ලබා දී ඇත. 2025 වර්ෂය තුළ ආරක්ෂිත පානීය නල ජල ආවරණය 62.3කි.

පරිච්ඡේදය 6
මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ 2025.12.31 දිනට සේවා ගණයන් අනුව අනුමත කාර්යය මණ්ඩලය හා ඊට එදිරිව සත්‍ය සේවා නියුක්තිය දැක්වෙන සාරාංශය පහත පරිදි වේ.

සේවා ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	115	81	34
තෘතීය	13	05	08
ද්විතීයික	417	394	23
ප්‍රාථමික	140	99	41
එකතුව	**685**	**579**	**106**

මෙම තොරතුරු පෙර පැවති නාගරික සංවර්ධන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශයට අදාළ වේ. එම පවතින කාර්යය මණ්ඩලයෙන් පහත වගුව මඟින් නිරූපණය කරන සේවක පිරිසක් ප්‍රවාහන මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අංශයට අනුයුක්ත විය.

සේවක මට්ටම	නාගරික සංවර්ධන අංශය වෙත අනුයුක්ත කරන ලද නිළධාරීන් ගණන
ජ්‍යෙෂ්ඨ	53
තෘතීය	03
ද්විතීයික	165
ප්‍රාථමික	49
එකතුව	270

6.2. කාර්යය මණ්ඩල හිඟය අමාත්‍යාංශයේ කාර්යසාධනයට බලපාන ආකාරය

අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතිය ද, දැනට සිටින කාර්යය මණ්ඩලය කාර්යාල වේලාවෙන් බැහැරව සේවාවේ යොදාගැනීම මඟින් කාර්යසාධනය ප්‍රශස්ත ලෙස රඳවා ගැනීමට කටයුතු කර ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

2025 වසර නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය ලෙස එක්ව කටයුතු කළ බැවින් මානව සම්පත් සංවර්ධනයට අදාළ තොරතුරු ඇමුණුම 01හි ඉදිරිපත් කරනු ලබන නාගරික සංවර්ධන විෂයට අදාළව සකස් කරන ලද කාර්ය සාධන වාර්තාවේ ඇතුළත් වේ.

පරිච්ඡේදය 7
අනුකූලතා වාර්තාව

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාල නැත	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාල නැත	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාල නැත	
1.6	වෙනත්			
02	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලු මාසික ගිණුම් සාරාංශ (CIAS) පිළියෙල කර නියමිත දිනට මහභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
05	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම	අනුකූල නොවේ	සමහර විගණන විමසුම් සඳහා විගණකාධිපතිවරයා නියම කර ඇති දිනයට අතුරු පිළිතුරු යවන අතර සම්පූර්ණ පිළිතුර පසුව යැවීම සිදුවේ	
06	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	මෙම වර්ෂය තුළ අපහරණය කිරීම	

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	දැනට ක්‍රියාත්මක වෙමින් පවතී	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම්			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල නොවේ	අදාළ නොවේ	

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකොට තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා ඵල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		

අ.අ	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HUD/D/MUDC&H/FS/01/2025/98

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 ජූලි 10 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.8 ඡේදය ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් යටතේ දැක්විය යුතු මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම රු.36,309,702,277ක් වූවද එම වටිනාකම රු.36,295,011,173 ක් ලෙස රු.14,691,104 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) නාගරික පුනර්ජීවන වැඩසටහනට සහයවීමේ ව්‍යාපෘතිය (SCURP) විසින් ඉදිරිපත් කරන ලද 2025 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් වියදම සමග අමාත්‍යාංශයේ වියදම් ප්‍රකාශන සැසඳීමේදී රු. 2,805,880 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

2023 මාර්තු 09 දින නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබූ පිරිවැය රු.10,200,000 ක් වූ වාහන 03 ක් අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලෙස තවදුරටත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.6.3 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

අමාත්‍යාංශයේ කුලීවැඩ හා අත්තිකාරම් ලේඛනයට අනුව අත්තිකාරම් 18 කට අදාළව රු.278,300,534 ක ශේෂයක් පැවතියද භාණ්ඩාගාරයේ SA-90 ප්‍රකාශයේ එම තොරතුරු වාර්තා කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය වෙනුවෙන් අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම (සටහන 11) සඳහා මු.රෙ. 208 මඟින් රු.9,716,370,177ක් අමාත්‍යාංශ වැය ශීර්ෂයට හර කර තිබුණි. එම වටිනාකම් සමස්ථ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදමින් සියයට 21 ක් විය. නමුත් එම වියදම් සනාථ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද සාරාංශ වාර්තා මඟින් හෙළිදරවු නොකිරීමෙන් එම වියදම් සත්‍යාපනය කළ නොහැකි වූ අතර එමඟින් ජනිත වූ වත්කම් හඳුනාගැනීමටද නොහැකි විය.

(ආ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දැක්වෙන රු. 25,569,893,157ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගැනීම්, රු. 25,442,304,453 ක් වටිනා ස්ථාවර වත්කම් අපහරණය කිරීම් ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය උපලේඛණ විගණන කටයුතු සඳහා ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඇ) මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.70,914,058,245 ක කෙරීගෙන යන වැඩ ශේෂය සනාථ කිරීම සඳහා අවශ්‍ය උපලේඛණ විගණන කටයුතු සඳහා ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
3.2 ඡේදය	මු.රෙ. ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කර නොතිබීම.	3.1 ඡේදය

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 50 (ii)සිට (iv) දක්වා ඇතුළත් රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු, සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව, හැකිතාක් දුරට සම්පූර්ණයෙන්, නිවැරදිව පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරියා වගබලා ගත යුතුය. නමුත් අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන පරිදි වියදම් ඇස්තමේන්තු සැකසීමේදී අධි සහ ඌන ප්‍රතිපාදන සිදුකළ අවස්ථා පැවතුණි. එබැවින් වාර්ෂික අයවැය ලේඛන සකස්කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුවී නොතිබුණි.

(අ) පුනරාවර්තන වැය විෂයන් 08 ක් වෙත වෙන්කරන ලද එකතුව රු.8,020,000 ක් සහ ප්‍රාග්ධන වැයවිෂයන් 21 ක් වෙත වෙන් කරන ලද එකතුව රු.9,995,720,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණු අතර ඒවායින් වැය විෂයයන් 02 ක් වෙත ප්‍රතිපාදනය කරන ලද රු.9,000,000 ක් සම්පූර්ණයෙන්ම සහ තවත් වැයවිෂයයන් 05 ක් වෙත වෙන්කරන ලද මුදලින් සියයට 50 ට වැඩි ප්‍රමාණයක් මු.රෙ.66 යටතේ වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ආ) 2025 වාර්ෂික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන් නොකළ වැය විෂයයන් 10 ක් වෙත පසුව මු. රෙ. 66 යටතේ රු. 12,605,243,373 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ක ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ නිවාස 600 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙත මු.රෙ.66 මඟින් රු. 4,300,000 ක මුදලක් මාරු කරගෙන තිබුණද එම මුළු ප්‍රතිපාදනයම් ඉතිරිවී තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 211 ප්‍රකාරව සියලුම බැරකම් සිදුවූ වහාම සටහන් කර ගත යුතු අතර බැරකම් පිළිබඳ සටහන් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ. එමෙන්ම 2017 අප්‍රේල් 27 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 255/2017 දරන චක්‍රලේඛයේ (2) (අ) (ආ) සහ 03 වගන්තීන් ප්‍රකාරව බැඳීම් හා බැරකම් හඳුනා ගත යුතු අතර එම බැඳීම් හා බැරකම් CIGAS වැඩසටහනට ඇතුලත් කිරීමට පියවර ගත යුතු වුවද පහත දැක්වෙන බැරකම් පිළිබඳ විස්තර CIGAS වැඩසටහනේ බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි.

(i) අමාත්‍යාංශයේ ජල අංශයේ 2025 වර්ෂයට අදාල රු.77,750,889 ක බැරකම් අයිතම 14 ක් බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි.

(ii) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය දැක්වීමේ ව්‍යාපෘතියේ (SCURP) 2025 වාර්ෂික ගිණුම් ප්‍රකාශනය අනුව අමාත්‍යාංශයෙන් ලැබිය යුතු එකතුව රු.138,232,078 ක ශේෂයක් දක්වා තිබුණද එය අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(iii) අනුරාධපුර උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ (AIUDP) 2025 වාර්ෂික ගිණුම් ප්‍රකාශනය අනුව අමාත්‍යාංශයෙන් ලැබිය යුතු එකතුව රු. 94,025,726 ක ශේෂයක් දක්වා තිබුණද එය අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(iv) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත අමාත්‍යාංශයෙන් ලැබිය යුතු එකතුව රු.555,918,448 ක ශේෂයක් දක්වා තිබුණද එය අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල කටයුතු කර නොතිබුණි.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) XII පරිච්ඡේදයේ 1.7 ඡේදය	අනුමත කළ නිවාඩු රෙජිස්ටරයක් 190 වැනි පොදු ආකෘති පත්‍රය අනුව තබාගත යුතු වුව ද, 2024 හා 2025 වර්ෂවලට අදාලව නිලධාරීන් විසින් ලබාගෙන තිබුණු නිවාඩු අනුමත කර නිවාඩු ලේඛනයේ සටහන්කර නොතිබුණි. ඒ හේතුවෙන් වර්ෂය තුල නිවාඩු 45 ඉක්මවා නිවාඩු ලබාගෙන තිබුණු අතර ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිලධාරීන්ගේ අඩවැටුප් සහ පඩි රහිත නිවාඩු සඳහා රජයට අයවිය යුතු මුදල් අයකිරීම යාවත්කාලීනව සිදු කිරීමටද නොහැකිවී තිබුණි.
(ii) XII පරිච්ඡේදයේ 21.11 හා 22.4 ඡේද	අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අඩවැටුප් හා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර 96 වැනි පොදු ආකෘති පත්‍රයේ ලියා විගණකාධිපතිට මාස්පතා වාර්තා කළ යුතුය. නමුත් අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අඩවැටුප් හා වැටුප් රහිත නිවාඩු සම්බන්ධ තොරතුරු ඉහත ආකෘති පත්‍රය යටතේ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii)	XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	මියගිය , විශ්‍රාමගිය, සේවය අත්හැර ගිය ,ද්විතීක පදනම මත වෙනත් ආයතනවලට ගිය සහ වෙනත් හේතූන් නිසා අමාත්‍යාංශයෙන් පිටතට ගිය නිලධාරීන්ගෙන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,532,054 ක හිඟණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ණය ශේෂ අයනොවූ කාල පරාසය මාස 06 ත් අවුරුදු 03 ත් අතර විය.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**	
	මු.රෙ.104(4)	අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය වෙත ලබාදී තිබුණු රු.504,000 ක් වටිනා කැමරා උපකරණය 2025 මාර්තු 14 දින අස්ථානගතවී තිබුණු නමුත් මු.රෙ.104(4) යටතේ අවසාන පරීක්ෂණ වාර්තාව 2026 අප්‍රේල් 30 දින වන විටද නිකුත් කර නොතිබීම හේතුවෙන් අලාභය අයකර ගැනීමට හෝ පොතෙන් කපා හැරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී පැවතුණි.
(ඇ)	**චක්‍රලේඛ විධිවිධාන**	
(i)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ	
a)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 12.1 ඡේදය	2024 නොවැම්බර් 25 දිනැති අංක 24/2/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව ජල සම්පාදන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධවීමේදී අතිරික්ත භාණ්ඩ හඳුනාගැනීම සඳහා මු.රෙ.756(4) ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩලයක් පත්නොකර ජල සම්පාදන අමාත්‍යාංශයේ පැවති රු.9,185,738 ක් වටිනා අතිරික්ත කාර්යාල උපකරණ වෙනත් රාජ්‍ය ආයතනවලට පවරා දී තිබුණි.

b)	2024 මැයි 29 දිනැති අංක 02/2024 දරන, 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02(ආ) ඡේදය	ජීප් රථයකට 2023 දෙසැම්බර් මස අවස්ථා දෙකකදී සිදුවූ අනතුරුවලින් සිදු වූ හානි 2024 අගෝස්තු 27 දින රු.1,817,070 ක් හා 2025 ඔක්තෝම්බර් 17 දින රු.585,363 ක් වැය කර අලුත්වැඩියා කර තිබුණි. මෙම මුදල රක්ෂණය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබූ අතර එම අලාභය ඊට සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii)	2024 දෙසැම්බර් 18 දිනැති අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 04(ii) ඡේදය	අමාත්‍යාංශය සතු ධාවන තත්වයේ නොතිබුණු වාහන 09 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(iii)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ආයතනයක කාර්යය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට පුහුණු අවස්ථාවන් ලැබෙන පරිදි මානව සම්පත් සංවර්ධන සැළැස්මක් පිලියෙල කර පුහුණු වැඩසටහන් සඳහා නිළධාරීන් සහභාගී කරවීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කල යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2025 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැළැස්මක් පිලියෙල නොකිරීම හේතුවෙන් විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රන සඳහා නිලධාරීන් තෝරාගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැති බැවින් අමාත්‍යාංශයේ ඉහළ තනතුරුවල සිටින සහ අදාල ක්ෂේත්‍රවලට කිසිදු සම්බන්ධතාවයක් නොමැති නිළධාරීන් අතලොස්සකට පමණක් විදේශීය පුහුණුව සඳහා ඉඩසළසා තිබුණි.
(vi)	2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 03 ඡේදය සහ 1994 අප්‍රේල් 20 දිනැති	ශ්‍රී ලංකා රජය වෙත වෙනත් රාජ්‍යයන්, විදේශ සංවර්ධන පාර්ශවකරුවන් හා විදේශ ආයතන විසින් ලබාදෙනු ලබන සියලුම විදේශ ප්‍රදානයන් හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගත යුතු වුවත්

රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ අංක 30/94	බිම්බෝම්බ ඉවත්කිරීමේ වැඩසටහන වෙත විදේශීය රටවලින් ලැබෙන අරමුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශය විසින් 2025 වාර්ෂික ඇස්තමේන්තු මගින් සියක් නගර සංවර්ධන වැඩසටහන් සඳහා රු.1,850,000,000 ක මුදලක් වෙන්කර තිබුණු අතර වර්ෂය තුල රු.712,498,502 ක වියදමක් දරා තිබුණි. නමුත් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළ රු. මිලියන 572,740,000ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත වැඩසටහන් 07 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණු අතර රු.617,000,000 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත සංවර්ධන වැඩසටහන් 04 ක භෞතික ප්‍රගතිය සියයට 1 ත් සියයට 15 ත් අතර ඉතා අඩු අගයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කල රු.129,000,000 ක් වටිනා ව්‍යාපෘති 05ක් වර්ෂය තුල සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු බවද රු.මි. 376,290,000 ක් වටිනා ව්‍යාපෘති 14 කගේ ප්‍රගතිය සියයට 14-60 අතර මන්දගාමී තත්වයේ පැවතුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගයෙන් තිරසර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් රු.100,000,000 ක් වෙන්කර තිබුණද ණයගිවිසුම අත්සන් කිරීමේ ප්‍රමාදය මත අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) සංචාරක ප්‍රවර්ධනය සහ නගර සන්නාමකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල අනුමැතීන් ලබාගැනීමේදී සිදුවූ ප්‍රමාදය මත 2025 වාර්ෂික අයවැය මගින් වෙන්කල රු.447,944,813 ක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) 2025 අයවැය යෝජනාවක් අනුව අනුරාධපුර සණ අපද්‍රව්‍ය බැහැර කිරීම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් රු.750,000,000 ක් වෙන්කලද ව්‍යාපාතියට අදාල දත්ත රැස්කිරීම,

සැළසුම්කරණය හා අනුමැතීන් ලැබීමේ ප්‍රමාදය මත එම ව්‍යාපෘතිය වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොනිබුණු අතර වර්ෂය තුළ රු.25,787,453 ක වියදමක් පමණක් දරා තිබුණු අතර ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

2021 වර්ෂයේදී ගම්පහ පැරණි පොදු වෙළඳපොළ ගොඩනැගිල්ල වෙනුවට මහල් හතරකින් යුතු නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද පසුව විෂයපථය සීමාකර මහල් තුනක් පමණක් ඉදිකිරීම සඳහා රු.356,330,559.81 (වැට් රහිත) ක වියදමක් දරා තිබුණි. නමුත් 2025 දෙසැම්බර් 31 වන විටද කාලදිගු 07 ක් ලබා දී තිබුණද එම මහල් තුනෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර භාරදී නොතිබුණි. තවද බිල්පත්වලට ගෙවීම් කිරීමේ ප්‍රමාදය මත රු.1,220,098 ක අමතර පොලී ගාස්තුවක්ද කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුව තිබුණි. තවද ගොඩනැගිලේ ඉදිකිරීම් නිමකර ලිඛිතව බාරදී නොතිබුණද, කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලය තුළ නිසිලෙස හඳුනාගැනීමෙන් තොරව, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත කොන්ත්‍රාත් ගිවිසුමට වගන්තියක් ඇතුලත් කර ගිවිසුම සංශෝධනය කර, 2025 ජූලි 31 දින සිට 2026 සැප්තැම්බර් 30 දින දක්වා වලංගුවන පරිදි ඇපකරයක් ලබාගෙන රු.19,376,034 ක් වූ (වැට් රහිත) සම්පූර්ණ රැඳවුම් මුදලම 2025 ජූලි 24 දින කොන්ත්‍රාත්කරුට නිදහස් කර තිබුණි.

තවද රු.7,866,637ක් වැයකර ඉදිකල තාවකාලික කඩපේලිය වෙත පාරිභෝගිකයින් නොපැමිණීම හේතුවෙන් වසා දමා තිබුණු බැවින් එම තාවකාලික කඩකාමර ඉදිකිරීම සඳහා වැයකල රු.7,866,637ක වියදමද ඵලදායී උපයෝජිත වියදමක් වී තිබුණි.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කළුතර පොදු වෙළඳපල සංකීර්ණය

(i) අමාත්‍යාංශය විසින් රු. 172,356,935 ක වියදමක් දරා ඉදිකරන ලද කළුතර පොදු වෙළඳපල සංකීර්ණය 2019 මාර්තු 05 දින කළුතර නගර සභාව වෙත පවරා දී තිබුණි. නමුත් එම කඩකාමර ඉතා සීමිත ඉඩ කඩක් සහිතව ඉදි කර තිබීම, ගොඩනැගිල්ල පාරිභෝගිකයින්ට පහසුවෙන් පිවිසීමට සහ එකවර දර්ශනය වන ආකාරයෙන් ඉදිකර නොතිබීම ආදී හේතු නිසා පාරිභෝගිකයින් නොපැමිණීම, ජල පහසුකම ලබා නොදීම, ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී මුහුදු සුළං හමන දිශාව කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ලේ වහලය කැඩී බිඳී ගොස් තිබීම සහ වැසි දිනවල ගොඩනැගිල්ල තුලට වැසි ජලය පැමිණීම සහ විදුලි සැපයුම සඳහා ඉදිකරන

ලද විදුලි මීටර් සොරුන් විසින් ගලවා ගෙන ගොස් තිබීම ආදී කරුණු හේතුවෙන් වෙළෙඳුන් විසින් ඒවායේ වෙළඳාම් කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් රු. 172,356,935 ක වියදමක් දරා ඉදිකර තිබුණු මෙම තෙමහල් ගොඩනැගිල්ලේ කඩ කාමරවලින් සියයට 95 ක් පමණ වසර 07ක පමණ කාලයක් වසා දමා නිෂ්කාර්යයව පැවතුණි.

(ii) ගොඩනැගිල්ලේ විදුලි සෝපානය ක්‍රියා විරහිත තත්වයේ පවතින බවද ගොඩනැගිල්ල සඳහා සුදුසු පරිදි ආරක්ෂාව සපයා නොමැති බැවින් ඇතැම් උපකරණ හා සවිකිරීම් සොරකම් කර තිබුණු බවද නිරීක්ෂණය විය.

(iii) තෙවන මහලේ ඉදි කර තිබූ රැස්වීම් ශාලාව කිසිදු අවශ්‍යතාවයකට යෝග්‍ය නොවීම මත කිසිදු පර්ශවයකට බදු පදනමින් හෝ ලබා දීමට නොහැකිවී තිබී ඇති අතර රු.2, 844,243 ක ඇස්තමේන්තුගත වියදමක් මත කළුතර නගර සභාව විසින් එහි ජල ටැංකිය හා සිවිලිම අලුත්වැඩියා කර රැස්වීම් ශාලාව වශයෙන් පවත්වා ගෙන යාමට කටයුතු කර තිබුණි.

(ආ) කළුතර දුම්රිය ස්ථානය හා බස්නැවතුම අතර වාණිජ සංවර්ධන ගොඩනැගිල්ල

(i) කළුතර දුම්රිය ස්ථානය හා බස්නැවතුම අතර වාණිජ සංවර්ධන ගොඩනැගිල්ල සැළසුම්කිරීම හා ඉදිකිරීම අදියර 04 ක් යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ 2016 වර්ෂයේදී ප්‍රදානයකර තිබුණු අතර අමාත්‍යාංශය විසින් ඒ සඳහා රු.230,534,871 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද කඩ කාමර 173 න් 150 ක් කඩහිමියන්ට පවරාදී තිබුණද, වෙළඳාමක් නොමැතිව පාඩු ලබන හෙයින් කුලී මුදල් ගෙවා ගත නොහැකිව වසා දමා තිබුණි. ඒ අනුව අදියර 4 ක් යටතේ රු.230,534,871ක් වැය කර ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකිවී තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම් කිරීමේදී වාහන නැවැත්වීම සඳහා පහසුකම් සලසා නොතිබුණු අතර ගොඩනැගිල්ල සඳහා ආරක්ෂක වැඩ පිළිවලක්ද ගොඩනැගිල්ල පිරිසිදු කිරීම් සඳහා වැඩපිළිවලක්ද සලසා නොතිබුණි.

(ii) උක්ත ව්‍යාපෘතියේ II සහ IV අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් වී වසර 02 ක්ද ඉක්මවූ පසු ඒවායේ ඇස්තමේන්තු හා මිල ගණන් සඳහා ස්ථාවර තාක්ෂණ කමිටු(STC) අනුමැතිය ලබා දී තිබුණි. ව්‍යාපෘතියේ අදියර II සඳහා වැඩ අවසන් වටිනාකමින් සියයට 90 ක් එනම් රු.65,941,794 ක් ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ගෙවා තිබුණු අතර ස්ථාවර තාක්ෂණ කමිටුව විසින් අනුමත කල මුදල රු. 56,244,684 ක්

වීමෙන් ආයතනය වෙත රු.11,151,676 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එම මුදලින් රු.5,261,916 ක් වසර 07 කට පසුව රුඳවුම් මුදල් නිදහස් කිරීමේදීද ඉතිරි රු. 5,889,760 ක මුදල අමාත්‍යාංශය විසින් එම ආයතනය වෙත ගෙවිය යුතුව තිබුණු වෙනත් මුදලකටද හිලවු කර තිබුණි.

(iii) ව්‍යාපෘතියේ IV වන අදියරය ඉදිකිරීම වෙනුවෙන් වැඩ අවසන් වටිනාකමින් සියයට 90ක් එනම් රු. 56,291,571 ක් ගෙවා තිබුණු නමුත් ස්ථාවර තාක්ෂණ කමිටුව විසින් අනුමත කර තිබුණේ රු.46,823,146 ක වැඩ වටිනාකමක් පමණි. ඒ අනුව රු.10,888,689 ක් අමාත්‍යාංශය විසින් වැඩිපුර ගෙවා තිබුණු අතර එම මුදලින් රු.5,066,433 ක් වසර 05කට පසුව රුඳවුම් මුදල් නිදහස් කිරීමේදී හිලවු කරගෙන තිබුණු අතර ඉතිරි රු.5,822,255 ක වටිනාකම එම ආයතනයට ගෙවිය යුතු වෙනත් මුදලකටද හිලවු කර තිබුණි. මිල රේටයන් සඳහා ස්ථාවර තාක්ෂණ කමිටු(STC) අනුමැතිය ව්‍යාපෘතිය ආරම්භයේදී ලබාගැනීම කෙරෙහි නිළධාරීන්ගේ අවධානය යොමු නොවීම හේතුවෙන් සංස්ථාව වෙත මෙලෙස වැඩිපුර රු.22,040,365 ක මුදලක් ගෙවීමට සිදුව තිබුණි.

(ඇ) 2025 වර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සැපයුම සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ වැසි ජලය එක්රැස් කිරීමේ වැඩසටහන සඳහා රු.මිලියන 50 ක් වෙන්කර තිබුණි. දිස්ත්‍රික්ක 11 ක පාසල් 95 කට හා වයඹ ජාතික විද්‍යාපීඨ 05 ක් වන සේ වැසි ජල ටැංකි 100 ක් මිලදී ගැනීම වෙනුවෙන් 2025 සැප්තැම්බර් මස පුද්ගලික සමාගමක් වෙත රු.7,337,240 ක් ගෙවීම් කර තිබුණි. නියැදි විගණන පරීක්ෂාවට අනුව බොහෝ ටැංකි වැසි ජලය හැර වෙනත් ක්‍රමවලින් ලබා ගන්නා ජලය ගබඩා කිරීමට භාවිතා කර තිබූ අතර වැසි ජලය ගබඩා කිරීමට සුදුසු පරිදි ස්ථාපිත කර නොමැති බැවින් හා වැසි ජලය එක්රැස් කර භාවිතා කිරීම පිළිබඳ පුහුණුවක් ලබාදී නොමැතිවීමෙන් බොහෝ ටැංකි භාවිතයට ගෙන නොතිබුණි. ලබාදුන් ටැංකි 24 ක් පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවට අනුව ඒම ටැංකි 24 ම වැසි ජලය ගබඩා කිරීමට භාවිතාකර නොතිබුණි. එමෙන්ම 2025 ජූලි 07 දිනැති අංක DEV/02/RWH/2025/01 දරන අධ්‍යක්ෂ (සංවර්ධන) ගේ ලිපිය මඟින් දක්වා ඇති පරිදි ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් නිළධාරීන් මඟින් වැසි ජලය රැස්කර ගැනීමට හා භාවිතයට අවශ්‍ය උපදෙස් ලබාදීම හා පසුවිපරම් නොකිරීමෙන් වර්ෂය තුළ රු.7,337,240 ක් වැයකර මිලදීගත් වැසිජල ටැංකිවලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. එමෙන්ම මෙම වැඩසටහන යටතේ තවත් දිස්ත්‍රික්ක 08 ක වැසි ජලය රැස්කිරීමේ පද්ධති 400 ක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 32 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2025 දෙසැම්බර් 31 වන විට ප්‍රගතිය සියයට 45 ක් පමණක් විය.

(ඇ) තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත වියදම රු.917,000,000 ක් වූ පිටිපන තලගල (අදියර 1) මාර්ගය හා බටහිර අන්තර් හුවමාරු මාර්ගය සංවර්ධන ව්‍යාපෘති සඳහා 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් රු. 1,369,210,000 ක් වැයකර තිබුණු අතර ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටලුවක් හේතුවෙන් මෙම මාර්ගයන්හි වැඩ අවසන් කිරීමට නොහැකිව ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. 2025 වර්ෂයේදීද අත්පත්කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමට රු.352,794,978 ක් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණද ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටලු තවදුරටත් පැවතීම හේතුවෙන් මාර්ගය ඉදිකිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට අමාත්‍යාංශයට නොහැකිවී තිබූ අතර මෙම ව්‍යාපෘති සඳහා දරන ලද වියදමද නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන 26 ක් එකම ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීමේ අරමුණින් පොළොන්නරුව මෙත්සිරිපාය පරිපාලන සංකීර්ණය සැළසුම්කර ඉදිකිරීමේ කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) වෙත රු.මිලියන 1,207 ක (බදු රහිත) වටිනාකමකට පවරා තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 15 දින ආරම්භ කර 2018 දෙසැම්බර් 15 දින නිම කිරීමට ගිවිසුම්ගත වී තිබුණි. ගොඩනැගිල්ලේ මහල් හතරක ඉදිකිරීම් කටයුතු පමණක් අවසන් කර 2020 ඔක්තෝබර් මස ඉදිකිරීම් කටයුතු අතරමග නතර කිරීමෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණු අතර ව්‍යාපෘතිය වෙනුවෙන් මෙතෙක් දරන ලද රු.මිලියන 1023 (බදු රහිත) ක එනම් සියයට 85 ක මුදලද නිෂ්ඵල වියදමක් වී තිබුණි.

තවද ඉතිරි වැඩ නිම කිරීම සඳහා සකසා තිබුණු රු.1,740,848,366ක (වැට් රහිත) සංශෝධිත ඇස්තමේන්තුව සඳහා 2025 දෙසැම්බර් 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබීමට පෙර 2025 සැප්තැම්බර් 29 දින රු.43,337,689.85ක (වැට් සහිත) අත්තිකාරම් මුදලක් අමාත්‍යාංශය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත ගෙවීමට කටයුතු කර තිබුණි. එමෙන්ම 2016-2018 කාලසීමාව තුල ගිවිසගත් පරිදි ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.485,276,223 ක එනම් මුල් මුලු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 39 ක විචලනයන් සඳහා නිර්දේශ ලබාදී තිබුණි. එය ප්‍රසම්පාදන අස්ථිත්වය හා රජය මත සුවිශාල වැයබරක් වන අතර මෙය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ කාර්යය පවරා තිබුණු නාගරික සංවර්ධන අධිකාරියේ සහ

අමාත්‍යාංශයේ වගකීම නිසි ලෙස ඉටුනොකිරීම නිසා රජයට දරන්නට සිදුවූ අමතර වැයබරක් වී තිබුණි.

මෙම ව්‍යාපෘතියේ වැඩ අතරමග නතර කල අවස්ථාව වන විට, සියළු වැඩ නිමකරන ලද මහල් 04 සම්බන්ධයෙන් විධිමත් භාර ගනීමක් සිදු නොකිරීම සහ ගොඩනැගිල්ලේ ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් යොදා නොමැතිවීම හේතුවෙන් ගොඩනැගිල්ලේ සවිකර තිබූ විද්‍යුත් හා සනීපාරක්ෂක උපාංග කිහිපයක් අස්ථානගතවී තිබුණද එම අලාභහානි සම්බන්ධයෙන් මු.රෙ.102,103 හා 104 ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (LRT) ආරම්භ කර වර්ෂ දෙකකට පසුව ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද 2020 සැප්තැම්බර් 21 දිනැති ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය පිරිවැය ඵලදායී නොවන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත් බව දක්වා තිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය ඒකපාර්ශවීයව අවසන් කර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින දක්වා මෙම ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම රු.මිලියන 5,978 ක් වී තිබුණි. එසේම, මෙම ව්‍යාපෘතිය ඒකපාර්ශවීයව අවසන් කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශක සමාගමට සිදුවූ අලාභය ආවරණය කර ගැනීම සඳහා ගිවිසුමේ 2.9.5 දරන වගන්තිය ප්‍රකාරව ඇ.ඩොලර් මිලියන 1.25 ක්, ජපන් යෙන් මිලියන 229.53 ක් සහ ශ්‍රී ලංකා රු.මිලියන 131.58 ක් ගෙවීමට සිදුව තිබුණු බැවින් මෙම සියළු වියදම් නිෂ්කාර්යය වියදම් බවට පත්වී තිබුණි.

ණය ගිවිසුම නීත්‍යානුකූලව අහෝසි කර නොතිබුණු බැවින් එම ණය මුදල රජයේ වෙනත් සංවර්ධන කාර්යයක් සඳහා උපයෝජනය කිරීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඉදිරියේදී රජයට ඇතිවිය හැකි මූල්‍ය අලාභය අවම කරගැනීමට කටයුතු කිරීම සහ ව්‍යාපෘතිය වෙනුවෙන් හෙක්ටයාර් 21 ක පමණ ඉඩම් අතපත් කර ගෙන තිබුණද එම ඉඩම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වන විටද ගෙන නොතිබුණු බැවින් එම ඉඩම්ද නිෂ්කාර්යයව පැවතුණි.

පාරිසරික,තාක්ෂණික,ආර්ථික හා මූල්‍යමය වශයෙන් ඵලදායී ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගෙන තිබුණු මෙම ව්‍යාපෘතිය විධිමත් හා තාර්කික විශ්ලේෂණයකින් තොරව ඒකපාර්ශවීයව අවසන් කිරීම නිසා ශ්‍රී ලංකාවට සිදුවූ ආර්ථිකමය හා මූල්‍යමය නොවන අවාසිදායක තත්වයන් සම්බන්ධයෙන් වගකිවයුත්තන්ගෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා රජයට සිදුවූ අලාභය අවමකර ගැනීමට අවශ්‍ය කිසිදු පියවරක් විගණිත දිනය දක්වාම ගෙන නොතිබුණි.

(ඇ) හම්බන්තොට දිස්ත්‍රික්කය, නැගෙනහිර පළාත, බස්නාහිර පළාත හා කොළඹ නගරය වශයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2023 දෙසැම්බර් 14 දින ඇ.ඩොලර් මිලියන 0.41 කට සමාන

රු.137,100,000ක මුදලක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. 2025 වාර්ෂික ඇස්තමේන්තුව මඟින්ද රු.215,000,000 ක් වෙන්කර තිබුණු අතර එයින් රු.30,971,488 ක් වැය කර තිබුණි. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.168,071,488ක් වැයකර තිබුණි. නමුත් මෙම කාර්යය පවරන ලද කොන්ත්‍රාත් ආයතනය විසින් එම කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොකරන බව ව්‍යාපෘතියේ තාක්ෂණික උපදේශන ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇති බැවින් අදාල සැළැස්ම ඉදිරියට ක්‍රියාත්මක වී නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මෙතෙක් වැය කර තිබුණු රු.168,071,488 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. තවද මෙම කාර්යය පවරන ලද කොන්ත්‍රාත් ආයතනය විසින් 2018 වර්ෂයදීද බස්නාහිර පළාත හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙනුවෙන් සකසන ලද සැලසුම්, භාවිතයට ගත නොහැකිවී තිබුණු පසුබිමක නැවතත් ප්‍රධාන සැලසුම් සකස් කිරීමට එම ආයතනයම තෝරා ගැනීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් විය. තවද මෙම ආයතනයට පවරණ ලද කාර්යයභාරය ගිවිසුම්ගත පරිදි අදාල කාල සීමාව තුල සිදු නොකිරීම සම්බන්ධයෙන් අදාල ආයතනයට විරුද්ධව කටයුතු කර නොතිබුණි. එමෙන්ම හම්බන්තොට මහනගර සැළැස්ම සැකසීම වෙනුවෙන් මෙම ආයතනයට ගෙවන ලද වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් මුදලින් රු. 58,011,750ක් අයවිය යුතුව තිබුණි.

4.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) උතුරු සහ නැගෙනහිර පළාත්වල වලදමා ඇති බිම් වෙඩි සහ පුපුරා නොගිය අවි කොටස් ඉවත් කිරීමේ බිම් වෙඩි සඳහා ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය (NMAC) සඳහා 2009 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. මිලියන 39,117.84ක මුදලක්ද 2025 වර්ෂය සඳහා ඇ. ඩො. මිලියන 15.5කට සමාන රු.මිලියන 4,762.7ක මුදලක්ද ලෙස එකතුව රු. මිලියනක 43,880.54ක් බිම් බෝම්බ ඉවත් කිරීමේ නිරත දේශීය රාජ්‍ය නොවන සංවිධාන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන වෙත විදේශ දායක රටවල් විසින් ලබා දී තිබුණි. රජයේ දායකත්වය 2010 වර්ෂයේ සිට 2024 දක්වා රු. මිලියන 4.168.1ක්ද 2025 වර්ෂය සඳහා රු. මිලියන 70ක්ද වශයෙන් එකතුව රු. මිලියන 4,238.10ක් 2025 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණි. බිම්බෝම්බ ඉවත්කිරීමේ තත්ත්ව වාර්තා අනුව මූලිකව හඳුනාගන්නා ලද අනතුරුදායක ප්‍රදේශය වර්ග මීටර 1,327,607,653ක් වූ අතර 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් බිම් වෙඩි සහ පුපුරා නොගිය අවි කොටස් ඉවත් කිරීමට ඇති ප්‍රදේශය වර්ග මීටර 21,508,361ක් විය. ඒ අනුව 2020 වර්ෂය වන විට ශ්‍රී ලංකාව බිම්බෝම්බ තර්ජනයෙන් මිදුන රටක් බවට පත්කිරීමේ මූලික අරමුණ ඇතිව ආරම්භ

කරන ලද මෙම වැඩසටහන, 2025දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 5 ක් ගතව තිබුණද වැඩසටහනෙහි අරමුණු ඉටුකර ගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් සාමාන්‍ය ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව රාජ්‍ය ආයතනවලට සෘජු කොන්ත්‍රාත් පදනමින් ලබා දී තිබුණු ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගිවිසුම්ගත කාලරාමුව තුල නිම කිරීමට නොහැකි වීම නිසා නියමිත කාලයේදී එම ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එම කොන්ත්‍රාත්තුවල මූලික ඇස්තමේන්තු හා ප්‍රමාණපත්‍ර (BOQ) පිලිබඳ විස්තර, ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ව්‍යාපෘතිය ආරම්භයේදී හා කොන්ත්‍රාත් වැඩ අවසන් කල පසු යන අවස්ථා දෙකේදී ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු නමුත් එම ඉදිකිරීම් ව්‍යාපෘතිවල මූලික ඇස්තමේන්තු හා ප්‍රමාණපත්‍ර (BOQ) පිලිබඳ විස්තර, ආරම්භයේදී තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් නොකර අවසාන බිල්පත් පමණක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර එම බිල්පත් සඳහා අනුමැතිය ලැබීමේදී වසර 1 සිට 7 ක පමණ කාල පරාසයක ප්‍රමාදයන් සිදුව තිබුණි. එබැවින් එම ව්‍යාපෘති ගිවිසුම්ගත කාලරාමුව තුල නිම කිරීමට නොහැකි වීම නිසා ඉලක්කගත කාලයේදී ව්‍යාපෘතිවලින් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන්, කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාතුවේ කලවැඩ වටිනාකමින් සියයට 90ක් දක්වා කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබුණු නමුත් බොහෝ අවස්ථාවලදී එලෙස කොන්ත්‍රාත්කරුට ගෙවූ මුදල ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන මුදලට වඩා වැඩි අගයක් වීම හේතුවෙන් අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත වැඩිපුර මුදල් ගෙවා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් වාර්ෂික අයවැය මඟින් වෙන්කරන මුදල් වසර ගණනාවක් තිස්සේ වෙනත් ලාභ උපයන ආයතන වෙත රඳවා තබා ගැනීමට අවස්ථාව සැළසීම නිසා අමාත්‍යාංශයේ අනෙකුත් සංවර්ධන කටයුතු මන්දගාමී වී තිබුණි.

(ඇ) නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ප්‍රදේශවල, ජලය ආශ්‍රිතව වැළඳෙන රෝග නිවාරණය පිළිබඳ වැඩසටහන සඳහා 2025 වර්ෂයට අදාළව සකස් කරන ලද සැළැස්මෙහි ඇතුලත් ඇස්තමේන්තුගත පිරිවැය රු.174,730,000 ක් වූ උප ක්‍රියාකාරකම් 07 කට අදාළ කාර්යයන් 2025 දෙසැම්බර් 31 වන විටත් නිමකර නොතිබුණි. එදින වන විට එම ක්‍රියාකාරකම් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විවිධ අදියරයන් යටතේ පැවතුණි.

(ඈ) ග්‍රාමීය සහ ප්‍රාදේශීය පානීය ජල සැපයුම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ග්‍රාමීය ජල සැපයුම් හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම මඟින්

නළ ළිං 10 ක් ඉදිකිරීම සඳහා රු. 10,000,000 ක් 2025 වර්ෂයේ වෙන්කර තිබුණද, 2025 දෙසැම්බර් 31 දිනට රු.4,800,000 ක් වැයකර නළ ළිං 03 ක් පමණක් ඉදිකර තිබුණි. එමෙන්ම මේ යටතේ සැළසුම්කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.64,980,000 ක් වූ ජල නල සැපයීම, රළු වැලි පෙරහන බෙදාහැරීම, මලාපවහන පද්ධතිය දීර්ඝ කිරීම, අඩු ආදායම්ලාභී ප්‍රජාවන් සඳහා වැසිකිළි 50 ක් ඉදිකිරීම සහ ජලනල සැපයීම යන ක්‍රියාකාරකම් 06 හි ප්‍රගතිය සියයට 40 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඉ) යාපනය නගර සභා ගොඩනැගිල්ල නැවත ගොඩනැගීම සඳහා රු.මිලියන 2,142.48 ක කොන්ත්‍රාත් වටිනාකමකට පුද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. මෙම ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 10 දින ආරම්භ කර 2021 ඔක්තෝබර් 09 දින නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් නියමිත කාලසීමාව තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. එබැවින් 2022 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් නිමකිරීමේ වගකීමත් සමඟම සමස්ථ ගොඩනැගිල්ල යාපනය නගර සභාවට පැවරීමට තීරණය කර තිබුණ ද යාපනය නගර සභාව විසින් එම තීරණය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඉතිරි කටයුතුද අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේම සිදු කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු 2025 මැයි 31 දින වන විට අවසන් කිරීම සඳහා රු.මි. 2,568.47 ක සංශෝධිත ඇස්තමේන්තුවක් සකසා ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව 2025 වර්ෂය වෙනුවෙන් රු. මි. 400ක් වෙන්කර තිබුණු අතර රු. මි. 369.84 ක් වැයකර තිබුණි. නමුත් ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් 31 දින වන විටද සියයට 81 ක භෞතික ප්‍රගතියක් හා රු.මි. 553.26 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබුණි.

කෙසේවුවද ව්‍යාපෘතිය ආරම්භකර වසර 7 කට ආසන්න කාලයක් ගතවී ඇතත් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2009 වර්ෂයේ යුද්ධය අවසන් වීමෙන් පසු උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන් වූ පවුල් සඳහා නිවාස/ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර එතැන් පටන් 2024 දෙසැම්බර් 31 දින දක්වා උතුරු නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 08 ක නිවාස 36736 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 29,813 ක මුදලක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මේ සඳහා රු.මි. 2,468 ක් දරා තිබුණු අතර 2025 දෙසැම්බර් 31 දින වන විට සමස්ථ වියදම රු.මි.32,281 ක් විය. නමුත් යුද්ධය නිම වී වසර 16 ක් ගත වී තිබුණ ද, යුද්ධයෙන් අවතැන්වූවන් තවදුරටත් හඳුනාගනිමින් පවතින අතර නැවත පදිංචි කිරීමේ කටයුතු ද නිම වී නොතිබුණි.

4.2. විදේශ ආධාර ව්‍යාපෘති

(අ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය

අඩු ආදායම් ලබන ප්‍රජාවගේ නිවාස තත්ත්වය වැඩිදියුණු කිරීම සහ දැරිය හැකි නිවාස ඉදිකිරීම හා ඉඩම් නැවත සංවර්ධනය කිරීම සඳහා වන ආයෝජන තුලින් කොළඹ ඉඩම් පරිහරණ කාර්යක්ෂමතාව ඉහල නැංවීමත්, ඒ හා සම්බන්ධ පද්ධති හා ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීමේත් අරමුණින් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු (AIIB) විදේශීය ණය ආධාර යටතේ 2019 ජූලි 22 දින කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. යෝජිත ව්‍යාපෘතිය නිවාස ඉදිකිරීම්, ඉඩම් ප්‍රතිසංවර්ධනය, තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය යන ප්‍රධාන ව්‍යාපෘති සංරචක තුනක් හරහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව සංරචක 1 යටතේ නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති 09 ක් යටතේ නිවාස ඒකක 5346 ක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණි. මෙම ව්‍යාපෘතිය විසින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව අනුව ව්‍යාපෘතියේ කාර්යසාධනය පහත පරිදි වේ.

(i) **ස්ටෙඩියම්ගම නිවාස 1000 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.**

2020 මැයි මස 04 දින ආරම්භ කර 2023 ඔක්තෝබර් 15 දින වැඩ අවසන් කිරීමට සැලසුම් කළ මෙම නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය රු.මි. 5,950.95 ක ඇස්තමේන්තුගත වටිනාකමකට පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත පවරා තිබුණද එදිනට වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. පසුව අවිනිශ්චිතතාවයන් (Contingency) වෙනුවෙන් සියයට 49.16ක් දක්වා අමතර මුදලකින් කොන්ත්‍රාත් වටිනාකම වැඩිකර 2025 පෙබරවාරි 28 දක්වා දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රවේශ මාර්ග සංවර්ධන කටයුතු වෙනම ප්‍රසම්පාදන කටයුත්තක් ලෙස සිදු කිරීමට 2024 දෙසැම්බර් 24 දිනැති කැබිනට් මණ්ඩල තීරණය අනුමැතිය ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. එමෙන්ම රු.මි. 374 ක වැඩ වටිනාකමක් මත පවරන ලද ගුරුත්ව මළාපවහන නල මාර්ගය ඉදිකිරීමේ කටයුතු 2025 පෙබරවාරි 28 දින ආරම්භකර 2025 දෙසැම්බර් 28 දින නිමකල යුතුව පැවතුණද 2025 දෙසැම්බර් 31 දින වන විටත් රු.23,441,500ක මූල්‍ය ප්‍රගතියක් සහ සියයට 68 ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. තවද 2024 ජනවාරි 23 දින ලංකා විදුලිබල මණ්ඩලයට සම්පූර්ණ ගෙවීම් සිදුකර තිබුණද A, B, C හා D යන ගොඩනැගිලි ඒකකයන්හි විදුලි මීටර් සවිකර නොතිබුණි. මෙම නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ගුරුත්ව මළාපවහන නල මාර්ගයේ ඉදිකිරීම, විදුලි සැපයුම හා ජල සැපයුම ලබාදීම සම්බන්ධයෙන් වූ ප්‍රමාදය හේතුවෙන් එම

කටයුතු නිම වන තෙක් ඉදිකිරීම් පරිශ්‍රයේ ආරක්ෂක සහ නඩත්තු වියදම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මාස 11ක කාලයක් සඳහා රු.45,265,000 ක පිරිවැය යෝජනාවක් ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් රු.19,351,087 ක අතිරේක මුදලක් ආරක්ෂක සහ නඩත්තු වියදම් වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට දැරීමට සිදුවී තිබුණි. ඉහත හේතූන් නිසා එම නිවාස ඒකක 1000 පදිංචිකරුවන් වෙත ලබාදීමට නොහැකි වීම හේතුවෙන් නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට ප්‍රමාද වී තිබුණි.

(ii) **කොළඹගේ මාවත නිවාස ඒකක 624 ක් ඉදිකිරීම් ව්‍යාපෘතිය.**

2020 ජුනි 01 දින ආරම්භ කර 2023 මැයි 16 වැඩ අවසන් කිරීමට යෝජිතව පැවති මෙම නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මි. 3,126.56 ක ඇස්තමේන්තුගත වටිනාකමකට පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත පවරා තිබුණද එදිනට වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. එබැවින් කොන්ත්‍රාත් මුදලින් සියයට 15 ක් වූ අවිනිශ්චිතතාවයන් (Contingency) සියයට 93.61 ක් දක්වා වැඩිකර දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. උක්ත ව්‍යාපෘතියේ මළාපවහනය කොළඹ මහනගර සභා මළාපවහන පද්ධතියට යා කිරීමට මූලිකව යෝජනා වී තිබුණ ද වර්තමානයේ එම පද්ධතියේ පවතින ගැටලු හේතුවෙන් මලාපවහන පොම්පාගාරයක් ස්ථාපනය කිරීමට කොළඹ මහනගර සභාව යෝජනා කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුමේ පළමු සංශෝධනය මගින් විවලතා නියෝග අංක 2 යටතේ රු.මි. 287ක වැඩ වටිනාකමක් මත පවරන ලද මලාපවහන පොම්පාගාරය හා නල සම්බන්ධතාවය ඉදිකිරීමේ කටයුතු සඳහා 2026 පෙබරවාරි 26 දින දක්වා කාලය දීර්ඝ කිරීම් ලබාදී තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විට රු.මි. 170 ක මූල්‍ය ප්‍රගතියක් සහ සියයට 94ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ ප්‍රවේශ මාර්ග සංවර්ධන කටයුතු වෙනම ප්‍රසම්පාදන කටයුත්තක් ලෙස සිදු කිරීමට 2024 දෙසැම්බර් 24 දිනැති අංක අමප/24/2255/814/014 දරන කැබිනට් තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙම නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මලාපවහන පොම්පාගාරය ඉදිකිරීමේ ප්‍රමාදය හේතුවෙන් එම කටයුතු නිම වන තෙක් ඉදිකිරීම් පරිශ්‍රයේ ආරක්ෂක සහ නඩත්තු වියදම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මාස 5ක කාලයක් සඳහා රු.මි. 19 ක පිරිවැය යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් රු.මි. 10 ක අතිරේක මුදලක් ආරක්ෂක සහ නඩත්තු වියදම් වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට දැරීමට සිදුවී තිබුණි. ඉහත ප්‍රමාද දෝෂ හේතුවෙන් නිවාසලාභීන් වෙත එම නිවාස ඒකක 624 ලබාදීමට නොහැකිවී තිබුණි.

(iii) **ඔබේසේකරපුර නිවාස ඒකක 300 ක් ඉදිකිරීම ව්‍යාපෘතිය.**

කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 මාර්තු 28 වන දින අතරමග වැඩ අවසන් කරන ලද මෙම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ 2025 මැයි මස 14 දින ලංසු කැඳවා තිබුණි. තාක්ෂණික ඇගයීම් වාර්තාවේ සංශෝධනය සම්බන්ධව හා ලංසුකරුවන්ගේ පැමිණිලි සලකා බැලීම සඳහා Standard High Level Procurement Committee වෙත එම තොරතුරු ඉදිරිපත්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද සැලසුම්කල පරිදි සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා පත්කර නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි. එමෙන්ම ඔබේසේකරපුර නිවාස ව්‍යාපෘතියට අදාලව රු. 17,384,970 ක් වටිනා කි.ග්‍රෑම් 98,091.14 ක යකඩ ප්‍රමාණයක් (reinforcement steel) සෙත්සිරිපාය පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් වසර හතරක කාලයක සිට නිශ්කාර්යව පවතී.

(iv) **ඇපල්වත්ත නිවාස ඒකක 700 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.**

2020 ඔක්තෝබර් 27 දින ඉදිකිරීම් වැඩ ආරම්භ කර 2023 ඔක්තෝබර් 17 දින වැඩ නිම කිරීම සඳහා රු.මි. 3,890 ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත විදේශීය ආයතනයකට භාර දී තිබූ අතර මෙම නිවාස ව්‍යාපෘතිය මඟින් නිවාස ඒකක 700 ක් ඉදිකිරීමට යෝජිතව පැවතුණි. උක්ත ව්‍යාපෘතිය සඳහා 2025 අගෝස්තු 27 දින දක්වා දින දීර්ඝ කිරීම් 10 ක් මගින් දින 656ක කාලයක් ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියේ සමස්ත ඉදිකිරීමේ කටයුතුවලින් සියයට 70.79 ක් නිමකිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් 2025 දෙසැම්බර් 31 දින වන විට සියයට 56.24 ක භෞතික කාර්යසාධනයක් පමණක් ළඟාකර ගෙන තිබුණි. 2025 දෙසැම්බර් 31 දින වන විටද ඉතා පහළ කාර්යසාධනයක් ළඟාකර ගෙන තිබූ උක්ත ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි සංශෝධනය කර රු.389,000,000 ක අතිරේක අත්තිකාරම් මුදලක් ලබා දී කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හැකියාව ශක්තිමත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අතිරේක අත්තිකාරම් මුදලින් රු.295,722,370.27ක් එනම් සියයට 76ක ප්‍රමාණයක්ම අයකරගත යුතුව පැවතුණි. කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුමේ උප වගන්තියක් අනුව 2025 ජුනි මස 3 දින වන විට සම්පූර්ණ කලයුතු ක්‍රියාකාරකම් 10 අතුරින් 9ක් ම සාක්ෂාත් කිරීමට නොහැකිවී තිබුණි. ව්‍යාපෘතිය සඳහා යොදාගත යුතු සාමාන්‍ය ශ්‍රම සංඛ්‍යාව 453 ක් වුවද 160 ක තරම් ප්‍රමාණවත් නොවූ ශ්‍රම ශක්තියක් පවත්වා ගැනීමද ඉහත ප්‍රමාදයට

බලපා තිබුණි. අනුකරණ නිවසේ (mockup house) කටයුතු අවසන් කර නොකිරීම, A,B හා C ගොඩනැගිලි කොටස් සම්බන්ධ වන යෝජිත පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැතිවීම සහ තාවකාලික ආරක්ෂක වැට සවි කිරීමේ කටයුතු තවමත් අවසන් කර නොතිබීම හේතුවෙන් මෙම නිවාස ව්‍යාපෘතිය පදිංචි කරුවන්ට ලබා දීමට නොහැකි වීම හේතුවෙන් මෙමගින් ලබාදීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබාදීමට නොහැකි වී තිබුණි.

(v) **පර්ගියුසන් මාවත නිවාස ඒකක 750 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.**

මෙම ව්‍යාපෘතිය 2021 ජනවාරි 20 දින ආරම්භ කර 2024 ජනවාරි 04 වැඩ නිමකිරීම සඳහා විදේශීය ඉදිකිරීම් සමාගමක් වෙත රු.මි. 3,923 ක ඇස්තමේන්තුගත වටිනාකමකට පවරා තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විටද සියයට 20.81 ක භෞතික කාර්යසාධනයක් පමණක් ළඟාකර ගෙන තිබුණි. ඉතාමත් අඩු කාර්යසාධන මට්ටමක් ළඟාකර ගෙන ඇති කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ශක්තිය නගා සිටුවීම සඳහා 2024 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වෙනස්කර රු. 392,255,433 ක අතිරේක අත්තිකාරම් මුදලක් නැවත ලබා දීමට කටයුතු කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලද අපේක්ෂිත කාර්යයසාධනය ලභාකරගෙන නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අතිරේක අත්තිකාරම් මුදලින් රු.366,111,227ක් එනම් සියයට 93ක ප්‍රමාණයක්ම අයකරගත යුතුව පැවතුණි. තවද නිවාස ව්‍යාපෘතියේ සෞඛ්‍ය, ආරක්ෂාව හා පාරිසරික රෙගුලාසි අඛණ්ඩව උල්ලංඝනය වන බව ව්‍යාපෘතියේ ඉංජිනේරු නියෝජිත වන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් අනාවරණය කර තිබුණි.

(vi) **මාදම්පිටිය නිවාස ඒකක 700 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.**

මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය 2021 මැයි 20 දින ආරම්භ කර 2024 මැයි 03 දින වැඩ නිම කිරීමට සඳහා දේශීය පුද්ගලික සමාගමක් වෙත රු. මි. 3,937 ක ඇස්තමේන්තුගත වටිනාකමකට පවරා දී තිබුණද එදිනට වැඩ අවසන් නොවීම මත 2026 මාර්තු 07 දින දක්වා දින දීර්ඝකිරීම් ලබාදී තිබුණි. ව්‍යාපෘතියේ යෝජිත ගුරුත්ව මළාපවහන නල මාර්ගයේ වැඩිදියුණු කිරීමේ කටයුතු රු.684,989,330 ක මුදලකට තවත් පුද්ගලික සමාගමක් වෙත 2024 සැප්තැම්බර් 24 දින ප්‍රදානය කර තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විට සියයට 10 මූල්‍ය ප්‍රගතියක් සහ සියයට 30 ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. කොන්ත්‍රාත්කරුට වැඩබිම භාරදීමේදී සිදුවූ ප්‍රමාදය හේතුවෙන් දින 100ක කාලදීර්ඝ කිරීමක් (EOT) ලබාදී තිබුණු අතර එම ප්‍රමාදය

හේතුවෙන් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව රු.42,827,688 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවී තිබුණි. කෙසේ වුවද 2025 දෙසැම්බර් 31 දින වන විට රු.මි.4,196.54 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු අවසන් නොවීම නිසා මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීම ප්‍රමාද වී තිබුණි.

4.3 විදේශීය ව්‍යාපෘති ඇවරකිරීම

නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ(UPPF) ණය ගිවිසුමට අනුව, ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ. ඩො. මි. 5.27 කට සමාන රු. මි. 1064.79 ක්ද ශ්‍රී ලංකා රජය විසින් ඇ.ඩො. මි. 1.15 කට සමාන රු. මි. 232.35 ක්ද යෙදවීමටද ගිවිසුම්ගත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2019 මාර්තු 06 වන දින ආරම්භ කර 2021 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් අපේක්ෂිත කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් එකඟ වූ ණය මුදලින් ඇ.ඩො. මි. 1.33 කට සමාන රු. මි. 434.59 ක් වියදම් කර මෙම ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින නිම කර තිබුණි. නමුත් 2025 දෙසැම්බර් 31 දින වන විටද ව්‍යාපෘති ඇවරකිරීමේ ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

4.4 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 33,237.76 ක් වූ කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 29 දින ආරම්භ කර 2019 ජූනි 30 වන විට අවසන් කිරීමට ද පැකේජ 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට ද සැලසුම් කර තිබුණි. එම ව්‍යාපෘතියේ කසළ භූවමාරු මධ්‍යස්ථානය (A), සනීපාරක්ෂක බිම් පිරවුම (B) සහ දුම්රිය මාර්ග දීර්ඝ කිරීම(C) යන පැකේජ 03 හි ඉදිකිරීම් කටයුතු රු.මි.25,377.95 (ඇ.ඩො. මි. 100.96) ක වටිනාකමට චීන සමාගමක් වෙත පවරා තිබුණු අතර අවශ්‍ය කරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ පැකේජය(D) සඳහා රු.මි.2,963.61 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2025 දෙසැම්බර් 31 වන විට රු.මි.21,563.14 ක් වැය කර තිබුණු ව්‍යාපෘතියේ A B සහ C පැකේජ 03 හි කටයුතු පැවරුණු චීන සමාගමේ ප්‍රමාදය නිසා වරින් වර දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණු අතර 2025 නොවැම්බර් 30 දින වන විට එහි වැඩ අවසන් කළ යුතුව තිබුණු මෙම ඉදිකිරීම් කටයුතු 2025 දෙසැම්බර් 31 වන විට ද අවසන් කර නොතිබුණි. දුම්රිය එන්ජින් කට්ටල 04 ක් රු.මි. 8.27ක් වැයකර 2019 දෙසැම්බර් 31 වන විට ආනයනය කර දුම්රිය දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා ලබා දී තිබුණු අතර බහාලුම් පෙට්ටි 94 ක් ඇ.ඩො. මි. 0.8 ක් වැයකර 2022 අප්‍රේල් 22 දින ආනයනය කර ගබඩා කර තිබුණි. නමුත් විගණිත දිනය වන විට එම බහාලුම් පෙට්ටි ව්‍යාපෘතියේ අරමුණු සඳහා යෙදවීමට නොහැකි තත්වයක පැවතුණි.

2025 දෙසැම්බර් 31 වන විට අමාත්‍යාංශය විසින් මෙම සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි. 26,029.06 ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘතිය ආරම්භ කර වසර 09ක් පමණ ගතවී තිබුණද ඉදිකිරීම් කටයුතු අවසන් වී නොමැති බැවින් ව්‍යාපෘතිය සක්‍රිය කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

4.5 ප්‍රසම්පාදනයන්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානයේ 2025/2026 කාලයට අදාල පිරිසිදු කිරීමේ සේවා කොන්ත්‍රාත්තුව තෝරාගැනීම සඳහා 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 3.1.2 ප්‍රකාරව ජාතික තරහකාරී ලංසු කැඳවීමක් සිදු නොකර 2025 අප්‍රේල් 25 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමවේදය අනුගමනය කර මිල කැඳවීම් සිදුකර 2025 අගෝස්තු මස සිට සිදුකිරීමට සේවාව පිරිනමා තිබුණි. එසේ වුවද 2025 මාර්තු සිට අගෝස්තු දක්වා මාස 05 ක කාලය සඳහා පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව රු.1,075,259 ක් ගෙවා තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ 2025 වාර්ෂික ප්‍රම්පාදන සැළැස්ම අනුව පරිගණක උපාංග මිළදී ගැනීම සඳහා රු.100,000 ක් පමණක් වෙන්කර තිබුණු අතර 2025 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් කාර්යාල උපකරණ මිළදී ගැණුම් වැය විෂයය සඳහා රු. 1,500,000 ක් පමණක් වෙන්කර තිබුණි. නමුත් සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.6 ඡේදයේ සඳහන් සුවිශේෂී තත්ත්වයන් යටතේ පමණක් භාවිත කළ යුතු සෘජු කොන්ත්‍රාත් පදනම මත ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථාවෙන් අයිෆයිව් (i5) ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 37 ක් මිළදී ගැනීම සඳහා සඳහා රු. 9,801,670 ක් වැය කර තිබුණි. තවද 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.6(ආ) ඡේදය ප්‍රකාරව ප්‍රතිග්‍රහන ලිපිය නිකුත් කිරීමට පෙර,කොන්ත්‍රාත්තුවේ පිරිවැය සපුරාලීම සඳහා අයවැය ප්‍රතිපාදන පවතින බව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තහවුරු කර ගත යුතු වුවද, එම වැය විෂයයයේ ප්‍රතිපාදන පවතින බව තහවුරු කර ගැනීමෙන් තොරව අමාත්‍යාංශය විසින් මෙම පරිගණක මිළදී ගැනීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

4.6 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2023 ඔක්තෝබර් 22 දින යාපනය ප්‍රදේශයේදී රු.55,000,000 ක් වටිනා V8 වර්ගයේ නිලරථය අනතුරට ලක්වී තිබුණි. මු.රෙ.104 පරීක්ෂණ වාර්තා අනුව වාහන දෙකෙහිම රියදුරන්ගේ අපරික්ෂාකාරී රිය ධාවනය මෙම අනතුරට හේතුව බව හා රක්ෂණ

ආයතනයෙන් ආවරණය නොවන ඉතිරි අලුත්වැඩියා වියදම වාහනයේ රියදුරාගෙන් අයකිරීමට පරීක්ෂණ කමිටුව විසින් නිර්දේශ ලබාදී තිබුණද මෙම වාහනයේ රියදුරු සම්බන්ධයෙන් මු.රෙ.105(4)ප්‍රකාරව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට සහ රු.6,512,307 ක අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. රු.17,935,458 ක අලුත්වැඩියා වියදම නියෝජිත ආයතනය වෙත ගෙවීමට ප්‍රමාදවීම හේතුවෙන් වාහනය අමාත්‍යාංශය වෙත නිදහස් නොකර රඳවාගෙන සිටි බැවින් මෙම වාහනය වසර 02 මාස 06 ක පමණ කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2024 දෙසැම්බර් 18 දින නිකුත් කරන ලද අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද සුඛෝපභෝගී වාහන අපහරණය සඳහා හඳුනාගැනීමේ මණ්ඩලය විසින් අමාත්‍යාංශයට අයත් සුඛෝපභෝගී වාහන 39 ක් ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන/ආයතනයේ භාවිතය සඳහා අවශ්‍ය නොවන සුඛෝපභෝගී වාහන ලෙස හඳුනාගෙන තිබුණු නමුත් එම වාහනවලින් 23ක් එනම් සියයට 59 ක්ම විශාල වියදමක් දරමින් අමාත්‍යාංශය විසින් තවදුරටත් පරිහරණය කිරීම නිසා එම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

අමාත්‍යාංශය විසින් තීරුබදු රහිතව හෝ වෙනත් විශේෂ කොන්දේසි යටතේ ආනයනය කරන ලද වාහන 13 ක කොන්දේසි නිසි පරිදි අවලංගු කරගැනීමෙන් තොරව අපහරණ ක්‍රියාවලියට යොමු කර තිබුණු අතර වාහන අපහරණ දැන්වීම් පලකරන අවස්ථාවේදී එම බදු මුදල් වාහන ගැනුම්කරුවන්ගෙන් අයකිරීමට සිදුවන බව සඳහන් නොකිරීම නිසා අදාල බදු මුදල් වාහන ගැනුම්කරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකිවීම මත රේගු බදු රු.4,363,873 ක් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙතද සුඛෝපභෝගී බදු හා දඩ මුදල් රු.1,150,000 ක් මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙතද ගෙවීමට අමාත්‍යාංශයට සිදුව තිබුණු බැවින් අමාතශ්‍යාංශයට රු.5,513,873ක පාඩුවක් සිදුව තිබුණි.

4.7 පාඩු හා හානි

2024 ජනවාරි 23 දින කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේදී අමාත්‍යාංශයට අයත් වාහනයක් තවත් වාහනයක ගැටී සිදුවූ අනතුරින් එහි ගමන්ගත් නියෝජ්‍ය අමාත්‍යවරයා සහ ආරක්ෂක නිළධාරියෙකු ජීවිතක්ෂයට පත්වී තිබුණු අතර වාහනය පූර්ණහානි වී තිබුණි. එහෙත් විගණිත දිනය දක්වාම වාහනයට සිදුවූ අලාභය රාක්ෂණ ආයතනයෙන් ආවරණය කර නොතිබුණි. තවද 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.5 ඡේදය ප්‍රකාරව මෙම ජීප් රථයට අනතුර සිදු වී 2026

මාර්තු 31 දින වන විට වසර 2 කට වැඩි කාලයක් ගත වී තිබුණද මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණ සිදුකර අනතුරට වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි.

4.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2025 වර්ෂය තුළ නිකුත් කරන ලද එක් විගණන විමසුමකට පිළිතුරු ලබා දී නොතිබුණි. තවද 2025/2026 වර්ෂ තුල නිකුත් කරන ලද විගණන විමසුම් 11කට පිළිතුරු ලබා දීමේදී මාස 02 සිට මාස 05 දක්වා අතර කාල පරාසයක ප්‍රමාදයන් සිදුව තිබුණි.

4.9 කළමනාකරණ දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයේ නිලධාරීන් 28 දෙනෙකු 2025 වර්ෂය තුල විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ 19 ක් සඳහා සහභාගී වී තිබුණු අතර ඔවුන්ට අනියම් වියදම් සහ උණුසුම් ඇඳුම් දීමනා ලබාදීම සඳහා අමාත්‍යාංශය විසින් රු. 2,812,168 ක් වැයකර තිබුණි. එම නිළධාරීන් 28 දෙනාගෙන් 8 දෙනෙකු විසින් සංචාරය නිමකර මසක් ඇතුලත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තාව මාස 4-8 ක කාල ප්‍රමාදයකින් යුතුව ඉදිරිපත් කර තිබුණි. තවද විදේශීය පුහුණු වැඩසටහන අවසන් වූ පසු, ඒ සඳහා සහභාගී වූ නිළධාරීන් විසින් ලබා ගන්නා ලද පුහුණුව තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් තීරණය කර අදාල ආයතන ප්‍රධානියා විසින් එම නිළධාරීන්ගේ පුහුණුව තක්සේරු කළ යුතු බවත්, ලබාගත් දැනුම සහ කුසලතා අනෙකුත් කාර්ය මණ්ඩලය සමඟ බෙදා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බවත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී තිබුණු නමුත් අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2021-2025 කාලය තුළ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කොන්ත්‍රාත් 74 ක් සඳහා අමාත්‍යාංශය මඟින් කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.2,757,593,572 ක මුදලින් 2025 දෙසැම්බර් 31 වන විට නිරවුල් නොවූ මුදල රු.1,583,101,091 ක් විය. තවද මෙම කොන්ත්‍රාත්වලින් කොන්ත්‍රාත් 05 ක් වෙනුවෙන් ගෙවූ රු.32,902,577 කින් කිසිදු කොන්ත්‍රාත් කාර්යයක් සිදු නොකළ බවට 2026 මැයි 20 දින වාර්තා කර තිබුණි.

එසේම අත්තිකාරම් ශේෂයන් පිළිබඳව ව්‍යාපෘති නියාමනය හා මෙහෙයවීම භාරව සිටින රේඛීය අමාත්‍යාංශය සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් වාර්තාගත තොරතුරු අතර පරස්පරතාවයක් පැවතිණි. 2025 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත් 07ක් වෙනුවෙන් ලබා දී තිබූ රු.115,697,727 ක අත්තිකාරම් මුදලින් රු.58,687,024 ක් අයවිය යුතු ලෙස

අමාත්‍යාංශය වාර්තා කර තිබුණද එම මුළු මුදලම අයකර ඇති බව ජල සම්පාදන මණ්ඩලයේ වාර්තා කර තිබුණි. එමෙන්ම අමාත්‍යාංශය මගින් කොන්ත්‍රාත් 03 ක් වෙනුවෙන් ලබා දී තිබූ රු. 287,556,913ක අත්තිකාරම් ජාතික ජල සම්පාදන මණ්ඩලයේ වාර්තා වී තිබුණේ රු. 143,778,457ක් වශයෙනි.

(ඈ) 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ජල සම්පාදන අමාත්‍යාංශය හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශය භාරව කටයුතු කරන ලද ජල සම්පාදන අමාත්‍යවරයාට හා රාජ්‍ය අමාත්‍යවරයාට අනුයුක්ත කර තිබූ වාහන 03 ක් 2023 හා 2024 වර්ෂ තුළ අනතුරට ලක්වීම හේතුවෙන් දළ වශයෙන් රජයට රු.63,329,377 ක පාඩුවක් සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 156(i)(ආ) ප්‍රකාරව එම පාඩු පිළිබඳව වගකිවයුත්තන් හඳුනාගෙන අදාළ අධිභාරයන් සිදුකිරීමට සහ වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට 2026 මැයි 20 දක්වාම අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඉ) චීන -ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානය පිහිටුවීම

නිදන්ගත වකුගඩු රෝගය ඇතිවීමට බලපාන හේතූන් හඳුනාගැනීම, නිදන්ගත වකුගඩු රෝගය බලපා ඇති ප්‍රදේශවල groundwater treatment ක්‍රම වැඩිදියුණු කිරීම, වියළි කලාපයේ වැසි ජලය එකතු කිරීමේ හා භාවිතා කිරීමේ ක්‍රම වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකා රජයේ ජල සැපයුම් හා සනීපාරක්ෂක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ සහ ඉඩම් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ ඒකාබද්ධ සැලැස්ම සඳහා සහාය ලබා දීම යන මූලික අරමුණු වෙනුවෙන් 2015 මාර්තු 26 දින මෙම මධ්‍යස්ථානය පිහිටුවා තිබුණද එමගින් අපේක්ෂිත පහත සඳහන් කාර්යයන් ඉටු වී නොතිබුණි.

(i) චීන රජයේ ප්‍රතිපාදන යටතේ රු.බිලියනයකට අධික වටිනාකමින් යුත් අධි තාක්ෂණික උපකරණවලින් සමන්විත ප්‍රධාන රසායනාගාර 06 ක් ඇතුළුව මුළු රසායනාගාර 16 කින් සමන්විත මෙම පර්යේෂණ මධ්‍යස්ථානයේ, රසායනාගාර මගින් සිදුකළ හැකි පරීක්ෂණ වර්ග 302 ක් සඳහා රේටයන් හඳුන්වාදී තිබුණද, 2025 වර්ෂයේ සිදුකරන ලද පරීක්ෂණ වර්ග ප්‍රමාණය 18 ක් පමණක් වී තිබුණි.

(ii) 2020 සැප්තැම්බර් මස 16 දින චීන රජය මගින් මෙම මධ්‍යස්ථානය වෙත ප්‍රදානයකර තිබූ ජල පරීක්ෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ උපකරණවලින් සමන්විත රු.40,441,639 ක් වටිනා ජංගම ජල පරීක්ෂණ රථය වර්ෂ 5 කට අධික කාලයක සිට කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන මධ්‍යස්ථානයේ නිශ්කාර්යව ගාල්කර තිබුණි.

(iii) මෙම මධ්‍යස්ථානය සඳහා කාණ්ඩ 06 ක් යටතේ 2025 වර්ෂයට පුරෝකථනය කළ ආදායම රු.63,750,000 ක් වුවත් සත්‍ය ආදායම රු.7,422,010 ක් එනම්

පුරෝකථනය කල ආදායමෙන් සියයට 12 ක් වැනි අවම මට්ටමක පැවති අතර පර්යේෂණ ආදායම සහ පර්යේෂණ සේවා, පශ්චාත් උපාධි වැඩසටහන් යන ආදායම් කාණ්ඩවලින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

"ශ්‍රී ලංකාවේ බිම්බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන සඳහා උපායමාර්ගික දිශානතිය ඉදිරිපත් කරන "ජාතික බිම්බෝම්බ කාර්යය සම්පූර්ණ කිරීමේ උපායමාර්ගය 2023 – 2027", බිම් වෙඩි සඳහා ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය විසින් ජිනීවා ජාත්‍යන්තර මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ මධ්‍යස්ථානයේ (GICHD) සහාය ඇතිව සංවර්ධනය කරන ලද අතර මේ යටතේ 2025 වර්ෂය සඳහා හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන ඉලක්ක 09 කින් අපේක්ෂිත ප්‍රගතිය ලභා කරගෙන නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

ප්‍රාදේශීය කාර්යාලවලට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණු අමාත්‍යාංශයේ ඇතැම් නිලධාරීන් ඔවුන්ගේ සේවයට පැමිණීම හා නිවාඩු පිළිබඳ වාර්තා අමාත්‍යාංශය වෙත ලබාගැනීමකින් තොරව වැටුප් ගෙවා තිබුණි. ඇතැම් නිලධාරීන් ඔවුන් අනුයුක්ත කර ඇති කාර්යාලයේ සාමාන්‍ය කාර්යාල රාජකාරිවල නිරත වීමෙන් අමාත්‍යාංශයේ කාර්යසාධනයට දායක වී නොතිබුණු අතර අමාත්‍යාංශය විසින් ඔවුන් සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයක්ද සිදුකර නොතිබුණි.

ඒ.ඩී. සීතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.